# ගම නැගුම වැඩසටහන

## පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

# බැදිගම්තොට

## හම්බන්තොට දිස්ත්‍රික්කය

එන්.පී.ජී. සමන්ත

2007 ජුනි

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07

711.3
(SL)
හෙක්ට

2009/06 2010/04 250/-

# ස්තුතිය

කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය "ගම නැගුම" වැඩසටහන ක්‍රියාත්මක වන ගම්මානවල පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය පැවැත්වීමේදී ඒ සඳහා මගපෙන්වීම් කළ ආයතනයේ අධ්‍යක්ෂ වී.කේ. නානායක්කාර මහතාට පළමුව ස්තුතිය පළකිරීමට කැමැත්තෙමි.

සමස්ථ සමීක්ෂණය සම්බන්ධීකරනය කරමින් නිරන්තර අවශ්‍ය උපදෙස් ලබාදෙමින් අපව දිරිමත් කළ කෘෂි ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ අංශ ප්‍රධාන ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතාටත් ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්.ජී. ජයසේන මහතාටත් ක්ෂේත්‍ර සමීක්ෂණයේ සියලු කටයුතුවල වගකීම් දරමින් එය සාර්ථකව නිම කිරීමට නිරන්තර කැපකිරීම් කළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී එන්.එන්.ඒ. ද සිල්වා මහතාටත් සමීක්ෂණයේ දත්ත සැකසුම් කළ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේෂක එම්.එල්.ඩී. සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, විවිධාකාරයෙන් සහාය දැක්වූ සංඛ්‍යාන නිලධාරිණී සන්ධ්‍යා සේනානායක මහත්මියටත් මාගේ ස්තුතිය හිමි වේ.

ක්ෂේත්‍ර සමීක්ෂණය හා ද්විතීයික දත්ත ලබාගැනීමේදී ඉතා සුහදව අවශ්‍ය තොරතුරු සපයාදුන් සූරියවැව ප්‍රාදේශීය ලේකම් එච්.ඩී. පියසිරි මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත් බැදිගම්තොට ග්‍රාම නිලධාරී මහත්මිය හා ක්ෂේත්‍ර සමීක්ෂණයේදී විමර්ශකයින් ලෙස කටයුතු කළ බැදිගම්තොට අමරකීර්ති මහතා, ශාලිකා, රන්දිමා, කාංචනා, රසිකා යන මෙනවියන්ටත් තොරතුරු ලබාදුන්, බැදිගම්තොට ගම්වාසීන්ටත් ස්තුති පළ කිරීමට කැමැත්තෙමි. අවසන් වාර්තාව යතුරු ලියනය කළ රාජිකා ශ්‍යාමලී මෙනවියට හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ ස්තුතිය හිමි වේ.

එන්.පී.ජී. සමන්ත.



21447

පුස්තකාලය
LIBRARY
හෙ. කො. ගො. ප. පු. ආ
HARTI

# පටුන

පිටු අංකය


**ස්තුතිය**

**පළමු පරිච්ඡේදය**

1.1 ගම නැගුම වැඩසටහන 01

1.2 ගම නැගුම ආදර්ශන ගම්මාන වැඩසටහන 01

1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය 02

1.4 අධ්‍යයනයෙහි අරමුණු 02

1.5 අධ්‍යයන ක්‍රමවේදය 03

1.6 අධ්‍යයන කාලය 03

**දෙවන පරිච්ඡේදය - බැදිගම්තොට ගම්මානය**

2. මූලික සමාජ ආර්ථික තොරතුරු 04

2.1. පිහිටීම 04

2.2 දේශගුණික තත්ත්වය 04

2.3. ඓතිහාසික තොරතුරු හා ජනාවාසවීම 05

2.4. ජනගහනය 06

2.4.1 වයස් ව්‍යුහය 07

2.5. අධ්‍යාපන තත්ත්වය 08

**තුන්වන පරිච්ඡේදය**

**ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම**

3.1 ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය 14

3.2 ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග 17

3.3 ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය 18

3.4 ආදායම 20

3.5 දුප්පත්කම 24

3.6 ඉතිරි කිරීම් 25

3.7 ණය ගැතිභාවය 28

**හතර වන පරිච්ඡේදය**

**නිවාස තත්ත්වය සහ පහසුකම්**


4.1 නිවාස අයිතිය 30

4.2 නිවාස තත්ත්වය 31

4.3 නිවාස සඳහා ඇති පහසුකම් (සන්නිවේදන හා ප්‍රවාහන) 33

4.4 බලශක්ති භාවිතය 34

4.5 නිවාස සඳහා ජල පහසුකම් 36

4.6 වැසිකිළි පහසුකම් 39

4.7 නිවෙස්වල ඇති ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය 39

4.8 ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය 40

4.9 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර 41

4.10 සෞඛ්‍ය තත්ත්වය 42

4.11 ගමනාගමන හා සේවා යටිතල පහසුකම් 43

4.12 භෞතික සම්පත් 43


**පස්වන පරිච්ඡේදය**

**ඉඩම් අයිතිය භුක්තිය හා සංවර්ධනය කිරීම**


5.1 පවුල් ඒකකයක් බුක්තිවිඳින ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය 45

5.2 පරිහරණය කරන ඉඩම් වල අයිතිය හා භුක්තියෙහි ස්වභාවය 46

5.3 ඉඩම් වල භෞතික ස්වභාවය 47


**හයවෙනි පරිච්ඡේදය**

**කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු**


6.1 බෝග වගාව 50

6.1.1 හැඳින්වීම 50

6.1.2 තාක්ෂණ භාවිතය 51

6.1.2.1 කෘෂි දැනුම හා උපදෙස් ලබා ගැනීම 51

6.1.2.2 බීජ හා කෘෂි රසායන භාවිතය 53

6.1.2.3 පොහොර භාවිතය 54

6.1.2.4 ජල පාලනය 55

6.1.2.5 නිෂ්පාදනය 55

6.1.2.6 නිෂ්පාදන වියදම හා ලාභය 56

6.1.2.7 අලෙවිය 57

6.1.2.8 ප්‍රශ්න, ගැටළු හා විසඳුම් 57

6.2 සත්ව පාලනය 58
6.2.1 හැඳින්වීම 58
6.2.2 තාක්ෂණික භාවිතය 59
6.2.3 නිෂ්පාදනය, මිල හා අලෙවිය 60
6.2.4 ප්‍රශ්න, ගැටළු හා විසඳුම් 61

**හත්වන පරිච්ඡේදය**
**ප්‍රජා සංවිධාන සහ ජනතා සහභාගිත්වය**

7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන 62
7.2 ප්‍රජා සංවිධාන වල ක්‍රියාකාරී බව 63
7.3 අරමුදල් ගොඩනැගීම් හා ණය දීම් 65
7.4 ප්‍රජා සංවිධාන මඟින් ඉටුවන වෙනත් සේවාවන් 68
7.5 ගමෙහි සංවර්ධන කටයුතු සඳහා ප්‍රජා සංවිධාන ජනතා සහභාගිත්වය ලබා ගැනීම 69
7.6 වෙනත් ආයතන ගමෙහි සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීම 69

## සංඛ්‍යා සටහන් නාමාවලිය

**සංඛ්‍යා සටහන** **පිටු අංකය**
2.1 සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය 06
2.2 වයස් ව්‍යුහය අනුව ජනගහන ව්‍යාප්තිය - බැදිගම්තොට 07
2.3 අධ්‍යාපන මට්ටම අනුව ජනගහන ව්‍යාප්තිය - බැදිගම්තොට 09
2.4 පරිගණක භාවිතයේ හැකියාව අනුව පවුල් ව්‍යාප්තිය 10
2.5 ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම අනුව පවුල් ව්‍යාප්තිය 11
2.6 වයස් ව්‍යුහය අනුව සාක්ෂරතා අනුපාතය 12
2.7 වයස් ව්‍යුහය හා අධ්‍යාපන මට්ටම අනුව ජනව්‍යාප්තිය 12
3.1 ශ්‍රම බලකායෙහි සේවා නියුක්තිය/වියුක්තිය 14
3.2 අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්ත පිරිසෙහි ව්‍යාප්තිය 15
3.3 විශේෂ පුහුණුවීම් ලබා ඇති පිරිස ශ්‍රම බලකාය තුළ දක්වන දායකත්වය 16
3.4 ලැබීමට අපේක්ෂිත පුහුණුවීම් 17
3.5 සේවා නියුක්තිය - බැදිගම්තොට 18
3.6 ද්විතීයික රැකියාවන්හි නියුක්තිය - බැදිගම්තොට 19
3.7 සාමාන්‍ය මාසික ආදායම අනුව වැටුප් ලබන රැකියාවල නිරත වන්නන්ගේ ව්‍යාප්තිය 21
3.8 දළ මාසික සාමාන්‍ය ආදායම අනුව පවුල් ව්‍යාප්තිය 23
3.9 දළ වාර්ෂික ආදායමට විවිධ ආදායම් උත්පාදක මාර්ගවලින් දක්වන දායකත්වය 24
3.10 කුටුම්භ සතු තැන්පතු ගිණුම් සංඛ්‍යාව අනුව ව්‍යාප්තිය 26
3.11 විවිධ ඉතිරි කිරීම් ගිණුම් මූල්‍ය ආයතන අනුව ව්‍යාප්තිය 27

3.12 ලබාගත් මූලාශ්‍ර අනුව ණය සංඛ්‍යාවෙහි ව්‍යාප්තිය 28
3.13 ණය ලබාගත් හේතුව අනුව ණය මුදල් ව්‍යාප්තිය 29
4.1 අයිතියේ ස්වරූපය අනුව නිවාස බෙදී යාම 30
4.2 වහළ ඉදිකිරීමට යොදාගත් ද්‍රව්‍ය අනුව නිවාස වර්ගීකරණය 31
4.3 ගෙබිම හා බිත්ති සඳහා යොදාගත් ද්‍රව්‍ය අනුව නිවාස වර්ගීකරණය 32
4.4 භූමියේ වර්ග ප්‍රමාණය අනුව නිවාස ව්‍යාප්තිය 32
4.5 දුරකථන භාවිතය අනුව පවුල් ව්‍යාප්තිය 34
4.6 ආලෝකය ලබාගැනීම සඳහා බලශක්ති භාවිතය 34
4.7 ආසන්නතම විදුලි කණුවට ඇති දුර අනුව විදුලිබලය නොමැති නිවාස ව්‍යාප්තිය 35
4.8 විදුලි බලය ලබා නොගැනීමට හේතු 36
4.9 ජලය ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍රය අනුව පවුල් ව්‍යාප්තිය 37
4.10 පානීය ජලය සපයා ගන්නා ළිඳ හෝ වෙනත් ජල මූලාශ්‍රයට ඇති දුර අනුව පවුල් ව්‍යාප්තිය 38
4.11 වැසිකිළි ස්වරූපය අනුව පවුල් ව්‍යාප්තිය 39
4.12 ගෘහ උපකරණ හිමිකාරීත්වය අනුව පවුල් ව්‍යාප්තිය 40
4.13 කෘෂි උපකරණ හිමිකාරත්වය අනුව පවුල් ව්‍යාප්තිය 41
4.14 යහපත් හා අයහපත් සෞඛ්‍ය පුරුදු අනුව පවුල් ව්‍යාප්තිය 42
4.15 සේවා සපයන ආයතන පිහිටි දුර අනුව 44
5.1 ඉඩම්වල ස්වභාවය හා පිහිටීම අනුව පවුල් ව්‍යාප්තිය 45
5.2 මුළු ඉඩම් බෙදී යාම - බැදිගම්තොට 46
5.3 ඉඩම් අයිතිය හා ස්වරූපය අනුව පවුල් ව්‍යාප්තිය 47
5.4 ප්‍රධාන ජල මූලාශ්‍ර අනුව ඉඩම් ව්‍යාප්තිය 49
6.1 ජල මූලාශ්‍ර අනුව වගාබිම් ව්‍යාප්තිය 51
6.2 කාෂි රසායන ලබා ගන්නා මූලාශ්‍ර අනුව ගොවින්ගේ ව්‍යාප්තිය 53
6.3 බැදිගම්තොට සතුන් පිළිබඳ තොරතුරු 59
7.1 ප්‍රජා සංවිධාන හා ජනතා සහභාගීත්වය 62
7.2 සමිති/සංවිධානවල සාමාජිකත්වය දැරීම අනුව පවුල් ව්‍යාප්තිය 63
7.3 බැදිගම්තොට සණස සමිතියේ තැන්පත් ව්‍යුහය සහ ඉතිරි කළ මුදල් ප්‍රමාණයන් 65
7.4 බැදිගම්තොට සණස සමිතියෙහි ණය නිකුතුව හා පොළී ආදායම් 66
7.5 විවිධ අරමුණු යටතේ නිකුත් කරන ලද ණය සංඛ්‍යාවන් (සණස - බැදිගම්තොට) 66
7.6 බැදිගම්තොට විජය ස්වයං බැංකු සමාජයේ විවිධ ඉතිරි කිරීම් 67

## පළමුවැනි පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 ගම නැගුම වැඩසටහන

වර්තමාන රජය "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශනය මත පදනම්ව ආරම්භ කළ "ගම නැගුම වැඩසටහන" ග්‍රාමීය දරිද්‍රතාවය අවම කිරීම සඳහා සහභාගීත්ව මෙන්ම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඇත. ගම නැගුම සංකල්පයෙහි මූලික අදහස වනුයේ ගමෙහි සංවර්ධනය සඳහා සැලසුම් සැකසීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ගමෙහි ජනතාව පාර්ශවකරුවන් බවට පත්කර ගැනීමයි. ගම ජාතික සවංර්ධනයෙහි කේන්ද්‍රස්ථානය බවට පත් කිරීම ගම නැගුම වැඩ සටහනෙහි "දැක්ම" වන අතර එහි "මෙහෙවර" වන්නේ ග්‍රාමීය ජනතාව තුලින් ගොඩ නැගෙන සහභාගිත්ව සංවර්ධන ජාලයක් ඔස්සේ ගම තුළ සංවර්ධනයක් ඇති කිරීමත් එමගින් රටෙහි සංවර්ධනය කරා ප්‍රවිශ්ඨ වීමත්ය.

ගම නැගුම වැඩසටහනෙහි අරමුණු පහත දැක්වේ.

1. ග්‍රාමීය ජනතාව සංවර්ධනයේ ඉලක්කයන් පමණක් නොව, සංවර්ධනයේ කොටස්කරුවන් බවට ද පත් කිරීම.
2. ග්‍රාමීය ජනතාවගේ සහභාගිත්වය තුළින් ගමේ ගැටළු හා විභවතාවන් හඳුනා ගෙන, ගම කේන්ද්‍රකොට, ඔවුන් සංවර්ධනයේ පෙර ගමන්කරුවන් ලෙස සංවර්ධන ක්‍රියාවලිය දියත් කිරීම.
3. ගම සංවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර සම්පත් මනා ලෙස කළමනාකරණය කොට, ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම.
4. දුප්පත්කම අවම කිරීම සඳහා අවශ්‍ය පිළියම් යොදමින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම.

මුල් දෙවසර තුළ දී තෝරා ගත් ගම්වල නිවාස නොමැති පවුල්වලින් 50% කට නිවාස තනා දීම, එම ගම්වල වැසිකිළි නොමැති සියළුම පවුල්වලට වැසිකිළි පහසුකම් සැපයීම, මුල් දෙවසර තුළ සියළුම ගම්වලට ආරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම, සෑම ගමකටම වාහන ධාවනය කිරීමට යෝග්‍ය මාර්ගයක් සකස් කිරීම වැනි කෙටි කාලීන ඉලක්ක ද සෑම ගමකටම විදුලිය, පොදු සන්නිවේදන සේවා ලබාදීම හා අධ්‍යාපනය දියුණු කිරීම වැනි දිගු කාලීන ඉලක්ක සපුරා ගැනීමට ද මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ.

### 1.2 ගම නැගුම ආදර්ශ ගම්මාන වැඩසටහන

ගම නැගුම වැඩසටහන යටතේ දියුණු කිරීම සඳහා ගම් තෝරා ගැනීම වට කිහිපයක් යටතේ සිදුවෙමින් පවතී. පළමු වටය සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක දහයක් නියෝජනය වන පරිදි ගම් දහයක් තෝරාගනු ලැබූ අතර එම ගම් ආදර්ශන ලෙස දියුණු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.



පුස්තකාලය
LIBRARY
ගො.ගො. ... ප.පු.ආ
HARTI

### 1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

ගම නැගුම ආදර්ශ වැඩසටහන යටතේ අදාළ ව්‍යාපෘති ගම්වල සිදු කෙරෙන සංවර්ධන කටයුතුවල බලපෑම් හඳුනා ගැනීමත් ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීමට හැකිවනු පිණිස එම ගම් පදනම් කරගෙන ඒවායෙහි පූර්ව- ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් (පාදක සමීක්ෂණයක්) සිදු කරන ලෙස කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා සිටිනු ලැබිණ. ඒ අනුව අදාළ ගම් පදනම් කර ගනිමින් සිදුකළ අධ්‍යයනයෙහි සොයා ගැනීම් මෙම වාර්තාව මගින් එළි දැක්වේ. මෙම අධ්‍යයනයේදී ව්‍යාපෘතියෙහි දිගු කාලීන බලපෑම් හා අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීම් ගණනය කිරීමට හැකිවනු පිණිස ගම්වල ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය හා අදාල තොරතුරු ලබා ගැනීමට අමතරව ව්‍යාපෘතියෙහි කෙටි කාලීන බලපෑම් ගණනය කිරීම සඳහා ගම්වල ඇති යටිතල පහසුකම් මෙන්ම අනෙකුත් සේවා පහසුකම්, කෘෂි තාක්ෂණ භාවිතයන් යනාදිය පිළිබඳව ද තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කෙරිණ.

### 1.4 අධ්‍යයනයෙහි අරමුණු

මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ගම නැගුම වැඩසටහනෙහි ප්‍රථම අදියර යටතේ තෝරාගත් ගම්වල පවත්නා සමාජ ආර්ථික තත්ත්වය හා අදාල තොරතුරු රැස් කිරීම හා වාර්තාගත කිරීමය.

එහි සුවිශේෂී අරමුණු වන්නේ,

i. අධ්‍යයනය සඳහා තෝරාගත් ගම්වල ජනගහන තොරතුරු එනම් ජන සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, අධ්‍යාපන හා සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ විස්තර ලබා ගැනීම.

ii. අධ්‍යයන ගම්වල ජීවන මාර්ග, රැකියාවන්හි ස්වභාවය, ආදායම් තත්ත්වය, ඉතිරි කිරීම හා ණයගැති භාවය පිළිබඳව අධ්‍යයනය කිරීම.

iii. ගම්වාසීන්ට ඉඩම් භාවිතය සඳහා ඇති හැකියාව, ඉඩම් අයිතිය, බුක්තියෙහි ස්වභාවය හා ඉඩම් සම්බන්ධයෙන් ඇති ගැටළු විමසා බැලීම.

iv. වැසියන්ගේ නිවාස අයිතිය, ඒවායෙහි ස්වභාවය හා ඒවා සඳහා ඇති පහසුකම් පිළිබඳව සොයා බැලීම

v. වැසියන්ගේ නිවාසවල ඇති බඩු බාහිරාදිය මෙන්ම කෘෂිකාර්මික උපකරණ පිළිබඳව විමසා බැලීම

vi. අදාල ගම්වල ගමනාගමනය, විදුලි බලය, දුරකථන පහසුකම්, බීම සඳහා මෙන්ම නෑම සඳහා ජලය, අධ්‍යාපනය, සෞඛ්‍ය, තාක්ෂණික දැනුම ලබාදීම හා අලෙවි පහසුකම් යනාදිය සම්බන්ධයෙන් ඇති යටිතල පහසුකම් පිළිබඳව අධ්‍යයනය

vii. එම ගම්වල ඇති ප්‍රජා සංවිධාන හා ඒවා තුළ වැසියන් නියෝජනය මෙන්ම ගමෙහි සංවර්ධනය හා සම්බන්ධ තීරණ ගැනීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ සහභාගිත්වය පිළිබඳව විමර්ශනය කිරීම

viii. ජනතාව සතු ඉඩම් හා ජලය වැනි සම්පත් ඔවුන්ගේ නිෂ්පාදනය හා ආදායම් වර්ධනය සඳහා කෙතරම් දුරට කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතයට ගන්නේද යන්න සොයා බැලීම.

ix. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා තාක්ෂණික හා යෙදවුම් භාවිතයෙහි ස්වභාවය පිළිබඳව විමසීම.

x. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා වන නිෂ්පාදන වියදම හා ලාභය ගණනය කිරීම.

## 1.5 අධ්‍යයන ක්‍රමවේදය

ගම නැගුම ප්‍රථම වටය යටතේ තෝරාගත් ගම් දහයෙහි ක්ෂේත්‍ර අධ්‍යයනයක් ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කරනු ලැබිණ. මින් ප්‍රධාන ක්‍රමය වූයේ ඒ ඒ ගම්වල පදිංචි පවුල් ආශ්‍රයෙන් සිදුකළ නියැදි සමීක්ෂණයයි. ඒ ඒ ගමෙහි පවුල්වලට අදාල පෞද්ගලික තොරතුරු මෙන්ම එම ගම්වල සංවර්ධනයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා එමගින් උත්සාහ ගැනුණි. ගම්වල සංවර්ධනයට අදාල පොදු තොරතුරු ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරීන්, කෘ.ප.නි.ස.වරුන් ප්‍රජා සංවිධාන නායකයින්, පාසල, පන්සල හා වෙනත් පොදු සේවා සපයන ආයතනවල ප්‍රධානීන් වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සාකච්ඡා කරනු ලැබිණ. කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ස්වයං රැකියා, යනාදී විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේදී ඒ හා කටයුතුවල නියුතු පුද්ගලයන් සමග කණ්ඩායම් සාකච්ඡා පවත්වනු ලැබිණ. මීට අමතරව ද්විතීයික දත්ත භාවිතා කිරීම ද සිදුකළ අතර විවිධ විෂයන්ට අදාලව ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස. වරුන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් යන අයත් අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන, පශු වෛද්‍ය කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ග්‍රාමීය බැංකු වැනි ආයතනත් දැනට රැස්කර ඇති තොරතුරු මේ යටතේ ලබා ගනු ලැබිණ. මෙසේ විවිධ මාර්ගයන්ගෙන් ලබාගත් තොරතුරු නියැදි සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු සමග සම්බන්ධ කරනු ලැබිණ.

නියැදි සමීක්ෂණය සඳහා සාමාන්‍යයෙන් අදාල ගම්වල පදිංචි පවුල්වලින් භාගයක් සසම්භාවී ක්‍රමයට (සසම්භාවී වගු භාවිතයෙන්) තෝරාගත් අතර පවුල් සංඛ්‍යාව 100ට අඩු ප්‍රමාණයක් වූ ගම්වල මුළු පවුල් ප්‍රමාණයම නියැදිය සඳහා තෝරාගනු ලැබිණ. අදාල නියැදි පවුල්වලින් තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නාවලියක් භාවිතා කරනු ලැබූ අතර එසේ තොරතුරු ලබා ගැනීමට ඒ ඒ ගම් ප්‍රදේශවලින් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත් මෙන්ම උපාධිධාරී වැනි ඉහළ සුදුසුකම් ඇති තරුණ තරුණියන් සහභාගී කරගනු ලැබිණ. ග්‍රාම නිලධාරී. කෘ.ප.නි.ස., වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් හා සාකච්ඡාකර ගම්වලට අදාළව ඇති යටිතල පහසුකම්, සේවා ආයතන යනාදියට සම්බන්ධව තොරතුරු ගැනීම සඳහා ද පොදු ප්‍රශ්නාවලියක් භාවිත කරනු ලැබිණ.

## 1.6 අධ්‍යයන කාලය

මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය මූලික තොරතුරු 2006 ජූලි සහ අගෝස්තු කාල සීමාව තුළ ලබාගත් අතර, ආදායම ගණනය කිරීමේදී 2005 අගෝස්තු සිට 2006 ජූලි දක්වා වූ වසරක කාල සීමාව පදනම් කරගනු ලැබිණ. නිෂ්පාදනය හා සම්බන්ධ තොරතුරු ගැනීමේදී 2005 යල කන්නය හා 2005 - 2006 මහ කන්නය පදනම් කරගනු ලැබිණ.

දෙවන පරිච්ජේදය

# බැදිගම්තොට ගම්මානය

## 2. මූලික සමාජ ආර්ථික තොරතුරු

### 2.1 පිහිටීම

වත්මන් රජයේ මූලික සංවර්ධන ක්‍රමෝපායක් වන "ගම නැගුම" වැඩ සටහන යටතේ ආදර්ශ ගම්මාන ලෙස සංවර්ධනය කිරීම සඳහා මූලික වටයේ තෝරාගත් ගම්මාන අතරින් එකකි බැදිගම්තොට. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම දකුණු පළාතෙහි හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇත. මෙය අම්බලන්තොට ගොවිජන සේවා බලප්‍රදේශයට අයත්වන අතර ප්‍රාදේශීය සංවර්ධන අවශ්‍යතා සූරියවැව ප්‍රාදේශීය සභාව මඟින් ඉටුවේ.

වර්ග කිලෝ මීටර් 8.5 ක පමණ භූමි ප්‍රදේශයක් පුරා විහිදෙන බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම බැදිගම්තොට, කටුකැපුආර, ගලේයාය, වටවන හා ජනාවාසය යන කුඩා ගම් ඒකක පහකින් සමන්විත වේ. සූරියවැව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයෙහි නිරිතදිග කෙළවරෙහි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම පිහිටා ඇත. එයට උතුරින් හා නැගෙනහිරින් පිළිවෙලින් එම ප්‍රා.ලේ. කොට්ඨාසයේම වෙනිවැල් ආර හා මහ පැලැස්ස ග්‍රාම නිලධාරී වසම් මායිම් වන අතර බටහිරින් රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා දකුණින් අම්බලන්තොට ප්‍රා.ලේකම් බල ප්‍රදේශයෙන් මායිම් වේ.

### 2.2 දේශගුණික තත්ත්වය

බැදිගම්තොට ගම්මානයේ දේශගුණික ලක්ෂණ පිළිබඳව විමසීමේදී ප්‍රදේශයේ කාලගුණික සාධකයන්ගේ හැසිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතුය. සමස්තයක් ලෙස ගත්විට හම්බන්තොට දිස්ත්‍රික්කයේ උණුසුම් වියළි කාලගුණයක් දීප්තිමත් සූර්යාලෝකයක් සමග සාමන්‍ය ලෙස පවතී. මෙම සාමාන්‍ය තත්ත්වය දිස්ත්‍රික්කයේ බටහිර හා වයඹදිග කඳුකර කලාපයන්ට හැර අනෙකුත් ප්‍රදේශයන්හි දක්නට ලැබේ. මේ අනුව දිස්ත්‍රික්කයේ දෛනික සාමාන්‍ය උෂ්ණත්වය $26.6C^0$-27.2 $C^0$ අතර මට්ටමෙහි පවතී. ප්‍රදේශයේ දෛනික සූර්යාලෝකය පවත්නා සාමාන්‍ය කාලය පැය 6.8 කි. වසරේ මාර්තු මාසය තුළ මෙය උපරිම මට්ටමක් ගන්නා අතර එය පැය 8.2 පමණ වේ. ජූනි මාසයේදී මෙම අගය අවම මට්ටමක් ගන්නා අතර එය සාමාන්‍යයෙන් පැය 5.8 තරම් වූ සාපේක්ෂ වශයෙන් පහළ මට්ටමකි.

වායුගෝලයෙහි සාපේක්ෂ ආර්ද්‍රතාව 81%-76% අතර පවත්නා අතර එය මැයි, ජූනි හා නොවැම්බර් මාසවලදී ඉහළ මට්ටමක් ගනී. හම්බන්තොට දිස්ත්‍රික්කයට වසරේ ඉහළම වර්ෂාපතනයක් දෙසැම්බර්, ජනවාරි හා මැයි මාසවලදී ලැබෙන අතර පෙබරවාරි, ජූලි හා අගෝස්තු මාසවල එය අවම මට්ටමෙහි පවතී.

ප්‍රදේශයේ දේශගුණය ඉහත කාලගුණික ලක්ෂණයන්ගේ එකතුවෙන් නිර්මාණය වන අතර ඒ සඳහා ප්‍රබල ලෙසම බලපාන්නේ වර්ෂාපතනය හා සුළං ගමනයයි. (Rainfall and wind circulation) බැදිගම්තොට ඇතුළු ප්‍රදේශයේ වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 26.6 සිට 27.2 මට්ටමක පවතී. අප්‍රේල් හා ජූනි මාසවල එය

උපරිම මට්ටමක් දක්වා ඉහළ නගින අතර දෙසැම්බර් හා ජනවාරි කාල පරාසය තුළ අවම මට්ටමක් දක්වා පහළ බසී.

ප්‍රදේශය තුළ සුළං ගමනය සඳහා බලපාන ප්‍රධාන සාධකය මෝසම් ක්‍රියාවලියයි. නිරිතදිග මෝසම් ක්‍රියාවලිය මැයි සිට සැප්තැම්බර් දක්වා ක්‍රියාත්මක වන අතර ඊශාන දිග මෝසම නොවැම්බර් සිට මාර්තු දක්වා ක්‍රියාත්මක වේ. අන්තර් මෝසම් කාල පරාසය හා අප්‍රේල් හා ඔක්තෝම්බර් යන මාසවල ප්‍රදේශයේ සුළං ක්‍රියාකාරීත්වය අවිධිමත්ව විවිධ දිශාවන් ඔස්සේ හමායන අතර එය උතුරු, ඊශාන දිග හා ගිනිකොණ දිශාගතව හමායාමක් දක්වයි. ඉතා ප්‍රබල මෝසම් සුළං මාර්ගයෙන් ප්‍රදේශයට වර්ෂාව ලැබෙන අතර නිරිතදිග මෝසම පැයට කි.මී. 23 ක පමණ සාමාන්‍ය වේගයකින් හමායන අතර ඊශාන දිග මෝසම පැයට කි.මී. 11ක පමණ සාමාන්‍ය වේගයකින් ප්‍රදේශය හරහා හමායයි.

දිස්ත්‍රික්කයේ වාර්ශික වර්ෂාපතනය මි.මී.889 - මි.මී.2540 අතර පිහිටයි. මෝසම් ක්‍රියාවලිය මගින් ප්‍රදේශයට වර්ෂාව ලබාදෙන අතර ඊශාන දිග මෝසම ක්‍රියාත්මකවන කාල පරාසය මහ කන්නය ලෙසත් නිරිතදිග මෝසම ක්‍රියාත්මක වන කාල පරාසය යල කන්නය ලෙසත් හඳුන්වයි.

හම්බන්තොට දිස්ත්‍රික්කය සමස්ථයක් ලෙස ගත්විට දේශගුණික සාධකයක් ලෙස වර්ෂාපතනය මූලික ලෙස ගැනීමේදී ප්‍රදේශය ප්‍රධාන දේශගුණික කලාප 03 කට බෙදිය හැකිය. එනම් තෙත් කලාපය (සාමාන්‍ය වා. වර්ෂාපතනය මි.මී. 1905 - මි.මී. 2540) අන්තර් කලාපය හා (සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1270 - මි.මී. 1905) වියළි කලාපය (සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1066 - මි.මී. 1270) වශයෙනි. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම අන්තර් හා වියළි කලාපය වෙන්වන මායිමෙහි පිහිටා ඇත (ඇමුණුම් අංක 01). මේ අනුව මෙහි අන්තර් හා වියළි කලාපීය ලක්ෂණ සම්මිශ්‍රණයක් දැකිය හැකිය.

## 2.3 ඓතිහාසික තොරතුරු හා ජනාවාස වීම

බැදිගම්තොට ගම්මානය පිළිබඳ ඉතිහාසය අනුරාධපුර රාජධානි සමය දක්වා දිවෙන බව ජනප්‍රවාද හා පුරාවෘත්ත මගින් හෙළිවේ. අනුරාධපුර යුගයේ සොළී ආක්‍රමණයන් පරදා රට එක්සේසත් කළ දුටුගැමුණු රජතුමා වලවේ ගඟින් එතෙර වූ තොටුපළ බැදිගම්තොට නමින් ව්‍යවහාර වූ බව ජනප්‍රවාදයේ පවතී. එසේම ඉංග්‍රීසි පාලන සමයෙහි හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පරිපාලකයා ලෙස කටයුතුකළ ලෙනාඩ් වුල්ෆ් තම වාර්තාවන්හි බැදිගම්තොට පිළිබඳව සඳහන්කර ඇත. මේ අනුව ඉතා පැහැදිලිවන්නේ මෙම ප්‍රදේශය ඉතා ඈත වකවානුවෙහි සිටම ජනාවාසයක්ව පැවති බවයි. ගම්මානය ආසන්නයේ ඓතිහාසික වශයෙන් ඉතා වැදගත්කමක් උසුලන පඩිකෙම්ගල විහාරය මදුනාගල ආරණ්‍ය සේනාසනය වැනි සිද්ධස්ථාන පිහිටීම මගින් මෙය වඩාත් තහවුරු වෙයි.

අතීත සාධක මගින් හෙළිවන පරිදි මෙම ප්‍රදේශය වලව ගඟ ආශ්‍රිතව සශ්‍රීක ප්‍රදේශයක්ව පැවත ඇති අතර හේන් වගාව ප්‍රධාන ජීවනෝපාය මාර්ගය ලෙස පැවත ඇත. මහවැලි සංවර්ධන ව්‍යාපාරය ආරම්භවීමත් සමග ප්‍රදේශයේ ආර්ථික හා සමාජීය නව පෙරළියක් සිදුවිය. 1982 පමණ කාල වකවානුවෙහි වලව විශේෂ බල ප්‍රදේශය යටතේ මහවැලි ජලය ප්‍රදේශයේ ගොවීන්ට ලැබුණු අතර ඉන් එතෙක් ප්‍රමුඛස්ථානයෙහි පැවති හේන් වගාව වෙනුවට වී හා

වෙනත් වානිජ භෝග වගාවන් කෙරෙහි ගොවීන් නැඹුරු විය. නැවත 1999-2000 කාල වකවානු තුළ මහවැලි නව සංවර්ධන වැඩසටහන යටතේ මුලින් ලබාදුන් ඉඩම් ප්‍රති සංවිධානය වූ අතර ගොවි පවුල් ඒකකයක් සඳහා කුඹුරු ඉඩම් අක්කර දෙකක් හා ගොඩ ඉඩම් අක්කර 1/4 බැගින් ලබාදුණි. මෙලෙස ඉඩම් ලබාදීමේදී පාරම්පරිකව අනවසරයෙන් ප්‍රදේශයේ පදිංචිවී සිටි කොටස් වෙත ප්‍රමුඛත්වය ලැබුනු අතර ඉතා සුළු වශයෙන් අවශේෂ ප්‍රදේශවලින්ද ජන කොටස් ප්‍රදේශයේ පදිංචියට එක් විය. මේ අනුව ඉතා පැහැදිලි වන්නේ බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම පාරම්පරිකව ජන කොටසක් මෙන්ම රජයෙන් ඉඩම් ලබාදීම මත පදිංචියට පැමිණි ජන කොටසකින්ද යුක්තවන බවයි.

## 2.4 ජනගහනය

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජනගහනය ආශ්‍රිත තොරතුරු කරුණු කිහිපයක් ඔස්සේ විග්‍රහ කළ හැක. ග්‍රාම නිලධාරී වාර්තාවලට අනුව ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාව 410 කි. මුළු ජනගහනය පුද්ගලයින් 1673 කි. ඉන් 838 ක් ස්ත්‍රීන් වන අතර 835 ක් පිරිමින් වේ. මේ අනුව ප්‍රදේශයේ ප්‍රමිතිරි අනුපාතය (ස්ත්‍රීන් සියයකට පිරිමි) 99.64 කි. එනම් ආසන්න වශයෙන් සමාන මට්ටමකි. එය ජාතික මට්ටමේ අගය වන 98 සමග සැසඳීමේදී සුළු වශයෙන් ඉහළ අගයකි.

පවුලක සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව පුද්ගලයින් හතරක මට්ටමේ පවතී. සමීක්ෂණයට ලක්කළ පවුල් 205 අතරින් පවුල් 174 ක සාමාජිකයින් 3-6 පරාසයෙහි සිටින අතර එය සියයට 85 ක ප්‍රතිශතයකි. 2.1 සංඛ්‍යා සටහන මගින් සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි විස්තරයක් සැපයේ.

**2.1 සංඛ්‍යා සටහන**

**සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය**

| සාමාජික සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 0-2 | 12 | 5.9 |
| 3-6 | 174 | 84.9 |
| 7-9 | 19 | 9.3 |
| එකතුව | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය 2006- හෙ.කො.ගො.ප.පු.ආ.**

මේ අනුව ඉතා පැහැදිලි වන්නේ වැඩි වශයෙන් පවුලක සාමාජික සංඛ්‍යාව 4-5 මට්ටමෙහි පවතින බවයි. පවුල් සැළසුම් ක්‍රම වෙත ජනතාව නැඹුරුවීම හා ඒ පිළිබඳ අවබෝධය ලැබීම මේ සඳහා ප්‍රබල සාධකයක්ව පවතී.

ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණය අක්කර 1810 කි (අභ්‍යන්තර ජලාශ හා වනාන්තර හැර). එය දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 7.24 ක භූමි ප්‍රමාණයකි. මේ අනුව බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජන ඝනත්වය වර්ග කිලෝ මීටරයට පුද්ගලයින් 231 කි. එය දිස්ත්‍රික්කයේ සාමාන්‍ය අගය වන 214 සමග සැසඳීමේදී ඉහළ අගයක් වන අතර



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

ජාතික මට්ටමේ අගය වන 307 සමග සැසඳීමේදී පහළ මට්ටමකි. මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රදේශයේ ජන ඝනත්වය දිස්ත්‍රික්කයේ සාමාන්‍ය තත්ත්වය හා සැසඳීමේදී ඉහළ අගයක් ගන්නාබවයි.

### 2.4.1 වයස් ව්‍යුහය

යම්කිසි ප්‍රදේශයක ජනතාවගේ වයස් ව්‍යුහය එම ප්‍රදේශයේ සමාජ ආර්ථික වටපිටාව පිළිබඳව විවිධ පැති අනාවරණය කරයි. බැදිගම්තොට ගම්මානයේ වයස් ව්‍යුහය සැළකීමේදී ද එය විවිධ අංශ ඔස්සේ විග්‍රහ කළ හැක.

2.2 සංඛ්‍යා සටහන

**වයස් ව්‍යුහය අනුව ජනගහන ව්‍යාප්තිය - බැදිගම්තොට**

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 0-4 | 29 | 27 | 56 | 6.01 |
| 5-9 | 39 | 49 | 88 | 9.45 |
| 10-14 | 57 | 44 | 101 | 10.85 |
| 15-24 | 114 | 96 | 210 | 22.56 |
| 25-34 | 76 | 79 | 155 | 16.65 |
| 35-44 | 60 | 66 | 126 | 13.53 |
| 45-54 | 48 | 52 | 100 | 10.74 |
| 55-64 | 32 | 20 | 52 | 5.59 |
| 65-74 | 20 | 12 | 32 | 3.44 |
| 75 ට වැඩි | 6 | 5 | 11 | 1.18 |
| එකතුව | 481 | 450 | 931 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – හෙ.කො.ගො.ප.පු.ආ. –2006**

සමස්තයක් ලෙස වයස් කාණ්ඩ අනුව ජනගහනය අනු කණ්ඩායම් හතරක් යටතට ගොනු කළ හැකිය. එනම් අවුරුදු 0-13 දක්වා පිරිස ළමා ජනගහනයත් අවුරුදු 14-25 තරුණ ජනගහනය ලෙසත් අවුරුදු 26-55 මැදි වයස් ජනගහනය ලෙස හා අවුරුදු 55ට වැඩි පිරිස වැඩිහිටි ජනගහනය ලෙසයි. බැදිගම්තොට සමීක්ෂණයට ලක්කළ පවුල්වල ජනගහනය පිළිබඳව සළකා බැලීමේදී ඉන් සියයට 26 ක් ළමා ජනගහනය යටතට වැටේ. තරුණ ජනගහනය සියයට 23ක් පමණ වන අතර මැදිවයස් ජනගහනය සියයට 41 ක මට්ටමේ පවතී. වැඩිහිටි ජනගහනය සියයට 10 කි. මෙකී වයස් සංයුතිය පිළිබඳව සළකා බැලීමේදී එය බොහෝ දුරට ජාතික මට්ටමේ අගයන් සමග සමානවීමක් පෙන්වයි.

ජාතික මට්ටමේ ප්‍රවනතාවයක් ලෙස දැක්වෙන ළමා ජනගහනය ක්‍රමයෙන් අඩුවීම හා වැඩිහිටි ජනගහනය ඉහළ යාමේ ලක්ෂණ මෙකී ප්‍රදේශය තුළින්ද නිරීක්ෂණය කළ හැකිය. එම අගයන් ජාතික මට්ටමේ අගයන් සමග සුළු වශයෙන් වෙනස් වුවද දිගුකාලීන සමාජ ආර්ථික පරිවර්තනයන්හි ප්‍රතිඵල දැකගත හැකිය.

වයස් ව්‍යුහය සම්බන්ධයෙන් සළකා බැලීමේදී වයස අනුව යැපුම් අනුපාතය (Age Dependency Ratio) ඉතා වැදගත් දර්ශකයකි. මෙමගින් ආර්ථිකමය වශයෙන් සක්‍රීය ජනගහනයට සාපේක්ෂව යැපුම් අනුපාතය සකසා ගනු ලබයි. වයස අවුරුදු පහළොවට අඩු හා 65 හා ඊට වැඩි පිරිස ආර්ථිකමය වශයෙන් අක්‍රිය ජනගහනය ලෙස සළකයි. මේ අනුව සක්‍රීය ජනගහනය වන 15-64 අතර පිරිසට සාපේක්ෂව යැපෙන්නන් කොතරම්ද යන්න ගණනය කරනු ලබයි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සළකා බැලීමේදී සමීක්ෂණයට ලක්කළ ජනගහනයෙන් වයස අනුව යැපුම් අනුපාතය සියයට 57.5 කි. එය ළමා යැපුම් අනුපාතය සියයට 41.5 හා වැඩිහිටි යැපුම් අනුපාතය සියයට 16 වශයෙන් බෙදී යයි. ජාතික මට්ටමේ අගයන් හා සැසඳීමේදී වයස අනුව යැපුම් අනුපාතය බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ ඉහළ අගයක් ගන්නා බව පෙනේ.

ආදායම් යැපුම් අනුපාතය යන්නෙන් අදහස් වන්නේ පවුලක ආදායම් උපයන්නෙකුට සිටින යැපෙන්නන් සංඛ්‍යාවෙහි සාමාන්‍ය අගයයි. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සළකා බැලීමේදී එය 1.6 ක අගයක් ගනී. මෙහි ජාතික මට්ටමේ අගය 1.7 ක් වන අතර ග්‍රාමීය අංශය තුළ එය 1.8 ක අගයකි. මේ අනුව ආදායම් යැපුම් අනුපාතය සම්බන්ධයෙන් සළකා බැලීමේදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ එහි හොඳ ලක්ෂණ පෙන්නුම් කරයි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි විවාහක තත්ත්වය සම්බන්ධයෙන් සළකා බැලීමේදී මුළු ජනගහනයෙන් සියයට 46 ක් විවාහක කොටසට අයත් වේ. සියයට 50 ක් අවිවාහකයින් වන අතර වැන්දඹු පිරිස සියයට 2 කි. දික්කසාද වීම් හෝ වෙන්වීම් ඉතා සුළු වශයෙන් වාර්තාවන අතර එය සියයට 0.6 ක තරම් පහළ මට්ටමක පවතී. සමීක්ෂණයට ලක්කළ ජනකොටසෙන් පුද්ගලයින් 4 දෙනෙකු නීත්‍යානුකූලව විවාහ නොවී එකට ජීවත්වන අය ලෙස වාර්තාවී ඇත. එම තත්ත්වය වත්මන් සමාජ ක්‍රමය තුළ හිතකර නොවන අතර විවිධ ගැටළුකාරී තත්ත්වයන්ට යොමුවීමකටද හේතුවිය හැක.

## 2.5 අධ්‍යාපන තත්ත්වය

ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවත්නා අනෙකුත් රටවල් සමග සැසඳීමේදී අධ්‍යාපන දර්ශක අතින් ඉහළ මට්ටමක පවතී. එය බොහෝ විට සංවර්ධිත රටවල මට්ටම දක්වා ඉහළ යාමක් පෙන්නුම් කරයි. සාක්ෂරතාවය සම්බන්ධයෙන් සළකා බැලීමේදී ශ්‍රී ලංකාවේ එම අගය 92.5 ක මට්ටමක පවතින අතර එය ග්‍රාමීය මට්ටමේදී 92.8 දක්වා වූ අගයක් වාර්තා කරයි. මෙකී තත්ත්වයන් සඳහා ප්‍රබල ලෙස බලපා ඇත්තේ රට තුළ නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වීමේදී සහනාධාර හා ක්‍රමෝපායන් හරහා දරුවන් පාසල් වෙත ඇතුලත්කොට විධිමත් අධ්‍යාපනය වෙත යොමු කරවීමට අනුබල දීමත්ය.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සළකා බැලීමේදී ද එහි සාක්ෂරතා මට්ටම සියයට 97.3 ක මට්ටමේ පවතී. මෙය ඉතා ඉහළ මට්ටමක් වන අතර ඒ තුළින් අධ්‍යාපන සේවාවන්හි ව්‍යාප්තිය පිළිබඳ හොඳ චිත්‍රයක් මවාපායි. ස්ත්‍රී හා පුරුෂ වෙනස්වීම්වලට අනුව සාපේක්ෂතා මට්ටම පිළිබඳ සැළකිමේදී පුරුෂ සාක්ෂරතාවය

සියයට 97.5 ක් වන අතර ස්ත්‍රී සාක්ෂරතාවය සියයට 97.07 කි. එනම් ආසන්න වශයෙන් සමාන බවකි. මේ අනුව ඉතා පැහැදිලිවන්නේ බැදිගම්තොට ගම්මානයෙහි ස්ත්‍රී පුරුෂ විෂමතාවය අනුව සාක්ෂරතාවයෙහි පැහැදිලි වෙනස්වීමක් නොදක්වන බවයි. එමෙන්ම එය ජාතික මට්ටමෙහි ග්‍රාමීය ප්‍රදේශයන්හි සාක්ෂරතා මට්ටමට වඩා ඉහළින් පිහිටයි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි අධ්‍යාපන මට්ටම් සම්බන්ධයෙන් සළකා බැලීමේදී සමීක්ෂණයට ලක්වූවන්ගෙන් වැඩි පිරිස එනම් සියයට 56.5 ද්විතීක මට්ටම එනම් 6 වසර සිට 11 වසර දක්වා වූ කාණ්ඩය තුළ පාසල් අධ්‍යාපනය ලැබූවන්ය.

2.3 සංඛ්‍යා සටහන

**අධ්‍යාපන මට්ම අනුව ජනගහන ව්‍යාප්තිය - බැදිගම්තොට**

| අධ්‍යාපන මට්ටම | පුරුෂ | ස්ත්‍රී | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය (1-5) | 129 | 94 | 223 | 26.5 |
| ද්විතියික අධ්‍යාපනය (6-11) | 246 | 234 | 480 | 56.5 |
| සා.පෙළ සමත් | 36 | 42 | 78 | 9.2 |
| උ.පෙළ සමත් | 10 | 14 | 24 | 2.8 |
| උපාධි අපේක්ෂක | 0 | 2 | 2 | 0.2 |
| උපාධිධාරී | 4 | 4 | 8 | 1.0 |
| පාසල් නොගිය/ ලිවීමට කියවීමට හැකි | 4 | 7 | 11 | 1.3 |
| පාසල් නොගිය ලිවීමට/කියවීමට නොහැකි | 11 | 12 | 23 | 2.7 |
| එකතුව | 440 | 409 | 849 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

මෙම ගණනය කිරීමේදී මුළු ජනගහනයෙන් පාසල් යාම සඳහා සුදුසුකම් සපුරා නොමැති අය එනම් පාසල් යාමට නියමිත වයස් මට්ටමට අඩු පිරිස ඉවත්කොට ඇත. එමෙන්ම දැනට පාසල් යන පිරිසද අදාල අධ්‍යාපන මට්ටම තුළට අන්තර්ගත කර ඇත.

2.3 සංඛ්‍යා සටහන පෙන්වන පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි අධ්‍යාපනය ලැබිය හැකි පිරිසෙන් අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් හෝ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් ලබා ඇත්තේ සියයට 17.2 වැනි පිරිසකි. එමෙන්ම උසස් පෙළ සමතුන් සියයට 2.8 තරම් පහළ මට්ටමක පවතින අතර උපාධි අපේක්ෂක හෝ උපාධිධාරීන් සියයට එකක තරම් ප්‍රතිශතයක පවතී. මේ අනුව පැහැදිලි වන්නේ අ.පො.ස සාමාන්‍ය පෙළ මට්ටමෙන් හෝ ඊට පහළ අධ්‍යාපන මට්ටම්වලදී පාසල් හැරයාමක් පෙන්නුම් කරන බවයි. එමෙන්ම උසස් අධ්‍යාපනය සඳහා යොමුවන පිරිස ඉතා පහළ මට්ටමක පවතී. වෘත්තීය අධ්‍යාපන අංශයන්හි අවධානය මෙම ප්‍රදේශය වෙත යොමු කිරීම ඉතා වැදගත් වන අතර එකී වැඩසටහන් පාසල් හැරයන තරුණ කොටස් ඵලදායී ආර්ථිකමය කාර්යයන්හි යෙදවිය හැකි ආකාරයේ ආකර්ෂණයකින් හා ප්‍රදේශයේ අවශ්‍යතාවයන්ට ගැළපෙන්නක් වීමද අත්‍යවශ්‍ය අංගයකි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි අධ්‍යාපන තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී ඒ සඳහා ගම තුළ ඇති පහසුකම් සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුය. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බැදිගම්තොට මහා විද්‍යාලය ගම මධ්‍යයෙහි පිහිටා ඇති අතර එහි සිසුන් 482 ක් අධ්‍යාපනය ලබයි. ඉන් 227 දෙනෙකු සිසුන් වන අතර 255 ශිෂ්‍යාවන් වේ. ආචාර්ය මණ්ඩලය 23 දෙනෙකි. පළමු වසරේ සිට සාමාන්‍ය පෙළ මට්ටම දක්වා පන්ති පැවැත්වේ. පාසල් පැමිණීමේ ලේඛනවලින් හෙළිවන පරිදි සිසුන්ගේ පැමිණීම සියයට 85-90 මට්ටමෙහි පවතී. වාර්ෂිකව සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත්ව උසස් පෙළ සඳහා යොමුවිය හැකි පිරිස සියයට 15-20 අතර මට්ටමෙහි පසුවෙයි. ඉතිරි පිරිස පාසල් අධ්‍යාපනයෙන් සමුගනී. පාසල් අධ්‍යාපනයෙහි අනිවාර්ය අංගයක් ලෙස පවතින පෙළ පොත් පාසල් සිසුන්ට කළට වේලාවට නොලැබීම මෙම පාසල තුළින්ද වාර්තා වන අතර අධ්‍යාපනය ලබාදීමේදී එය දැඩි දුෂ්කරතාවයකට දරුවන් හා ගුරුවරුන් ලක්වීමකි.

පාසලේ භෞතික පහසුකම් පිළිබඳව සැළකීමේදී විද්‍යාගාර, පුස්තකාල හා පරිගණක ඒකක මෙම විද්‍යාලය තුළ දක්නට නොලැබේ. වැසිකිළි පහසුකම් හා ජල පහසුකම් දරුවන්ට හා ගුරුවරුන්ට නොලැබෙන අතර ගුරු නිවාස අබලන්වීම හා ප්‍රමාණවත් නොවීම දුර බැහැර ගුරුවරුන් පාසල තුළ රඳවා ගැනීමේදී බාධාකාරී සාධකයක්ව පවතී.

ග්‍රාම නිලධාරී වාර්තාවලින් හෙළිවන පරිදි බැදිගම්තොට ගම්මානය තුළ පාසල් යා යුතු වයසේ පසුවන එනම් අවුරුදු 5-14 වයස් කණ්ඩයට අයත් සියළු දෙනා පාසල් අධ්‍යාපනය වෙත යොමුවී ඇත.

නූතන අධ්‍යාපනික ක්‍රමවේදයන් තුළ තොරතුරු තාක්ෂණයට සුවිශේෂී ස්ථානයක් හිමිවෙයි. පරිගණක භාවිතය හා අන්තර්ජාල භාවිතය නූතන අධ්‍යාපනික දර්ශකයන් අතර වැදගත් ස්ථානයක් ගනී. බැදිගම්තොට ගම්මානයේ ජනතාවගේ පරිගණක භාවිතා කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සමීක්ෂණය තුළදී අවධානය යොමුකළ අතර අවුරුදු 5 හා ඊට වැඩි ජනගහනයට සාපේක්ෂව පරිගණක භාවිතා කිරීමේ හැකියාව සියයට 3.8 ක මට්ටමේ පවතී.

2.4 සංඛ්‍යා සටහන

**පරිඝනක භාවිතයේ හැකියාව අනුව පවුල් ව්‍යාප්තිය**

| පරිඝනක භාවිතා කළහැකි පවුලේ සාමාජික සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 0 | 177 | 86.3 |
| 1 | 24 | 11.7 |
| 2 | 3 | 1.5 |
| 3 | 1 | 0.5 |
| එකතුව | 205 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය –හෙ.කො.ගො..ප.පු.ආ. – 2006

2.4 සංඛ්‍යා සටහන මඟින් පරිගණක භාවිතා කළ හැකි සාමාජික සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්ත වී ඇති ආකාරය පෙන්වයි. මෙමඟින් පැහැදිලි වන්නේ ගම්මානයේ පවුල්වලින් සියයට 86 ක කිසිවකුට පරිගණක භාවිතය පිළිබඳ දැනුමක් හා හැකියාවක් නොමැති බවයි. සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 14 ක අඩුම වශයෙන් එක්

අයෙකුට හෝ පරිගණක භාවිතය පිළිබඳ අවබෝධයක් ඇත. ගම්මානය සම්බන්ධයෙන් සළකා බැලීමේදී මෙහි වැඩි පිරිසක් එනම් සියයට 83 ක් පමණ ප්‍රාථමික හෝ ද්විතීයික අධ්‍යාපන මට්ටමෙහි පසුවන්නන්ය. එසේම ගොවිතැන හෝ කම්කරු රැකියාවන් ප්‍රමුඛ වෙයි. මේ හේතුවෙන් පරිගණක භාවිතය පිළිබඳ අවශ්‍යතාවයක් හෝ හැකියාවක් ඇති නොවේ. මෙහිදී වැදගත් වනුයේ දැනට පාසල් අධ්‍යාපනය ලබන වයසෙහි පසුවන්නන්ට පරිගණක සම්බන්ධයෙන් අවබෝධයක් ලබාදීමයි. ඒ සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරවීම අනාගත පරපුර යම් ඉහළ ස්ථරයකට ගෙන ඒමට සමත්වනු ඇත.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි අධ්‍යාපන මට්ටම සම්බන්ධයෙන් සළකා බැලීමේදී සමීක්ෂණය තුළ ගෘහ මූලිකයන්ගේ අධ්‍යාපන මට්ටම කෙරෙහිද විශේෂ අවධානයක් යොමුවිය. එමගින් ගෘහය මෙහෙයවන පුද්ගලයාගේ අධ්‍යාපන මට්ටම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව පවතී. සමීක්ෂණයෙන් හෙළිවන පරිදි ගම්මානයේ පවුල්වල ගෘහමූලිකයන්ගෙන් සියයට 39 ක ප්‍රමාණයක් ලබා ඇත්තේ ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපනය නැතහොත් වසර 1-5 දක්වා වූ අධ්‍යාපන මට්ටමක් පමණි. සියයට 43 ක් ද්විතීයික අධ්‍යාපනය ලබා ඇත. අ.පො.ස. සා.පෙළ සමත් හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකමක් ලබා ඇත්තේ සියයට 10ක තරම් වූ ප්‍රතිශතයකි. උපාධිධාරීන් සියයට 1 හා උසස් පෙළ සමතුන් සියයට 1 ක් ලෙස ඒ තුළ අන්තර්ගත වේ. ගෘහ මූලිකයන්ගෙන් සියයට 2.9 ක් පාසල් නොගියමුත් ලිවීමේ කියවීමේ හැකියාව සහිත වන අතර සියයට 4.4 ක් සාක්ෂරතාවයෙන් තොර වෙයි.

**2.5 සංඛ්‍යා සටහන**

**ගෘහ මූලිකයාගේ අධ්‍යාපන මට්ටම අනුව පවුල් ව්‍යාප්තිය**

| අධ්‍යාපන මට්ටම | පිරිමි | ගැහැණු | එකතුව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ප්‍රාථමික අධ්‍යාපනය | 71 | 9 | 80 | 39 |
| ද්විතීයික අධ්‍යාපනය | 78 | 11 | 89 | 43.4 |
| අ.පො.ස. සා.පෙළ සමත් | 17 | 0 | 17 | 8.3 |
| උසස් පෙළ සමත් | 2 | 0 | 2 | 1 |
| උපාධිධාරී | 2 | 0 | 2 | 1 |
| පාසල් නොගිය ලිවීමට/කියවීමට හැකි | 3 | 3 | 6 | 2.9 |
| පාසල් නොගිය ලිවීමට/කියවීමට නොහැකි | 8 | 1 | 9 | 4.4 |
| එකතුව | 181 | 24 | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

2.5 සංඛ්‍යා සටහනෙන් පෙන්වන පරිදි කාන්තා ගෘහමූලිකයින් 24 දෙනෙකු නැතහොත් සමීක්ෂණයට ලක්කළ පවුල් අතරින් සියයට 11.7 ක් සිටින අතර ඔවුන්ගේ අධ්‍යාපන මට්ටමෙහි සුවිශේෂත්වයක් කැපී පෙනේ. එනම් ඔවුන් කිසිවකුත් අ.පො.ස. සා.පෙළ සමත් හෝ ඉන් ඉහළ අධ්‍යාපනික සුදුසුකමක් ලබා නොමැත.

බැදිගම්තොට ගම්මානයේ වයස් ව්‍යුහය අනුව අධ්‍යාපන මට්ටම හා සාක්ෂරතාවය සම්බන්ධයෙන් සළකා බැලීමේදී විශේෂිත ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. වයස අවුරුදු 5 සිට 24 දක්වා වූ වයස් කාණ්ඩය තුළ සාක්ෂරතාව සියයට සියය මට්ටමේ පවතී. එමගින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිවර්තනයෙහි යතා ස්වරූපය පෙන්නුම් කරයි.

2.6 සංඛ්‍යා සටහනෙන් පෙන්වන පරිදි වයස් මට්ටම වැඩිවීමත් සමග සාක්ෂරතා මට්ටමෙහි අඩුවීමක් පෙන්නුම් කරයි. එනම් ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පෙන්වයි. මෙමඟින් අනාගතය පිළිබඳ සුභ ලකුණු පෙන්වන අතර ගම්මානයෙහි සාක්ෂරතාව ඉතා ප්‍රශස්ථ මට්ටමකට පැමිණෙනු ඇත.

**2.6 සංඛ්‍යා සටහන**

**වයස් ව්‍යුහය අනුව සාක්ෂරතා අනුපාතය**

| වයස් කාණ්ඩය | සාක්ෂරතා අනුපාතය |
|---|---|
| 25-34 | 98.0 |
| 35-44 | 97.6 |
| 45-54 | 97.0 |
| 55-64 | 94.2 |
| 65-74 | 75.0 |
| 75 ට වැඩි | 81.8 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

වයස් කාණ්ඩ අනුව අධ්‍යාපන මට්ටම පිළිබඳව සැළකීමේදී ද වයස අවුරුදු 65 ත් ඉහළ කාණ්ඩය තුළ අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසකම් ලැබූ කිසිවෙකු වාර්තා නොවේ.

**2.7 සංඛ්‍යා සටහන**

**වයස් ව්‍යුහය හා අධ්‍යාපන මට්ටම අනුව ජන ව්‍යාප්තිය (වයස් කාණ්ඩය තුළ ප්‍රතිශතක ව්‍යාප්තිය)**

| වයස් ව්‍යුහය | ප්‍රාථමික % | ද්විතියික % | පශ්චාත් ද්විතීයික % | පාසල් නොගිය % |
|---|---|---|---|---|
| 10-14 | 22.8 | 77.2 | 0 | 0 |
| 15-24 | 1.9 | 77.6 | 20.5 | 0 |
| 25-34 | 9.7 | 61.3 | 27.1 | 1.9 |
| 35-44 | 27 | 54.8 | 13.5 | 4.8 |
| 45-54 | 41 | 48 | 5 | 6 |
| 55-64 | 44.2 | 36.5 | 9.6 | 9.6 |
| 65-74 | 46.9 | 21.9 | 0 | 31.3 |
| 75 ට වැඩි | 54.6 | 9.1 | 0 | 36.4 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

2.7 සංඛ්‍යා සටහන තුළ අධ්‍යාපන මට්ටම් පුළුල් ලෙස කොටස් හතරකට බෙදා ඇත. 1 වසර සිට 5 දක්වා කාණ්ඩය ප්‍රාථමික අධ්‍යාපනය ලෙසද 6 වසර සිට අ.පො.ස. (සා.පෙළ) දක්වා ද්විතීයික අධ්‍යාපනය හා අ.පො.ස. සා.පෙළ සමත් හා ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලැබුවන් පශ්චාත් ද්විතීයික ලෙසද වර්ග කර ඇත. වයස් කාණ්ඩ අනුව සළකා බැලීමේදී ඉහළ වයස් කාණ්ඩවල පිරිසෙහි පාසල් නොගිය ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්වයි.

වයස අවුරුදු 24ට පහළ වයස් කාණ්ඩය තුළ සියළුම කොටස් විධිමත් අධ්‍යාපනය වෙත යොමුවී ඇති බව සමීක්ෂණය මගින් තහවුරු වී ඇත.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටීම, දේශගුණික ලක්ෂණ, ඓතිහාසික සාධක හා ජනගහනය හා අධ්‍යාපනය යන කරුණු මෙම පරිච්ඡේදය තුළදී සාකච්ජා විය. මීළඟ පරිච්ඡේදය ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම් සම්බන්ධයෙන් සාකච්ජා කිරීමට වෙන්වේ.



21447

පුස්තකාලය
LIBRARY
හෙ.ගො.ප.පු.ආ
HARTI

## තුන්වන පරිච්ඡේදය

# ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම

පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණයට ලක්කළ බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම් සම්බන්ධයෙන් මෙම පරිච්ඡේදය තුළදී විග්‍රහයක යෙදීමට බලාපොරොත්තු වේ. මේ යටතේ ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය, ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වරූපය, ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග, ආදායම් මට්ටම්, දරිද්‍රතාවය, ඉතිරි කිරීම් හා ණයගැතිභාවය යන උප මාතෘකා ඔස්සේ විග්‍රහයන්ට ලක්වේ.

### 3.1 ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය

සේවා නියුක්ත හා සේවා වියුක්ත සියළුදෙනා ශ්‍රම බලකාය යටතට ගැනේ. සේවා නියුක්ත හා සේවා වියුක්ත නොවන සියළුම දෙනා ශ්‍රම බලකායෙන් ඉවත් වූ පිරිස ලෙස සැළකේ. මේ යටතට ශිෂ්‍යයින්, තම නිවසෙහි කටයුතුවල නිරතවන්නන්, ආබාධ හේතුවෙන් වැඩකළ නොහැකි පිරිස්, විශ්‍රාමික හෝ ස්වෙච්ඡාවෙන් රැකියා නොකරන්නන් අන්තර්ගත වේ. ශ්‍රී ලංකාවේ නිර්ණායකයන්ට අනුව ශ්‍රම බලකායෙහි පහළ සීමාව වයස අවුරුදු 10 ලෙස සළකයි. මේ අනුව වයස අවුරුදු 10 ට වැඩි සේවා නියුක්ත හා වියුක්ත පිරිස ශ්‍රම බලකාය ලෙස සළකයි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සළකා බැලීමේදී එහි මුළු ජනගහනයෙන් සියයට 48 ක් ශ්‍රම බලකාය යටතට වැටේ. එනම් ආර්ථිකමය වශයෙන් ක්‍රියාශීලී ජනගහනයයි.

**3.1 සංඛ්‍යා සටහන**

**ශ්‍රම බලකායෙහි සේවා නියුක්තිය/ වියුක්තිය**

| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| සේවා නියුක්ත | 272 | 86.9 | 80 | 59.7 | 352 | 78.7 |
| සේවා වියුක්ත | 41 | 13.1 | 54 | 40.3 | 95 | 21.3 |
| එකතුව | 313 | 100 | 134 | 100 | 447 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.හො.ප.පු.ආ. – 2006

3.1 සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි සමස්ථ සේවා නියුක්තිය ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 78.7 කි. එහි අනෙක් අංශය වන සේවා වියුක්තිය සියයට 21.3 කි. මෙයින් පැහැදිලි වන්නේ මෙම ග්‍රාම නිලධාරී වසමෙහි සේවා වියුක්තිය සාපේක්ෂව බැලූ කල ඉහළ මට්ටමක පවතින බවයි. ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයෙහි සේවා නියුක්තිය සියයට 91.1 ක අගයක් ගනී. ඒ සමඟ සැසඳීමේදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි සේවා නියුක්තිය පහළ මට්ටමක පිහිටයි.

සේවා නියුක්තිය හා සේවා වියුක්තිය ස්ත්‍රී පුරුෂ විෂමතාව අනුව සළකා බැලීමේදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. මෙහි පුරුෂ සේවා නියුක්තිය සියයට 86.9 වන අතර ස්ත්‍රී සේවා නියුක්තිය සියයට 59.7 කි. එනම් ශ්‍රම බලකාය තුළ කාන්තා සේවා වියුක්තිය ස්ත්‍රී ශ්‍රම බලකායට සාපේක්ෂව සියයට 40.3 ක අගයක් ගනී. සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මෙම තත්ත්වය කෙරෙහි අවධානය යොමුකොට සැළසුම් සකස් කිරීම ඉතා වැදගත් වනු ඇත.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ශ්‍රම බලකායෙහි සමස්ථ සේවා වියුක්ත පිරිසෙන් සියයට 43.2 පුරුෂ වන අතර සියයට 56.8 ක් ස්ත්‍රීන් වේ. 3.2 සංඛ්‍යා සටහනින් අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්ත පිරිස බෙදීයන ආකාරය පෙන්වන අතර ඉන් පැහැදිලි වන්නේ සේවා වියුක්ත පිරිසෙන් අති බහුතර පිරිසක් එනම් සියයට 70.5 ක් පමණ ද්විතීයික අධ්‍යාපන මට්ටම එනම් 6 වසර සිට 11 වසර දක්වා අධ්‍යාපනය ලැබුවන් වන බවයි. මේ අතරින් වැඩි පිරිසක් මෑතක පාසල් හැරගිය තරුණ කොටස්ය. සමස්ත සේවා වියුක්ත පිරිසෙන් අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් හෝ ඊට ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලැබූ පිරිස සියයට 23.2 කි. එනම් ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ලැබූ සැළකිය යුතු පිරිසක් සේවා වියුක්ත මට්ටමෙහි පසුවේ. මෙවැනි පිරිස් සඳහා ගම තුළ හෝ ඒ අවට රැකියා අවස්ථාවන් සුලබ නොවීමත් විශේෂයෙන්ම කාන්තා කොටස් නාගරික ප්‍රදේශවල රැකියා අවස්ථා සඳහා පැමිණීමට ඇති මැලිකමත් හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ගම තුළ නිර්මාණය වී තිබේ.

**3.2 සංඛ්‍යා සටහන**

**අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්ත පිරිසෙහි ව්‍යාප්තිය**

| අධ්‍යාපන මට්ටම | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| 1-5 | 3 | 7.3 | 3 | 5.6 | 6 | 6.3 |
| 6-11 | 31 | 75.6 | 36 | 66.7 | 67 | 70.5 |
| සා.පෙළ සමත් | 4 | 9.8 | 9 | 16.7 | 13 | 13.7 |
| උසස් පෙළ සමත් | 3 | 7.3 | 5 | 9.3 | 8 | 8.4 |
| උපාධි අපේක්ෂක | 0 | 0 | 1 | 1.9 | 1 | 1.1 |
| එකතුව | 41 | 100 | 54 | 100 | 95 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. –2006**

ශ්‍රම බලකාය සම්බන්ධයෙන් සලකා බැලීමේදී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය (Labour Force Participation Rate) ඉතා වැදගත් දර්ශකයකි. මෙමගින් වැඩකළ හැකි වයසේ පසුවන ජනගහනයට ශ්‍රම බලකාය දක්වන අනුපාතය කියැවේ. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි මෙම අගය 56.8 කි. ජාතික මට්ටමේ අගය වන 47.6 සමග සැසඳීමේදී සාපේක්ෂව මෙය ඉහළ අගයකි. ස්ත්‍රී පුරුෂ වෙනස්වීමට අනුව සැළකීමේදී පුරුෂ අංශයෙහි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය සියයට 70.7 කි. මෙහි ගැහැනු අංශයෙහි අගය 35.8 කි. සාපේක්ෂව සැළකීමේදී මෙම අගයන් දෙකම ජාතික මට්ටමෙහි අගයන් වන පිරිමි 66.2 හා ගැහැණු 30.9 සමග සැසඳීමේදී ඉහළ අගයක් ගනී. මෙම ප්‍රදේශය ප්‍රධානකොටම කෘෂි කාර්මික කටයුතුමත පදනම්වන අතර ඒ තුළ කාන්තා හා පිරිමි වශයෙන් ඉහළ සේවා නියුක්තියක් දක්වයි. නමුත් එය පූර්ණ සේවා නියුක්තියක්ද ඌණ සේවා නියුක්තියක්ද යන්න සම්බන්ධයෙන් විමසා බැලිය යුතුය.

ශ්‍රම බලකාය සම්බන්ධයෙන් විමසා බැලීමේදී ඒ තුළ අන්තර්ගත පුද්ගලයින් තුළ ඇති විශේෂ කුසලතා හා ලබා ඇති විශේෂ පුහුණුවීම් සම්බන්ධයෙන් අවධානය යොමු විය. මෙහිදී විශේෂ කුසලතාවයක් ලෙස ඔවුන් සතු සහජ දක්ෂතාවයන් කෙරෙහි අවධානය යොමු කළ අතර පුහුණුවීම් යටතේ විධිමත් ආයතනයක් මගින් ලබාගන්නා ලද පුහුණුවීම් හෝ එම අංශයෙහි විශේෂඥයකු යටතේ ලැබූ පුහුණුවීම් කෙරෙහි අවධානය යොමු විය.

ශ්‍රම බලකායට සාපේක්ෂව සහජ දක්ෂතාවන් සහිත පුද්ගලයින්ගේ ප්‍රතිශතක අගය ඉතා පහළ මට්ටමක පිහිටයි. ඉන් වැඩිම අගයක් වාර්තා වනුයේ චිත්‍ර/කැටයම් වැනි කලා කටයුතු සඳහා විශේෂ කුසලතාවයක් සහිත පුද්ගලයින් වන අතර එය ශ්‍රම බලකාය තුළ සියයට 1.8 ක ප්‍රතිශතයක් නියෝජනය කරයි. මෙයට අමතරව විදුලි කාර්මික අංශයෙහි විශේෂ කුසලතාවක් ඇති පිරිස ශ්‍රම බලකාය තුළ 0.9 ක ප්‍රතිශයක් නියෝජනය වන අතර ඇඳුම් හා අත්කම් අංශයෙන් හා සංගීතය යන අංශයන්ගෙන් එයට සමානවූ ප්‍රතිශතක නියෝජනයක් ශ්‍රම බලකාය තුළ දරයි. මේ අනුව පැහැදිලි වනුයේ බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ විශේෂ කුසලතා ඇති සමස්ත පිරිස ශ්‍රම බලකාය තුළ සියයට 5කට ආසන්න නියෝජනයක් දරන බවයි.

3.3 සංඛ්‍යා සටහන

**විශේෂ පුහුණුවීම් ලබාඇති පිරිස ශ්‍රම බලකාය තුළ දක්වන දායකත්වය**

| ලබාඇති විශේෂ පුහුණුව | සංඛ්‍යාව | ශ්‍රම බලකාය තුළ ප්‍රතිශතය |
|---|---|---|
| මැහුම්/අත්කම් (සාමාන්‍ය) | 15 | 3.4 |
| ජුකි මැෂින් පුහුණුව | 10 | 2.2 |
| වඩු කර්මාන්තය | 8 | 1.8 |
| පරිගණක පුහුණුව | 13 | 2.9 |
| රියදුරු | 22 | 4.9 |
| පෙදරේරු | 13 | 2.9 |
| විදුලි කාර්මික | 11 | 2.5 |
| කුඩා ව්‍යාපාර සංවර්ධන | 2 | 0.5 |
| වෙනත් | 3 | 0.7 |
| එකතුව | 97 | 41.8 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006

3.3 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි ශ්‍රම බලකායෙන් සියයට 41.8 ක් කුමන හෝ අංශයක විශේෂ පුහුණුවක් ලබා තිබේ. ඉන් වැඩි පිරිසක් රියදුරු පුහුණුව ලබා ඇත. ඊට අමතරව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් මෙහෙයවන විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ඇත.

ගම්මානයේ ජනතාව තම වෘත්තීය අවශ්‍යතා වෙනුවෙන් තවදුරටත් අවශ්‍ය වන පුහුණුවීම් කවරේද යන්න පිළිබඳවද සමීක්ෂණය තුළදී අවධානය යොමුකළ අතර ඒ පිළිබඳ පැහැදිලි විස්තරයක් 3.4 සංඛ්‍යා සටහන මගින් දැක්වේ. පුහුණුවීම් අවශ්‍ය බවට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 35.8 ක් පරිගණක ආශ්‍රිත පුහුණුවීම් අවශ්‍ය බව පෙන්වාදුනි. විශේෂයෙන්ම මෑතකදී පාසල් අධ්‍යාපනය හමාර කළ තරුණ කොටස් මේ කෙරෙහි වැඩි ආකර්ශණයක්

දක්වයි. ඊට අමතරව ප්‍රතිචාරීන්ගෙන් සියයට 22.4 ක් මැහුම් පාඨමාලාවල අවශ්‍යතාව අවධාරණය කර ඇත. මේ කෙරෙහි තරුණ කාන්තා පිරිස් වැඩි රුචිකත්වයක් දක්වන අතර ස්වයං රැකියාවන් වශයෙන් මැහුම් කර්මාන්තයේ නියැලීම මොවුන්ගේ බලාපොරොත්තුවයි.

3.4 සංඛ්‍යා සටහන

**ලබාගැනීමට අපේක්ෂා කරන පුහුණුවීම්**

| පුහුණුව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| මැහුම් | 15 | 22.4 |
| පරිගණක | 24 | 35.8 |
| වඩු කර්මාන්තය | 9 | 13.4 |
| පෙදරේරු | 4 | 6.0 |
| රියදුරු | 3 | 4.5 |
| විදුලි කාර්මික | 7 | 10.4 |
| ස්වයං රැකියා | 3 | 4.5 |
| සංගීතය | 2 | 3.0 |
| **එකතුව** | 67 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

## 3.2 ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ආර්ථික කටයුතු මූලික ලෙසම කෘෂිකර්මය මත පදනම් වේ. මේ යටතේ වී ගොවිතැන, බහුවාර්ෂික භෝග හා එළවළු වගාවන් ප්‍රමුඛ වෙයි. 3.5 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි ගම්මානයේ සේවා නියුක්ත පිරිසෙන් සියයට 51 ක් පමණ ප්‍රධාන රැකියාව ලෙස කෘෂිකර්මය මත පදනම් වේ. ගොවි කාරක, ගොවිපළ සහායක, සත්ත්ව පාලනය හා කෘෂි කම්කරු යන අංශ සියල්ල එක්ව ගත් කළ එම අගය සියයට 65 දක්වා ඉහළ යයි. එනම් මෙම අංශ සියල්ල සෘජුව කෘෂිකර්මාන්තයට සම්බන්ධ වේ. මෙයින් ඉතා පැහැදිලි වනුයේ ගම්මානයේ බහුතරයක් ප්‍රධාන ලෙසම කෘෂිකර්මය මත පදනම් වන බවයි. අනෙක් අතින් මෙම ගම්මානය සාම්ප්‍රදායිකව කෘෂිකර්මය මත පදනම් වී ඇත. එමෙන්ම මහවැලි ව්‍යාපාරය යටතේ ඉඩම් ලබාදීම මගින්ද මූලික ලෙසම බලාපොරොත්තු වී ඇත්තේ කෘෂිකාර්මික අංශයෙහි නවෝදයකි. මේ හේතුවෙන් ප්‍රධාන ආර්ථික මාර්ගය කෘෂිකර්මය මත පදනම් වී ඇත.

මීට අමතරව නූතන පරම්පාරව පෞද්ගලික අංශයෙහි විවිධ රැකියාවන් කෙරෙහි නැඹුරුවීමක් දක්වයි. එවැනි රැකියා පෞද්ගලික අංශයෙහි සුළු රැකියාවන් වන අතර, විධායක මට්ටමේ රැකියාවන්හි නිරත පිරිස් ගම තුළ නොමැත.

3.5 සංඛ්‍යා සටහන

සේවා නියුක්තිය - බැදිගම්තොට

| රැකියාව | සංඛ්‍යාව | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | | |
| ගොවි කාරක | 175 | 4 | 179 | 50.9 |
| ගොවිපළ සහායක | 4 | 6 | 10 | 2.8 |
| සත්ත්ව පාලනය | 4 | 0 | 4 | 1.1 |
| කෘෂි කම්කරු | 17 | 20 | 37 | 10.5 |
| කෘෂි නොවන කම්කරු | 13 | 1 | 14 | 4.0 |
| රජයේ රැකියා | 12 | 7 | 19 | 5.4 |
| ආරක්ෂක අංශ | 2 | 1 | 3 | 0.9 |
| පෞද්ගලික අංශ | 29 | 36 | 65 | 18.5 |
| ස්වයං රැකියා | 6 | 5 | 11 | 3.1 |
| ශිල්පීය රැකියා | 8 | 0 | 8 | 2.3 |
| ව්‍යාපාරික | 1 | 0 | 1 | 0.3 |
| විදේශ රැකියා | 1 | 0 | 1 | 0.3 |
| එකතුව | 272 | 80 | 352 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006

### 3.3 ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය

ශ්‍රම බලකාය තුළ සේවා නියුක්ත පිරිසෙන් කෙතරම් ප්‍රතිශයක් ප්‍රධාන හා ද්විතීයික රැකියාවන්හි නිරත වන්නේද යන්න හා විවිධ රැකියාවන් සේවා නියුක්ත පිරිස අතර කෙතරම් ප්‍රතිශයක් නියෝජනය කරන්නේද යන්න මෙම කොටස තුළදී අවධානය යොමු විය. පෙර සඳහන් කළ පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ශ්‍රම බලකායෙන් සියයට 78.7 ක් සේවා නියුක්ත වන අතර ඔවුන්ගෙන් සියයට 27 ක් ප්‍රධාන රැකියාවට අමතරව ද්විතීයික රැකියාවන්හිද නිරත වෙයි. 3-5 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි බැදිගම්තොට ගම්මානයේ සේවා නියුක්ත පිරිසෙන් 51% පමණ ප්‍රධාන රැකියාව ලෙස කෘෂිකාර්මික කටයුතු තෝරාගෙන තිබේ. මෙහිදී ගොවිකාරක ලෙස ඔවුන් අර්ථ දක්වා ඇති අතර එයින් අදහස් වනුයේ කෘෂිකර්මය සම්බන්ධ තීරණ ගන්නා ප්‍රධාන පුද්ගලයා යන්නයි. බැදිගම්තොට ගම්මානයේ ස්වරූපය අනුව බොහෝවිට පවුලේ සියළුදෙනාම කෘෂිකාර්මික කටයුතුවලදී සහයෝගය දැක්වීම කැපී පෙනේ. කෘෂිකාර්මික අංශයෙන් පරිබාහිරව වැඩිම පිරිසක් පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වෙයි. එය සේවා නියුක්ත පිරිසෙන් සියයට 18.5 කි. රජයේ ආරක්ෂක අංශවල හා විදේශීය රැකියා නියුක්තිය සැළකිය යුතු මට්ටමක නොමැති අතර එය පිළිවෙලින් සියයට 0.9 හා 0.3 ලෙස සමස්ථ සේවා නියුක්ත පිරිස තුළ නියෝජනයක් දක්වයි. විශේෂයෙන්ම ආරක්ෂක අංශ වෙත යොමුවීමෙහි ඉහළ ප්‍රවනතාවයක් ගම්මානය තුළින් වාර්තාගත නොවූ අතර ගෘහ සේවිකාවන් ලෙස විදේශගතවීම් කෙරෙහිද ගම්මානයේ කාන්තාවන් අතර ඉහළ නැඹුරුවක් නොමැත. මෙය මෙම අංශයන්හි සේවා නියුක්තිය අඩු මට්ටමෙහි පිහිටීමට සෘජු ලෙස හේතු වී ඇත.

සේවා නියුක්ත පිරිසෙහි ද්විතියික රැකියා පිළිබඳ තොරතුරු 3.6 සංඛ්‍යා සටහනෙහි දැක්වෙන අතර ප්‍රධාන රැකියාවට අමතරව ද්විතීයික රැකියාවක නියැලෙන්නන්ගෙන් වැඩි පිරිසක් නියෝජනය වන්නේ කෘෂි කම්කරු අංශය තුළිනි. එය සියයට 42 ක පමණ ප්‍රතිශතයකි. කෘෂිකර්මය ප්‍රධාන රැකියාව ලෙස තෝරාගත් පිරිස් බොහෝවිට කෘෂි කම්කරුවන් වශයෙන් වෙනත් ගොවීන්ගේ කෘෂිකාර්මික කටයුතුවල යෙදේ. මෙය මෙම අගය ඉහළ යාමට හේතුවී තිබේ. ඊට අමතරව ගොවිකාරක අංශයෙහි ද්විතීයික රැකියාවන්හි ප්‍රතිශතය සියයට 19 පමණ වන අතර රජයේ හා පෞද්ගලික අංශයන්හි ප්‍රධන රැකියාව ලෙස නිරත වන්නන් බොහෝවිට කෘෂිකාර්මික කටයුතුවල ද නිරත වේ. බොහෝවිට මෙය තමන් සතු කුඹුරු ඉඩම හෝ ගෙවත්ත තුළ සිදුවන කෘෂිකාර්මික කටයුතු වේ.

### 3.6 සංඛ්‍යා සටහන

**ද්විතීයික රැකියාවන්හි නියුක්තිය - බැදිගම්තොට**

| රැකියාව | පුරුෂ | ස්ත්‍රී | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| ගොවි කාරක | 15 | 3 | 18 | 18.75 |
| ගොවිපළ සහායක | 7 | 8 | 18 | 15.62 |
| සත්ත්ව පාලනය | 4 | 0 | 4 | 4.16 |
| කෘෂි කම්කරු | 34 | 6 | 40 | 41.66 |
| කෘෂි නොවන කම්කරු | 1 | 0 | 1 | 1.04 |
| රාජ්‍ය අංශය | 1 | 0 | 1 | 1.04 |
| පෞද්ගලික අංශය | 8 | 0 | 8 | 8.33 |
| ස්වයං රැකියා | 4 | 0 | 4 | 4.16 |
| ශිල්පීය රැකියා | 1 | 0 | 1 | 1.04 |
| දීවර කර්මාන්තය | | | | |
| එකතුව | 79 | 17 | 96 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

මූලික සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී වැටුප් ලබන රැකියාවන්හි යථා ස්වරූපය පිළිබඳව ද විශේෂ අවධානය යොමු විය. එය ස්ථිර, තාවකාලික හා අනියම් යන පදනම මත විග්‍රහයකට ලක්විය. සමීක්ෂණයෙන් හෙළිවූ තොරතුරුවලට අනුව බැදිගම්තොට ගම්මානයේ වැටුප් ලබන රැකියාවන්හි නිරතවූවන්ගෙන් ස්ථිර රැකියා හිමි ප්‍රතිශතය සියයට 9.5 කි. මොවුන් රාජ්‍ය අංශයෙහි හා ආරක්ෂක අංශයන්හි සේවා නියුක්තිකයින්ගෙන් සමන්විත වෙයි. වැඩිම ප්‍රතිශතයක් නියෝජනය වනුයේ තාවකාලික පදනමෙහි සේවා නියුක්තිකයන්ගෙන් වන අතර එය සියයට 62.1 කි. ඉතිරි සියයට 28.4 අනියම් පදනමින් සේවා නියුක්ත වී සිටී. මෙයින් පැහැදිලි වනුයේ ගම්මානයේ වැටුප් ලබන රැකියාවල නිරතවන්නන්ගෙන් සියයට 90 ක් පමණ අනියම් හා තාවකාලික පදනමින් සේවා නියුක්ත වන බවයි. විශේෂයෙන්ම මේ තුළ පෞද්ගලික අංශයේ රැකියා, කෘෂි හා කෘෂි නොවන කම්කරු හා ශිල්පීය රැකියා නියෝජනය වෙයි. මොවුන්ගේ රැකියාවන්හි ස්ථිර බවක් නොමැති අතර කෘෂි හා කෘෂි නොවන අංශයන්හි කම්කරුවන්ගේ තත්ත්වය වඩාත් අවදානම් සහගත වෙයි. බොහෝ විට කෘෂි කම්කරුවන් තුළ කාලීන සේවා නියුක්තියක් දක්නට ලැබෙන අතර වගා කටයුතු නොමැති කාලයන් තුළ කෘෂි නොවන අංශයට මාරු වීමක්ද

දක්වයි. අනෙක් අතින් මොවුන් දෛනික වැටුප් පදනම මත කටයුතු කරනු ලබන අතර මෙකී අවිනිශ්චිතතාවයන් ගම්මානයේ දරිද්‍රතාවයටද බලපෑමක් ඇති කරයි.

වැටුප් ලබන රැකියාවලට අමතරව ස්වයං රැකියා සම්බන්ධයෙන්ද සමීක්ෂණය තුළදී විශේෂ අවධානය යොමු වූ අතර සමීක්ෂණයට ලක්කළ පවුල් අතරින් පුද්ගලයින් 21 දෙනෙකු විවිධ ස්වයං රැකියාවන්හි නිරතවන බවට වාර්තාවිය. එය ශ්‍රම බලකාය තුළ සියයට 5 ක පමණ නියෝජනයක් දක්වයි. ස්වයං රැකියාවන්හි නිරතවන්නන්ගෙන් සියයට 57 ක් පමණ සුළු ව්‍යාපාර හා වෙළඳ අංශයෙහි නිරත වෙයි. මේ අතර සුළු පරිමාණ සිල්ලර කඩ කැපී පෙනෙයි. තවත් සියයට 19 පමණ ත්‍රී රෝද රථ ආශ්‍රයෙන් ආදායම් උපයා ගන්නා අතර තවත් සියයට 14 ක් ඇඳුම් මැසීම තුළ නිරත වෙයි. ඉතිරි සියයට 10 ගඩොල් කර්මාන්තය ස්වයං රැකියාව ලෙස තෝරාගෙන තිබේ. ස්වයං රැකියාවන් සම්බන්ධයෙන් සැළකීමේදී ගම්මානයෙන් ලබාගත හැකි සම්පත්වලට සාපේක්ෂව ඒවායෙහි නිරත වන්නන්ගේ ප්‍රතිශතය පහළ මට්ටමක පවතී. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර සංවර්ධන ක්‍රමෝපායන් එකී දිශාවන් වෙත යොමු කරවීම වැදගත් වනු ඇත.

මාසික සාමාන්‍ය ආදායම් මට්ටම අනුව ස්වයං රැකියා වර්ග කිරීමේදී කැපී පෙනෙන සුවිශේෂත්වය වනුයේ ස්වයං රැකියාවල නිරතවන්නන්ගෙන් සියයට 67 ක් පමණ රුපියල් පන්දහසකට අඩු මාසික සාමාන්‍ය ආදායමක් ලබන බවයි. ස්වයං රැකියාව ලෙස නිරතවන්න්ගේ මාසික සාමාන්‍ය ආදායම රු. 2500.00 නොඉක්මවයි. ඔවුන්ගෙන් සියයට 66 පමණ රු. 1000 ට අඩු මාසික සාමාන්‍ය ආදායමක් උපයයි. මොවුන් මෙය ව්‍යාපාරික මට්ටමෙන් සිදු කෙරෙන අතර ගම්මානයේම වෙනත් අයගේ ඇඳුම් මසාදීම තුළින් ආදායම් උපයන බව පෙනීයයි. ත්‍රීරෝද රථ කුළී සේවාවන්හි නිරතවන්න්ගේ ආදායම් මට්ටමද මාසික සාමාන්‍ය අගය රුපියල් 5000.00 නොඉක්මවයි. වෙළඳාම තුළ නිරතවන්නන්ගෙන් සියයට 58 ක් පමණ රු. 5000 ට අඩු මාසික සාමාන්‍ය ආදායමක් උපයයි. මේ තුළට සුළු පරිමාණ සිල්ලර කඩ හිමියන් ඇතුලත් වන අතර බොහෝවිට ඔවුන්ගේ සාමාන්‍ය මාසික ආදායම රුපියල් දෙදහස් පන්සියය නොඉක්මවයි. ස්වයං රැකියාවන්හි නිරතවන්නන්ගෙන් සියයට 20 පමණ රු. 10,000.00 ඉක්මවූ මාසික ආදායමක් උපයන අතර ඔවුන් අතරින් සියයට 50 පමණ නියෝජනය වන්නේ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නියැලෙන්නන්ය.

දැනටමත් ස්වයං රැකියාවන්හි නිරතවන්නන් සඳහා කිසියම් ආයතනයකින් සහයෝගයක් බලාපොරොත්තු වන්නේද යන්න සම්බන්ධයෙන් සමීක්ෂණය තුළදී අවධානය යොමු විය. මේ අනුව ස්වයං රැකියාවල නිරතවන්නන්ගෙන් සියයට 72 ක් සඳහා විවිධාකාරයේ සහයෝගයන් අවශ්‍ය බව හෙළිවිය. සියයට 14 කට කිසිදු සහයෝගයක් අවශ්‍ය නොවන බව පැවසූ අතර ඉතිරි සියයට 14 ප්‍රතිචාර නොදක්වා ඇත. මේ අනුව පැහැදිලි වනුයේ ස්වයං රැකියාවන්හි නිරතවන අති බහුතරය එය වඩාත් දියුණු කරගැනීම සඳහා විවිධාකාර සහයෝගයන් බලාපොරොත්තුවන බවයි. මේ අතරින් සියයට 87 කගේම අපේක්ෂාව ඒ සඳහා යම් මූල්‍ය ආධාරයක් ලබාගැනීමයි. ප්‍රතිචාරීන්ගෙන් සියයට 33 ක් පුහුණු අවශ්‍යතා හා නවීන උපකරණවල අවශ්‍යතාවය අවධාරණය කරයි. ස්වයං රැකියාවන්හි යෝග්‍යතාවය හා තිරසාර බව පිළිබඳව අවධානය යොමුකොට අවශ්‍ය පහසුකම් සකසාදීම ඉදිරි සංවර්ධන ක්‍රියා මාර්ගයන්හිදී ඉතා වැදගත් වනු ඇත.

### 3.4 ආදායම

ආදායම යනු සමාජ ආර්ථික සමීක්ෂණයන්හිදී ඉතාමත්ම සංවේදී මාතෘකාවකි. ඒ පිළිබඳ ඉතා නිවැරදි දත්ත ලබාගැනීම ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල ඉතාමත්ම අපහසු කාර්යකි. සාපේක්ෂව පහළ ආදායම් ලබන්නන් මෙන්ම ඉහළ ආදායම් ලබන්නන්ද තම ආදායම නිවැරදිව ප්‍රකාශ කිරීමට මැලිකමක් දක්වයි. පහළ ආදායම් ලබන කොටස් තමන්ට දැනටමත් ලබන සහනාධාර හා රජය මඟින් ලබාදෙනු ලබන වෙනත් දීමනා අහිමිවේ යැයි බියවන අතර ඉහළ ආදායම් ලබන්නන් ආදායම් බදු හෝ වෙනත් බදු වර්ග සඳහා යටත් වේ යැයි යන බිය හේතුවෙන් තමන් ලබන ආදායම නිතරම අඩුවෙන් ප්‍රකාශ කිරීමට පෙළඹේ. මෙය එක් අතකින් සංවර්ධන ප්‍රතිපත්ති සැකසීමේදී ගැටළුවක් වන අතර අනෙක් අතින් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග නිවැරදි දිශාවන්ට යොමු කිරීම මෙන්ම සමාජයේ ප්‍රතිලාභ ලැබිය යුතු පිරිස් නිවැරදිව හඳුනා ගැනීමද දුෂ්කර කරවන්නකි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ ක්‍රියාත්මක කළ පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී කුටුම්භ ආදායම කෙරෙහි විවිධ මානයන්ගෙන් අවධානය යොමු කළ අතර ආදායම් උත්පාදක මාර්ගයන් මඟින් පවුලේ ආදායමට කරනු ලබන බලපෑම කෙරෙහි විශේෂ අවධානය යොමු විය. එය වැටුප් ලබන රැකියා හා වෙනත් ආදායම් මාර්ග වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි අතර වෙනත් ආදායම් අතරට කෘෂිකාර්මික කටයුතු තුළින් ලබන ආදායම් ප්‍රධාන ලෙස අයත් වෙයි. 3.7 සංඛ්‍යා සටහන වැටුප් ලබන රැකියාවන්හි ස්වරූපය අනුව සාමාන්‍ය මාසික ආදායම දැක්වේ. ඉන් පැහැදිලි වන පරිදි කෘෂි කම්කරු අංශයෙහි රැකියාවන්හි නිරත වැඩි පිරිසක් නැතහොත් සියයට 51 පමණ පිරිසක් සාමාන්‍ය මාසික ආදායම රුපියල් 2500.00 ට අඩුවෙන් ලබයි. කෘෂි කම්කරු අංශයන්හි කාලීන සේවා නියුක්තියක් දක්නට ලැබෙන අතර වගා කටයුතු ආරම්භක කාලය හා අස්වනු නෙලන කාලය තුළ සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතී. මේ හේතුවෙන් සාමාන්‍ය මාසික ආදායම පහළ අගයක් ගෙන තිබේ. අනෙක් අතින් මෙය අනියම් පදනමින් ක්‍රියාත්මක වන බැවින් මාසයක වැඩ කරන සාමාන්‍ය දින ගණනද පහළ මට්ටමක පිහිටයි. කෘෂි කම්කරු අංශයෙහි නිරතවූවන්ගෙන් සියයට 9 පමණ මාසික සාමාන්‍ය ආදායම රුපියල් දහසට අඩුවෙන් ලබන අතර ඔවුන්ගේ සාමාන්‍ය මාසික වැඩ කළ දින ගණන දින පහකට අඩුවෙන් පිහිටයි. මෙය මෙවැනි පහළ ආදායම් මට්ටමකට හේතුවී තිබේ. කෘෂි නොවන කම්කරු අංශයේ ආදායම් මට්ටම කෘෂි කම්කරු අංශයට වඩා ඉහළ මට්ටමක් ගන්නා අතර ඉන් සියයට 56 පමණ මාසික සාමාන්‍ය ආදායම රු. 5000.00 ඉක්මවයි. රාජ්‍ය අංශය තුළ හා ආරක්ෂක සේවාවන්හි නිරතවන්නන්ගේ සාමාන්‍ය වාර්ෂික ආදායම පිළිබඳ ගැටළුවක් නොවන අතර සමීක්ෂණයට ලක් කරන ලද අවස්ථාව වන විට සියල්ලන්ම රු. 5000.00 සීමාව ඉක්මවා තිබුණි. 2006 අය වැය යෝජනාවලට අනුව රාජ්‍ය අංශයේ සෑම සේවකයෙකුගේම අවම මාසික ආදායම රු. 11,000.00 ඉක්මවා යන පරිදි ගැලපීම් කළ හෙයින් මෙම තත්ත්වයන් වෙනස්වීමට ලක්වනු ඇත. පෞද්ගලික අංශයෙහි නිරත පිරිසෙන් සියයට 89 පමණ මාසික සාමාන්‍ය ආදායම රු. 2500 හා රු. 7500 අතර පරාසයක පිහිටයි. එම අංශයෙහි රුපියල් 10,000 ඉක්මවූ පිරිස් වාර්තා වනුයේ සියයට 4.5 පමණ ප්‍රතිශතයකි. රුපියල් 20,000 ඉක්මවූ මාසික සාමාන්‍ය ආදායමක් ලබන්නවුන් සමීක්ෂණයට ලක්කළ සමස්ත වැටුප් ලබන රැකියාවල නිරතවන්නන්ගෙන්ම සියයට 01 පමණ ප්‍රතිශතයක් වාර්තා වෙයි. මේ අනුව ඉතා පැහැදිලි වනුයේ ඉහළ සාමාන්‍ය මාසික ආදායම් ලබන පිරිස් සාපේක්ෂව සළකා බැලීමේදී ගම්මානය තුළ ඉතා අඩු අගයක් ගන්නා බවයි.

3.7 සංඛ්‍යා සටහන

**සාමන්‍ය මාසික ආදායම අනුව වැටුප් ලබන රැකියාවල නිරතවන්නන්ගේ ව්‍යාප්තිය**

| සාමාන්‍ය මාසික ආදායම | කෘෂි කම්කරු | කෘෂි නොවන කම්කරු | රාජ්‍ය අංශය | ආරක්ෂක අංශය | පෞද්ගලික අංශය | ශිල්පීය රැකියා | විදේශ රැකියා | එකතුව | % |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1000 ට අඩු | 8 | - | - | - | - | - | - | 8 | 4 |
| 1000<=2500 | 35 | 4 | - | - | - | 4 | - | 43 | 20 |
| 2500<=5000 | 33 | 3 | - | - | 31 | 2 | - | 69 | 33 |
| 5000<=7500 | 8 | 2 | 8 | - | 28 | 3 | - | 49 | 23 |
| 7500<=10000 | 1 | 7 | 3 | - | 4 | 1 | - | 16 | 8 |
| 10000<=15000 | - | - | 6 | 4 | 2 | 5 | 2 | 19 | 9 |
| 15000<=20000 | - | - | 3 | 1 | 1 | - | - | 5 | 2 |
| 20000 ට වැඩි | - | - | - | 1 | - | - | 1 | 2 | 1 |
| | 85 | 16 | 20 | 6 | 66 | 15 | 3 | 211 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය- හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

පවුල් ඒකකයක් තුළ සිටින වැටුප් ලබන රැකියාවන්හි නිරතවන්නන්ගෙන් ලබන ආදායමට අමතරව වෙනත් මාර්ගවලින් ලබන ආදායම්ද ඉතා වැදගත්කමක් දරයි. සමාජ ආර්ථික සමීක්ෂණයක් තුළදී තනි පුද්ගලයින් ලබන ආදායමට වඩා පවුල් ඒකකයක් ලබන ආදායම ඉතා වැදගත් වේ. ඒ තුළින් පවුල් ඒකකයේ යථා ස්වරූපය හඳුනාගත හැකි අතර ප්‍රතිපත්ති සම්පාදනයේදී එය ඉතා වැදගත් වේ.

3.8 සංඛ්‍යා සටහන දළ මාසික ආදායම අනුව පවුල් ව්‍යාප්තිය පෙන්නුම් කෙරේ. ඉන් පැහැදිලිවන පරිදි බැදිගම්තොට ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 16.6 ක් දළ මාසික සාමාන්‍ය ආදායම රුපියල් 3000 ට අඩුවෙන් ලබයි. මෙහිදී දළ ආදායම් යන්න ගණනය කර ඇති අතර කෘෂිකාර්මික නිෂ්පාදනවලදී එහි බලපෑමක් ඇතිවන අතර ඒ සඳහා යෙදු පිරිවැයද ආදායම තුළ අන්තර්ගත වේ. මේ අනුව ශුද්ධ ආදායම මෙයට වඩා වෙනස්විය හැකිය. සාපේක්ෂව ඉහළ ආදායම් ලෙස සැළකිය හැකි රුපියල් 25,000 ට වැඩි සාමාන්‍ය දළ මාසික ආදායම ලබන පිරිස සියට 6 ක් පමණ වේ. සමීක්ෂණයට ලක් කළ පවුල් අතරින් සියයට 30 ක් පමණ රු. 5000 හා රු. 10,000 අතර කාණ්ඩයට අයත් වේ. 3.8 සංඛ්‍යා සටහනට අනුව ඉතා පැහැදිලි වනුයේ ගම්මානයෙන් සියයට 60 ක් පමණ දළ මාසික ආදායම රු. 3000 හා 15,000 අතර පිහිටන බවයි. එනම් සාපේක්ෂව මධ්‍යම ආදායම් කාණ්ඩය අයත් වේ.

3.8 සංඛ්‍යා සටහන

**දළ මාසික සාමාන්‍ය ආදායම අනුව පවුල් ව්‍යාප්තිය**

| ආදායම | පවුල් ගණන | % |
|---|---|---|
| 1000 ට අඩු | 3 | 1.5 |
| 1000<-<3000 | 31 | 15.1 |
| 3000<-5000 | 31 | 15.1 |
| 5000<-10000 | 63 | 30.7 |
| 10000<-15000 | 32 | 15.6 |
| 15000<-25000 | 33 | 16.1 |
| 25000<-50000 | 11 | 5.4 |
| 50000 ට වැඩි | 1 | 0.5 |
| එකතුව | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

ආදායම සම්බන්ධයෙන් සැළකීමේදී වාර්ෂික ආදායමෙහි සංයුතිය නැතහොත් කුටුම්භයකට ලැබෙන විවිධ ආදායම් මාර්ගද ඉතා වැදගත් වේ. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සැළකිමේදී වාර්ෂික ආදායමට වැඩිම දායකත්වයක් දක්වන්නේ කෘෂි කර්මාන්තයයි. එය සියයට 50.5 පමණ ප්‍රතිශතයකි. මේ තුල වී හා වෙනත් බෝග නිෂ්පාදනයෙන් ලබන ආදායම, සත්ත්ව පාලනය යන අංශ අයත් වේ. මේ තුළින් ඉතාමත් පැහැදිලි වනුයේ කෘෂි කර්මාන්තය යනු බැදිගම්තොට ගම්මානයේ ප්‍රධානතම ජීවනෝපාය වන බවයි.

අංක 3.9 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි වී වගාව මගින් පමණක් වාර්ෂික ආදායමට සියයට 20.2 ක දායකත්වයක් සපයයි. සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි ගම්මානයේ පවුල් සියයට 57 පමණ වී වගාවෙහි නිරත වෙයි. සාපේක්ෂ වශයෙන් වාර්ෂික ආදායම තුළ වැඩිම ප්‍රතිශතක අගය නියෝජනය වන්නේ කෙසෙල් ඇතුළු වෙනත් වගාවන්ගෙන් ලබන ආදායමයි. එය සියයට 20.6 කි. බැදිගම්තොට ප්‍රදේශය කෙසෙල් වගාව කෙරෙහි සුවිශේෂත්වයක් දරන අතර සමහර කුඹුරු ඉඩම්ද කෙසෙල් වගාව වෙත පරිවර්තනය වීමක් දක්නට ලැබේ. මේ හේතුවෙන් වාර්ෂික ආදායම් සංයුතිය තුළ මේ සඳහා සුවිශේෂත්වයක් හිමි වී තිබේ. කෘෂිකාර්මික අංශය තුළ එළවළු වගාව තුළින් ලබන ආදායමද සැළකිය යුතු මට්ටමක පවතින අතර එමගින් වාර්ෂික ආදායමට සියයට 6.9 ක දායකත්වයක් සපයයි. වැවිළි භෝග වගාවන් ලෙස ප්‍රදේශයෙන් හඳුනාගත හැක්කේ පොල් වගාව පමණක් වන අතර ඉන් සියයට 1.3 පමණ දායකත්වයක් වාර්ෂික ආදායමට එක් කරයි.

වැටුප් ලබන රැකියා වශයෙන් සැළකෙන රජයේ රැකියා, පෞද්ගලික අංශයේ රැකියා, කම්කරු රැකියා හා ශිල්පීය රැකියා හා විදේශ රැකියා මගින් සියයට 40 ක පමණ දායකත්වයක් වාර්ෂික ආදායමට එක් කරයි. සාපේක්ෂ වශයෙන් මෙයින් වැඩි ප්‍රමාණය නියෝජනය වන්නේ පුද්ගලික අංශයේ රැකියාවලින් වන අතර එමගින් සියයට 14.9 ක් වාර්ෂික ආදායමට එක් කරයි.

කම්කරු අංශය මගින් සියයට 6.4 ක දායකත්වයක් වාර්ෂික ආදායමට දක්වන අතර එහි කාලීන සේවා නියුක්තියක් දක්වයි.

### 3.9 සංඛ්‍යා සටහන

**දළ වාර්ෂික ආදායමට විවිධ ආදායම් උත්පාදක මාර්ගවලින් දක්වන දායකත්වය**

| ආදායම් මාර්ගය | මුළු වාර්ෂික ආදායමෙහි ප්‍රතිශතය | |
|---|---|---|
| 1. කෘෂිකාර්මික අංශය | | 50.5 |
| වී නිෂ්පාදනය | 20.2 | |
| අතිරේක භෝග | 0.4 | |
| වැවිලි භෝග | 1.3 | |
| වෙනත් භෝග | 20.6 | |
| සත්ත්ව පාලනය | 1.1 | |
| එළවළු | 6.9 | |
| 2. වැටුප් ලබන රැකියා | | 39.6 |
| රජයේ රැකියා | 10.1 | |
| පෞද්ගලික අංශයේ | 14.9 | |
| කෘෂි කම්කරු | 6.4 | |
| කෘෂි නොවන කම්කරු | 2.6 | |
| විදේශ රැකියා | 2.7 | |
| ශිල්පීය රැකියා | 2.9 | |
| 3. ස්වයං රැකියා | | 4.4 |
| 4. රජයේ/පෞද්ගලික ලැබීම් | | 4.3 |
| 5. කෘෂි/වෙනත් උපකරණ කුලියට දීම් | | 1.2 |
| එකතුව | | 100 |

### 3.5 දරිද්‍රතාව

සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී දරිද්‍රතාව යන සංකල්පය කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලබන අතර ඒ තුළින් සමාජයේ විවිධ අංශ පිළිබඳවද අවබෝධයක් ලබාගත හැක. ජාත්‍යන්තර සම්මතයන්ට අනුව දිනකට එක් ඩොලරයකට වඩා අඩුවෙන් ආදායම් උපයනු ලබන පවුල් දිළිඳු ලෙස සළකන අතර එය මැනීමද විවිධ දුෂ්කරතාවලට ලක්වේ. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැළකීමේදී ද පුද්ගලයින් ලබන ආදායම් පිළිබඳ නිවැරදි වාර්තා හා තොරතුරු ලබාගැනීම ඉතා අපහසු බැවින් මෙම ගණනය කිරීම් ඉතා දුෂ්කර වෙයි. මෙහි අපහසුතාවයන්

මගහැරවීම සඳහා සමීක්ෂණය තුළදී විශේෂ අවධානය යොමු කළ අතර දැනට පවත්නා දත්ත මත පදනම්වීමට තීරණය විය. ඒ අනුව දැනටමත් දරිද්‍රතා සීමාවෙන් පහළ ලෙස හඳුනාගෙන සමෘද්ධි ආධාර ලබාදෙනු ලබන පිරිස් දිළිඳු ජන කොටස් ලෙස වර්ග විය. මේ අනුව ග්‍රාම නිලධාරී වසමෙහි සමස්ථ පවුල් සංඛ්‍යාව වන 410 අතරින් 215 ක් සමෘද්ධි සහනාධාර ලාභීන් බවට වාර්තා විය. එනම් ගම්මානයේ සියයට 52 ක ප්‍රතිශතයකි. ප්‍රතිශතයක් ලෙස සැළකීමේදී මෙය ඉතා ඉහළ අගයක් වන අතර මේ කෙරෙහි විවිධ සාධක බලපා ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය අංශයේ පිරිස් කෘෂිකාර්මික හෝ වෙනත් දෛනික වැටුප් ලබන රැකියාවන්හි නිරතවන අතර ඔවුන්ගේ ආදායම සම්බන්ධ ස්ථිර බවක් නොමැත. එමෙන්ම ආදායම ඔප්පු කිරීම් හැකියාවක්ද නොමැත. මේ හේතුවෙන් සහනාධාර ලබා ගැනීමේ පරමාර්ථ මත ආදායම නිතරම පහළ අගයක් ලෙස වාර්තා කිරීමට පෙළඹේ. මෙය නිවැරදි විග්‍රහයන් කිරීම තුළදී ප්‍රබල ගැටළුවක්ව පවතී. මේ හේතුවෙන් සත්‍ය ලෙසම දිළිඳු ජන කොටස වෙන්කර ගැනීම ගැටළුවකි.

දරිද්‍රතාවය කෙරෙහි බලපා ඇති සාධක පිළිබඳව විමසීමේදී ප්‍රබල ලෙසම කැපී පෙනෙනුයේ ජනතාවගේ වියදම් රටාවන්හි ඇති නොගැළපීමයි. එනම් අනවශ්‍ය මත්පැන් පානය හා දුම්පානය වැනි අංශ වෙත වැඩි වශයෙන් ගෘහමූලිකයින් යොමු වී ඇති බැවින් කුටුම්භ ආදායමින් වැඩි කොටසක් ඒ වෙත ඇදී යයි. මේ හේතුවෙන් අනෙකුත් වියදම් සඳහා ලැබිය යුතු ප්‍රමුඛත්වයන් ඉවත්වී යයි. මෙය දරිද්‍රතාව කෙරෙහි ප්‍රබල ලෙස බලපා තිබේ. අනෙක් අතින් බහුතර ජනතාවකගේ ආදායම් මාර්ගයන්හි ස්ථිර බවක් නොමැත. කෘෂිකාර්මික අංශයෙහි නියැලෙන්නන්ගේ මෙන්ම වෙනත් කම්කරු රැකියාවන්හි නිරතවන්නන්ගේ මාසික ආදායම පහළ මට්ටමක පවතී. එමෙන්ම එම ආදායම් මාර්ගයන්හි නිශ්චිත බවක්ද නොමැත.

### 3.6 ඉතිරි කිරීම්

ග්‍රාමීය ජනතාව අතර ඉතිරිකිරීම් හා ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීම ඉතා වැදගත් වුවකි. එමගින් වර්තමාන ආදායමෙන් යම්කිසි ප්‍රමාණයක් අනාගත ආයෝජන කටයුතු සඳහා යොමු කිරීමේ හැකියාව පවතී. ඉතිරි කිරීම් යනු පුද්ගල ආදායම හා වියදම අතර පවත්නා පරතරය ලෙසද සරළව විග්‍රහ කළ හැක. ආදායමට වඩා අඩු වියදමක් පවත්වාගෙන යන්නේ නම් ඒ තුළ ධන ඉතිරිකිරීම් පවතින අතර ආදායම ඉක්මවා වියදම් පවතින්නේ නම් එහි සෘණ ඉතිරි කිරීම හෙවත් ණය ගැනීමක් පැවතිය යුතුය. මෙවැනි අංශ පිළිබඳව අවබෝධයක් ලබාගැනීමේ අරමුණින් පූර්ව ව්‍යාප්ති සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී බැදිගම්තොට ගම්මානයේ ජනතාවගේ ඉතිරිකිරීම් පුරුද්ද හා විධිමත් මූල්‍ය ආයතන සමඟ ගණුදෙනු කිරීම යන අංශ මෙන්ම සීට්ටු වැනි අවිධිමත් ඉතිරිකිරීම් ක්‍රම පිළිබඳවද අවධානය යොමු විය.

සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 91% ක ප්‍රතිශතයක් කුමන හෝ විධිමත් මූල්‍ය ආයතනයක ඉතිරිකිරීම් හෝ වෙනත් ආකාරයක තැන්පතු ගිණුමක් පවත්වාගෙන යයි. 3.10 සංඛ්‍යා සටහන කුටුම්භයන් සතු ඉතිරිකිරීම් ගිණුම් සංඛ්‍යාව අනුව පවුල් ව්‍යාප්තිය පෙන්වන අතර ඉන් පැහැදිලි වන පරිදි බැදිගම්තොට ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 24 ක් පමණ කුමන හෝ වර්ගයක තැන්පතු 5ක් හෝ ඊට වැඩි ගණනක් පවත්වාගෙන යයි. ගමේ ජනතාව විවිධ සමිති සමාගම්වල සාමාජිකත්වය දැරීමක් විශේෂයෙන් සණස, සමෘද්ධි වැනි දිළිඳු ජනතාව අරමුණු කරගත් ව්‍යාපාර සමග සම්බන්ධ වීම හේතුවෙන් විධිමත් මූල්‍ය ආයතන සමඟ පවත්නා ගනුදෙනු ඉහළ ගොස් තිබේ.



පුස්තකාලය
LIBRARY
HARTI

3.10 සංඛ්‍යා සටහන

**කුටුම්භ සතු තැන්පතු ගිණුම් සංඛ්‍යාව අනුව ව්‍යාප්තිය**

| ගිණුම් සංඛ්‍යාව | පවුල් ගණන | ප්‍රතිශතය % |
|---|---|---|
| 0 | 17 | 8.3 |
| 1 | 34 | 16.6 |
| 2 | 40 | 19.5 |
| 3 | 31 | 15.0 |
| 4 | 34 | 16.6 |
| 5 හෝ ඊට වැඩි | 49 | 24.0 |
| එකතුව | 205 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006

විධිමත් මූල්‍ය ආයතන වන වානිජ බැංකු වෙත ප්‍රවේශවීමට මැලිකමක් දක්වන පිරිස් සණස හා සමෘද්ධි බැංකුව වැනි මූල්‍ය ආයතන මඟින් තම අවශ්‍යතා ඉටුකර ගැනීමට පෙළඹී තිබේ. සමීක්ෂණයට ලක්කළ පවුල්වල පැවති විවිධ ඉතිරිකිරීම් ගිණුම් පිළිබඳ ප්‍රතිශතක ව්‍යාප්තිය 3.11 සංඛ්‍යා සටහනින් පෙන්වයි. එයින් පෙනීයන පරිදි සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම්වලින් සියයට 38%7 ක් වාණිජ බැංකු තුළ පවත්වාගෙන යයි. වාණිජ බැංකු ලෙස මෙහිදී මහජන බැංකුව, ලංකා බැංකුව, සෙලාන් බැංකුව, නේෂන් ට්‍රස්ට් බැංකුව, හැටන් නැෂනල් බැංකුව හා කොමර්ෂල් බැංකුව අන්තර්ගත වේ. වාණිජ බැංකු අතර සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම්වල ප්‍රතිශතක ව්‍යාප්තිය සළකා බැලීමේදී සාපේක්ෂ වශයෙන් වැඩිම ප්‍රතිශතයක් එනම් සියයට 47.6 ක් හැටන් නැෂනල් බැංකුව සමග පවත්නා ගිණුම් වන අතර සියයට 43.4 ක් මහජන බැංකුව තුළ පවත්නා ගිණුම් වේ. මේ අනුව වාණිජ බැංකු තුළ පවත්නා සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම් සම්බන්ධයෙන් සැලකීමේදී හැටන් නැෂනල් බැංකුව හා මහජන බැංකුව ඉදිරියෙන් සිටින බව පැහැදිලි වේ. අනෙක් රාජ්‍ය බැංකුව වන ලංකා බැංකුව තුළ සියයට 3ක පමණ ප්‍රතිශතයක් සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම් පවතින අතර අනෙකුත් වානිජ බැංකු වන කොමර්ෂල්, සෙලාන් හා නේෂන් ට්‍රස්ට් බැංකු තුළ පවතිනුයේ සියට 6ක ප්‍රතිශතයකි. වාණිජ බැංකු හැරුණු පසු ගම්මානයේ පවතින සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම්වලින් සාපේක්ෂව වැඩි ප්‍රතිශතය එනම් සියයට 26.6 ක් සණස බැංකුව තුළ පවතී. අනෙකුත් මූල්‍ය ආයතන වන සමෘද්ධි බැංකුව, ග්‍රාමීය බැංකුව හා රුහුණු සංවර්ධන බැංකුව අතර ආසන්න වශයෙන් සමාන ප්‍රතිශතවලින් සාමාන්‍ය ඉතිරි කිරීම් ගිණුම් බෙදී යයි.

ළමා ඉතිරි කිරීමේ ගිණුම් සම්බන්ධයෙන් සළකා බැලීමේදී ද සමීක්ෂණයට ලක්කළ පවුල්වල පවත්නා සමස්ථ ළමා ගිණුම් සංඛ්‍යාවෙන් සියයට 64.3 ක් පමණ වාණිජ බැංකු තුළ පවතී. මේ අනුව ඉතා පැහැදිලි වනුයේ ගම්මානයේ ජනතාවගේ වැඩි විශ්වාසය වාණිජ බැංකු වෙත පවත්නා බවයි. ධන ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් සැළකීමේදී වැඩිම ප්‍රතිශතය රුහුණු සංවර්ධන බැංකුව තුළින් වාර්තා වන අතර මේ සඳහා ප්‍රබල හේතුව වනුයේ ණය මුදල් ලබාගැනීමේදී ධන ආයෝජන ගිණුමක් ආරම්භ කිරීම එකී බැංකුව තුළ අනිවාර්ය වීමයි.

ස්ථාවර ගිණුම් සම්බන්ධයෙන් සැළකීමේදී වැඩිම ප්‍රතිශතක අගය සමෘද්ධි බැංකුව තුළින් වාර්තාවන අතර මෙය සමෘද්ධි සහනාධාරය සමග බද්ධ වූවකි. ඊට අමතරව වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල ස්ථිර තැන්පතු පවතිනුයේ ඉතාමත් අඩු සංඛ්‍යාවකි.

### 3.11 සංඛ්‍යා සටහන

**විවිධ ඉතිරි කිරීමේ ගිණුම් මූල්‍ය ආයතන අතර ව්‍යාප්තිය**

| මූල්‍ය ආයතනය | සාමාන්‍ය ඉතුරුම් | | ළමා | | ස්ථාවර | | ධන ආයෝජන | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රති. | සංඛ්‍යාව | ප්‍රති. | සංඛ්‍යාව | ප්‍රති. | සංඛ්‍යාව | ප්‍රති. | සංඛ්‍යාව | ප්‍රති. |
| වානිජ බැංකු | 166 | 38.7 | 108 | 64.3 | 1 | 4.8 | 5 | 10.4 | 280 | 420 |
| ජා.ඉ. බැංකුව | 6 | 1.4 | 1 | 0.6 | - | - | - | - | 7 | 10 |
| සණස බැංකුව | 114 | 26.6 | 31 | 18.5 | 3 | 14.3 | 8 | 16.7 | 156 | 23.4 |
| සමෘද්ධි බැංකුව | 42 | 9.8 | 11 | 6.5 | 15 | 71.4 | 1 | 2.1 | 69 | 10.4 |
| ග්‍රාමීය බැංකුව | 38 | 8.9 | 14 | 8.3 | 1 | 4.8 | 4 | 8.3 | 57 | 8.6 |
| රුහුණු සං. බැංකුව | 40 | 9.3 | 3 | 1.8 | - | - | 26 | 54.2 | 69 | 10.4 |
| ස්වයංබැංකු සමාජය | 15 | 3.5 | - | - | 1 | 4.8 | 4 | 8.3 | 20 | 3.0 |
| වෙනත් | 8 | 1.8 | - | - | - | - | - | - | 8 | 1.2 |
| එකතුව | 429 | 100 | 168 | 100 | 21 | 100 | 48 | 100 | 666 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

මෙමගින් ඉතා පැහැදිලි වනුයේ ස්ථාවර ගිණුම් පවත්වාගෙන යාමට තරම් ආර්ථික ශක්තියක් ඇති පුද්ගලයින් ඉතාමත් අල්ප බවයි. අනෙක් අතින් සණස, සමෘද්ධි වැනි මූල්‍ය ආයතන සමග ණය ගනුදෙනු කිරීමේදී ඉතිරි කිරීම් තැන්පතු පවත්වාගෙන යාම අනිවාර්ය වේ. මේ හේතුවෙන් පවුල් ඒකක සතු බැංකු ගිණුම් සංඛ්‍යාව ඉහළ යාමක් පෙන්වයි. බොහෝ විට මෙවැනි ගිණුම් තුළ එතරම් සැළකිය යුතු මුදලක් ඉතිරි කර නොමැති බවද මෙහිදී සඳහන් කළ යුතුය.

විධිමත් මූල්‍ය ආයතන සමග පැවති ඉතිරි කිරීම්වලට අමතරව අවිධිමත් ක්‍රම යටතේ ඉතිරි කිරීමට දක්වන පෙළඹුම සම්බන්ධයෙන් ද සමීක්ෂණය තුළදී අවධානයට ලක්විය. මෙහිදී විශේෂයෙන්ම සීට්ටු වැනි ග්‍රාමීය මට්ටමේ පවත්නා අවිධිමත් මූල්‍ය ගණුදෙනු පිළිබඳව අවධානය යොමු විය. ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 28 ක් පමණ සීට්ටු දැමීම හා සම්බන්ධ වේ. බොහෝ විට වර්ෂයක් හෝ ඊට වැඩි කාළ පරාසයක් පුරා මෙකී සීට්ටු පවත්නා අතර සීට්ටු දැමීමේ නිරතවන පවුල්වලින් සියයට 91 පමණ 2000 වර්ෂයේ සිට සීට්ටු පහක් හෝ ඊට අඩු සංඛ්‍යාවකට සහභාගි වී තිබේ. ඉතිරි සියයට 9 සීට්ටු 6 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකට සහභාගී වී තිබේ. සීට්ටු ක්‍රමය අවිධිමත් ඉතිරි කිරීමේ ක්‍රමයක් වශයෙන් යම් සාධනීය ලක්ෂණ පෙන්වුවද වාචිකව පවත්නා ගිවිසුම් කඩවීම, මුලින් ගෙවූ මුදල් නොලැබීම වැනි සිද්ධීන්ද වාර්තා වේ.

## 3.7 ණයගැතිභාවය

සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී ඉතිරි කිරීම් මෙන්ම ණය ලබාගැනීම හා සම්බන්ධ ක්‍රියාවලීන් අවධානය යොමු විය. පුද්ගලයින්ට ණය ලබාගත හැකි මූලාශ්‍ර ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට ගොනුකළ හැකිය. එනම් විධිමත් මූල්‍ය ආයතන හා අවිධිමත් මූල්‍ය ආයතන වශයෙනි. විධිමත් මූල්‍ය ආයතන ද නැවත විධිමත් හා අර්ධ විධිමත් වශයෙන් කොටස් කිරීමේ හැකියාවද පවතී. පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී මෙකී කුමන මූල්‍ය ආයතන වෙත පුද්ගලයින් ණය ගැනීම් සඳහා යොමුවී ඇත්ද යන කරුණ සම්බන්ධව මූලික අවධානය යොමු විය. එයින් පෙනීයන පරිදි ජනතාව අවිධිමත් මූල්‍ය අංශයෙන් මිදී විධිමත් මූල්‍ය ආයතන වෙත යොමුවීමේ ඉහළ ප්‍රවණතාවයක් දක්වයි. විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන සණස, සමෘද්ධි හා සංවර්ධන බැංකු මගින් තම ණය අවශ්‍යතා ඉටුකරගැනීමට පෙළඹී තිබේ. ග්‍රාමීය ජනතාවට ලබාදීම අපහසු ඇප සුරැකුම් හෝ පුද්ගල ඇප මෙකී මූල්‍ය ආයතන සඳහා අවශ්‍ය නොවීමත් ජනතාව සමග සමීපව කටයුතු කිරීමත් මෙකී තත්ත්වයන් කෙරෙහි බලපා තිබේ.

සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 80 ක ප්‍රතිශතයක් කුමන හෝ මූල්‍ය ආයතනයකින් හෝ හිතවතුන්ගෙන් පසුගිය වසර දෙකක කාලය තුළ ණය මුදලක් ලබාගෙන තිබේ. 3.12 සංඛ්‍යා සටහන මගින් පසුගිය වසර දෙකක කාලය තුළ විවිධ මූලාශ්‍රයන්ගෙන් ලබාගත් ණය මුල් සංඛ්‍යාවෙහි ව්‍යාප්තිය පෙන්වන අතර සාපේක්ෂව වැඩිම ණය මුදල් සංඛ්‍යාවක් නිකුත්කර ඇත්තේ සණස සමිතිය මගින් බව පැහැදිලි වේ.

### 3.12 සංඛ්‍යා සටහන

**ලබාගත් මූලාශ්‍රය අනුව ණය සංඛ්‍යාවන්හි ව්‍යාප්තිය**

| ණය මූලාශ්‍රය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| සණස සමිතිය | 110 | 35.5 |
| හිතවතුන්ගෙන් | 71 | 22.9 |
| සමෘද්ධි බැංකුව | 31 | 10.0 |
| වාණිජ බැංකු | 29 | 9.4 |
| රුහුණු සං. බැංකුව | 24 | 7.7 |
| ස්වයංබැංකු සමාජය | 17 | 5.5 |
| ග්‍රාමීය බැංකුව | 3 | 1.0 |
| පොළීකරුවන් | 10 | 3.2 |
| වෙනත් | 15 | 4.8 |
| එකතුව | 310 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

හිතවතුන් ලෙස මෙහිදී අර්ථ දක්වා ඇත්තේ පවුලේ ඥාතීන්ගෙන් හෝ වෙනත් මිත්‍රයින්ගෙන් ලබාගනු ලබන අතමාරු හෝ ණය මුදල්ය. මෙහිදී බොහෝ විට කෙටිකාලීන පදනමින් මෙම ණය මුදල් ලබාගනු ලබන අතර පොළී අය කිරීමක් දක්නට නොමැත. ණය ලබාගැනීමේ මූලාශ්‍ර පිළිබඳව සැළකීමේදී වාණිජ බැංකුවලින් ණය ලබාගැනීම් සාපේක්ෂව පහළ මට්ටමක් ගෙන තිබේ. මේ සඳහා ප්‍රබල හේතුව වී ඇත්තේ වාණිජ බැංකු බලාපොරොත්තුවන ඇප සුරැකුම් හෝ පුද්ගල ඇප සැපයීමට පුද්ගලයින් අසමත්වීමයි. මේ සඳහා හොඳම පිළිතුරක් සණස, සමෘද්ධි හා

ස්වයංබැංකු සමාජ මඟින් සැපයේ. මේ හේතුවෙන් මෙකී ආයතනවලින් ලබාගත් ණය මුදල් සංඛ්‍යාව සියයට පනහ ඉක්මවා ගොස් තිබේ.

10.3 සංඛ්‍යා සටහන ණය ලබාගත් හේතු අනුව ණය මුදල් සංඛ්‍යාවෙහි ව්‍යාප්තිය පෙන්වන අතර ඉන් පැහැදිලි වන පරිදි පසුගිය වසර දෙකක කාලය තුළ වැඩිම ණය සංඛ්‍යාවක් ලබාගෙන ඇත්තේ කෘෂිකාර්මික අරමුණු මතයි. එය සමස්ථ ණය මුදල් සංඛ්‍යාවෙන් සියයට 54.5 කි. ප්‍රදේශයේ කෘෂිකාර්මික පරිසරය අනුව වී වගාව හා කෙසෙල් වගාව සඳහා වැඩි ප්‍රමාණයක් ණය ලබාගෙන තිබේ.

ණය ලබාගත් සමස්ථ ප්‍රමාණයෙන් සියයට 21 ක් ණය මුදල් අතපසු කිරීම් හෝ ගෙවීම් පැහැර හැර ඇත. මෙසේ ගෙවීම් පැහැර හැරීම සඳහා ප්‍රධානතම හේතුව බවට පත්වී ඇත්තේ ආර්ථික අපහසුතාය. එනම් ණය ගෙවීම් පැහැර හැරිය පිරිසෙන් සියයට 97 ක් ආර්ථික අපහසුතා හේතුවෙන් ණය ගෙවීමට නොහැකි වූ බව පවසන අතර ඉතිරි සියට 03 කෘෂි නිෂ්පාදනවල මිල ගණන් පහළයාම හේතුවෙන් ණය මුදල් ගෙවීමට නොහැකි වූ බව පවසනු ලබයි.

10.13 සංඛ්‍යා සටහන

**ණය ලබාගත් හේතුව අනුව ණය මුදල් ව්‍යාප්තිය**

| හේතුව | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| කෘෂිකාර්මික කටයුතු | 169 | 54.5 |
| නිවාස ණය | 48 | 15.5 |
| පරිභෝජන හා හදිසි අවශ්‍යතා | 70 | 22.6 |
| ව්‍යාපාර/ස්වයං රැකියා | 12 | 3.9 |
| සාහන මිලදී ගැනීම් | 5 | 1.6 |
| වෙනත් | 6 | 1.9 |
| එකමුතු | 310 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.හො.ප.පු.ආ. – 2006

ණය ලබාගත් මාර්ග හා පොළී ප්‍රතිශත සම්බන්ධයෙන් තව දුරටත් විග්‍රහ කර බැලීමේදී සාපේක්ෂව වැඩි පිරිසක් සණස සමිතිය වෙත යොමුවී ඇති අතර එහි ණය සඳහා වාර්ෂික පොළිය සියයට 16 කි. සමෘද්ධි හා ස්වයං බැංකු සමාජයෙහි වාර්ෂික පොළිය සියයට 24 පමණ වන අතර වාණිජ බැංකුවල එම අගයන් සියයට 18 සිට 24 දක්වා වෙනස්වීමත් විවිධ බැංකු අනුව සිදුවේ. පෞද්ගලික පොළී කරුවන්ගේ මාසික පොළිය සියයට 10 සිට 20 දක්වා පරාසයන්හි පිහිටන අතර එය වාර්ෂික මට්ටමෙන් ගතහොත් සියයට 120-240 දක්වා පරාසයකි. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සැළකීමේදී එහි ජනතාවට සාපේක්ෂව අඩු පොළී ප්‍රතිශත යටතේ ණය ලබාගැනීමේ හැකියාව පිළිබඳ ප්‍රබල ගැටළුවක් නොමැත. ග්‍රාමීය මට්ටමෙන්ම ක්‍රියාත්මක වන සමිති හා සංවිධාන පැවතීම මෙම ක්‍රියාවලීන් පහසුකර තිබේ. මේ හේතුවෙන් අවිධිමත් අංශයේ ඉහළ පොළී ප්‍රතිශතවලට යටත්වීමේ අවශ්‍යතාවක් දැඩිව ඇති නොවන බව පැවසිය හැක.

හතරවන පරිච්ඡේදය

# නිවාස තත්ත්වය හා පහසුකම්

යම්කිසි ප්‍රදේශයක සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ විමසීමේදී නිවාස තත්ත්වය හා පහසුකම් ඉතා වැදගත් දර්ශකයක් ලෙස සළකයි. එමගින් අදාල ජන සමාජයේ පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය පිළිබඳව පැහැදිලි අදහසක් ලබාගත හැකිය. ගම නැගුම වැඩසටහන ක්‍රියාත්මක වන ගම්මානවල පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය යටතේ අංශ කිහිපයක් ඔස්සේ කරුණු රැස් කිරීමට කටයුතු කරනු ලැබීය. එනම් නිවාස අයිතිය, නිවාස තත්ත්වය, නිවාසවලට ඇති පහසුකම්, බලශක්ති භාවිතය, පානීය ජලය, වැසිකිළි පහසුකම්, ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය, ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන හා ගමනාගමන හා සේවා යටිතල පහසුකම් යන උප මාතෘකා ඔස්සේ තොරතුරු රැස් කළ අතර එම තොතුරු මෙම පරිච්ඡේදය යටතේ විශ්ලේෂණයට ලක්වේ.

## 4.1 නිවාස අයිතිය

නිවාස අයිතිය ප්‍රධාන වශයෙන් තනි අයිතිය, හවුල් අයිතිය, බදු හෝ කුළී, අනවසර හා වෙනත් වශයෙන් කොටස් කිහිපයකට බෙදිය හැකිය. සමස්ථයක් ලෙස ගත්විට ශ්‍රී ලංකාවේ නිවාසවලින් සියයට 90 පමණ තනි අයිතිය යටතේ පවතී. ඉන් ග්‍රාමීය ප්‍රදේශ සුවිශේෂ වන අතර එහි සියයට 95 පමණ තනි අයිතිය යටතේ පවතී. මේ තත්ත්වය වඩාත් තහවුරු කරමින් බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි 97% පමණ නිවාස තනි අයි.තිය යටතේ පවතී.

**4.1 සංඛ්‍යා සටහන**

**අයිතියේ ස්වරූපය අනුව නිවාස බෙදීයාම**

| අයිතියේ ස්වරූපය | නිවාස ගණන | ප්‍රතිශතය |
|---|---|---|
| තනි අයිතිය | 199 | 97.0 |
| හවුල් අයිතිය | 2 | 1.0 |
| අනවසර | 1 | 0.5 |
| වෙනත් | 3 | 1.5 |
| එකතුව | 205 | 100.0 |

**මූලය : මූලික සමීක්ෂණය - 2006 හෙ.කො.ගො.ප.පු.ආ.**

4.1 සංඛ්‍යා සටහනෙන් පෙන්නුම් කරන ආකාරයට සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 97.6 ක් පමණ තනි අයිතිය යටතේ නිවාස හිමිකාරීත්වයක් දරයි. මෙය ඉහත පෙන්වූ පරිදි ජාතික මට්ටමෙහි අගයන් සමග සැසඳීමේදී ඉහළ අගයකි. හවුල් අයිතිය, අනවසර හා වෙනත් ක්‍රම යටතේ නිවාස අයිතිය පවතිනුයේ සියයට 03 ක් වැනි ඉතා පහළ අගයකි.

4.2 නිවාස තත්ත්වය

නිවාස තත්ත්වය පිළිබඳව විශ්ලේෂණයක යෙදීමේදී නිවාස ඉදිකිරීම සඳහා යොදාගත් ද්‍රව්‍ය අනුව, නිවාසයේ විශාලත්වය හා වෙන්වූ මුළුතැන්ගෙයක් සහිතවීම යන නිර්ණායකයන් ඔස්සේ වර්ගීකරණයකට ලක්කළ හැකිය.

4.2 සංඛ්‍යා සටහන

වහල ඉදිකිරීමට යොදාගත් ද්‍රව්‍ය අනුව නිවාස වර්ගීකරණය

| යොදාගත් ද්‍රව්‍ය | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| උළු/ඇස්බැස්ටෝස් | 149 | 72.7 |
| සෙවිළි තහඩු | 9 | 4.4 |
| පොල් අතු හෝ වෙනත් | 47 | 22.9 |
| එකතුව | 205 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.හො.ප.පු.ආ. - 2006

ඉදිකිරීමට යොදාගත් ද්‍රව්‍ය අනුව නිවාස වර්ගීකරණය

4.2 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි නිවාසවලින් සියයට 73 පමණ ස්ථිර මට්ටමෙහි වහළවල් සහිත නිවාස වේ. එනම් උළු හෝ ඇස්බැස්ටස් වහළ සහිත නිවාසයන්ය. එය ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයෙහි අගය වන සියයට 82 මට්ටමට වඩා පහළින් පිහිටීමකි. පොල් අතු හෝ වෙනත් අතුවර්ග සෙවිළි කරන ලද නිවාස ප්‍රතිශතය සියයට 23 පමණ වේ. එය ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයෙහි අගය වන සියයට 6.3 සමඟ සැසඳීමේදී බෙහෙවින් ඉහළ ප්‍රතිශතයකි. මෙයින් පැහැදිලි වන්නේ වහළ ඉදිකිරීමට යොදා ගන්නා ද්‍රව්‍යයන්ට අනුව සාපේක්ෂව සැළකීමේදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි නිවාස තත්ත්වය වැඩි දියුණු විය යුතු මට්ටමෙහි පවතින බවයි.

නිවාසයන්හි බිත්ති ඉදිකිරීම සඳහා යොදාගත් ද්‍රව්‍ය අනුව වර්ගීකරණය කිරීමේදී සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි නිවාසයන්ගෙන් සියයට 74 ක් ගඩොල් හෝ සිමෙන්ති ගල් භාවිතා කර ඇත. එය ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයෙහි අගය වන සියයට 79 හා සැසඳීමේදී පහළ මට්ටමකි. සියයට 21 පමණ නිවාස මැටි යොදු වරිච්චි බිත්ති සහිත නිවාසයන්ය. එය ජාතික මටටමෙහි ග්‍රාමීය අංශයෙහි අගයවන සියයට 13.8 සමඟ සැසඳීමේදී ඉතා ඉහළ අගයකි. මෙයින් පැහැදිලිවන්නේ බිත්ති අනුව නිවාස වර්ගීකරණයේදී එය ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයෙහි නිවාස තත්ත්වයට වඩා පහළින් පිහිටන බවයි.

ගෙබිමෙහි ස්වරූපය අනුව නිවාස වර්ගීකරණයේදී සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි සියයට 57 ක් පමණ වන නිවාස සිමෙන්ති යොදා ඇත. සියයට 5.4 ක් නිවාස ටෙරාසෝ/ටයිල් යොදා ඇති අතර සියයට 38 ක පමණ නිවාස ගොම මැටි අතුරා ඇත. මෙකී අගයන් ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශය සමඟ සැසඳීමේදී කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් පෙන්නුම් කරනු ලබයි. ගෙබිම සඳහා සිමෙන්ති යෙදූ නිවාස පිළිබඳව සැළකීමේදී එය ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයෙහි අගය වන සියයට 78 සමඟ සැසඳීමේදී පහළින් පිහිටීමකි. ටෙරාසෝ හා ටයිල් සම්බන්දයෙන් සැළකිමේදී

බැදිගම්තොට අගය ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශයේ අගයවන සියයට 2.7 සමග සැසඳීමේදී සියයට 5.4 ලෙස ඉහළින් පිහිටයි. මෙහි සුවිශේෂී ලක්ෂණයක් පෙන්වනුයේ ගොම මැටි අතුරන නිවාසයන්හිය. එනම් බැදිගම්තොට එය සියයට 38 මට්ටමෙහි පවතින විට ජාතික මට්ටමෙහි ග්‍රාමීය අංශය පෙන්වුයේ සියයට 15.5 ක අගයකි. මෙම තත්ත්වය වෙනසකට බඳුන්විය යුතු අතර ගොම මැටි අතුරන නිවාස සිමෙන්ති හෝ වෙනත් ස්ථිර ගෙබිමක මට්ටමට වර්ධනය විය යුතුය. 4.3 සංඛ්‍යා සටහන මෙකී තොරතුරු සම්බන්ධව පැහැදිලි විස්තරයක් සපයයි.

**4.3 සංඛ්‍යා සටහන**

**ගෙබිම හා බිත්ති සඳහා යොදාගත් ද්‍රව්‍ය අනුව නිවාස වර්ගීකරණය**

| බිත්ති | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ගඩොල්/ සිමෙන්ති ගල් | 151 | 73.7 |
| වෙනත් ගල් වර්ග | 11 | 5.4 |
| වරිච්චි/මැටි | 43 | 21 |
| එකතුව | 205 | 100 |
| **ගෙබිම** | **නිවාස සංඛ්‍යාව** | **ප්‍රතිශතය** |
| සිමෙන්ති | 117 | 57.1 |
| ටෙරාසෝ/ටයිල් | 11 | 5.4 |
| ගොම මැටි | 77 | 37.6 |
| එකතුව | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - 2006 හෙ.කො.ගො.ප.පු.ආ.**

**නිවසේ විශාලත්වය අනුව වර්ගීකරණය**

නිවසෙහි විශාලත්වය අනුව වර්ගීකරණයේදී එහි වර්ග ප්‍රමාණය හා කාමර ගණන යන දර්ශක කෙරෙහි අවධානය යොමු විය. නිවසෙහි භූමියෙහි වර්ග ප්‍රමාණය යන දර්ශකය මගින් එක් පුද්ගලයෙකුට කෙතරම් වර්ග ප්‍රමාණයක් පරිහරණය කිරීමට අවස්ථාව ලැබේද යන්න පිළිබිඹු වේ.

**4.4 සංඛ්‍යා සටහන**

**භූමියේ වර්ග ප්‍රමාණය අනුව නිවාස ව්‍යාප්තිය**

| වර්ග ප්‍රමාණය (වර්ග අඩි) | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 250 ට අඩු | 47 | 23.0 |
| 250 <= 500 | 57 | 27.8 |
| 500 < =750 | 48 | 23.4 |
| 750< =1000 | 31 | 15.1 |
| 1000< =1500 | 17 | 8.3 |
| 1500 ට වැඩි | 5 | 2.4 |
| එකතුව | 205 | |

**මූලය : මූලික සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

4.4 සංඛ්‍යා සටහනින් දැක්වෙන පරිදි සමීක්ෂණයට ලක්කළ නිවාසවලින් හරි අඩක් පමණ වර්ග අඩි 500ට වඩා අඩු භූමි ප්‍රමාණයකින් යුක්ත වේ. වර්ග අඩි 1000 හෝ ඊට වැඩි නිවාස ප්‍රතිශතය සියයට 10.7 කි. භූමි ප්‍රමාණය වර්ග අඩි 250 ට අඩු නිවාස සංඛ්‍යාවද සැළකිය යුතු මට්ටමෙහි ප්‍රතිශතක අගයක් (23) ගෙන තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කර ඇති පාරිභෝගික හා මූල්‍ය සමීක්ෂණ (2003/04) වාර්තාවට අනුව ග්‍රාමීය මට්ටමෙහි එක් පුද්ගලයෙකු ආසන්න වශයෙන් වර්ග අඩි 190 ක පමණ භූමි ප්‍රමාණයක් පරිහරණය කරයි. මෙම තත්ත්වය බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළින් වාර්තා වනුයේ 551 තරම් සාපේක්ෂව ඉහළ අගයකි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි නිවාස කාමර සංඛ්‍යාව අනුව බෙදා වෙන් කිරීමේදී ඉතා පැහැදිලි වන්නේ නිවාස වලින් වැඩි ප්‍රමාණය එනම් සියයට 54.2 ක් කාමර දෙකක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් සහිත නිවාස බවයි. සාපේක්ෂ වශයෙන් වැඩිම ප්‍රතිශතයක් වාර්තා වනුයේ කාමර 2 සහිත නිවාස වන අතර එය සියයට 45.4 ක ප්‍රතිශතයකි. නිවසක ඇති කාමර සංඛ්‍යාව කොපමණද යන දර්ශකය භාවිතයේදී එක් පුද්ගලයකු සඳහා කොතරම් කාමර සංඛ්‍යාවක් තිබේද යන්න ඉතා වැදගත් වේ. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි සමීක්ෂණයෙන් හෙළිවන පරිදි එක් පුද්ගලයෙකු සඳහා වෙන්වන කාමර සංඛ්‍යාව 0.6 ක මට්ටමකි. එය ජාතික මට්ටමෙහි අගය වන 1.1 සමග සැසඳීමේදී පහළ මට්ටමක් වන අතර වර්ධනය විය යුතු මට්ටමෙහි පසුවන්නකි.

නිවාස තත්ත්වය පිළිබඳව විග්‍රහ කිරීමේදී මුළුතැන්ගෙය පිහිටි ආකාරය යන දර්ශකයද ඉතා වැදගත් වන අතර ඒ තුළින් අදාල ජන සමාජයේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ වැදගත් නිගමනයන්ට පැමිණීමේ හැකියාව පවතී. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම සම්බන්ධයෙන් සැළකීමේදී එහි නිවාස වලින් සියයට 78.5 ක මුළුතැන්ගෙය ගෙයින් පිටත වෙනම පිහිටා ඇත. බොහෝවිට මෙය තාවකාලික මට්ටමේ එකක් වන අතර පොල්අතු හෝ සෙවිළි තහඩු වහළ සෙවිළි කිරීම සඳහා යොදා ගන්නා අතර ගෙබිම ගොම මැටි සහිත වෙයි. නවීන මුළුතැන්ගෙයක දක්නට ලැබෙන අංගෝපාංග රහිත වන අතර බොහෝ සරල මූලික අංගයන්ගෙන් පමණක් සමන්විත වෙයි. සමීක්ෂණයට ලක්කළ පවුල් අතරින් සියයට 19ක ගෙය තුළ වෙනම වෙන්වූ කාමරයක මුළුතැන්ගෙය පිහිටා ඇති අතර එය පෙර සඳහන් කළ තත්ත්වයට වඩා ඉදිරියට පැමිණීමකි. ඉතිරි සියයට 2.4 සඳහා නිශ්චිතව වෙන්වූ මුළුතැන්ගෙයක් නොමැති අතර නිවස තුළම එම අවශ්‍යතාවයද ඉටුකර ගනී.

### 4.3 නිවාස සඳහා ඇති පහසුකම්
### (ප්‍රවාහන හා සන්නිවේදන)

නිවාස සඳහා ඇති පහසුකම් යටතේ නිවාස වෙත ප්‍රවේශවීමට ඇති හැකියාව යන දර්ශකය ඉතා වැදගත් වුවකි. මේ යටතේ වාහනයකින් නිවස වෙත ගමන්කළ හැකිද යන්න සමීක්ෂණය තුළදී අවධානයට යොමු විය. ඉන් අනාවරණය වන පරිදි නිවාස වලින් සියයට 97.6 කට වාහනයකින් ප්‍රවේශ වීමේ හැකියාව පවතී. බැදිගම්තොට යනු තැනිතලා සහිත භූ විෂමතාවයන් අවම කලාපයක් බැවින් මෙම දර්ශකය ඉතා ඉහළ මට්ටමක පිහිටයි. සියයට 2.4 ක් වැනි සුළු නිවාස සංඛ්‍යාවකට සෘජුවම වාහනයකින් ප්‍රවේශ විය නොහැකි වන අතර එම නිවාසයන්ද වාහනයකින් යා හැකි ආසන්න මාර්ගයට උපරිම වශයෙන් මීටර් 200 පමණ දුරින් පිහිටයි. නිවසට වාහනයකින් ප්‍රවේශවිය නොහැකි අයගෙන් සියයට 75 කටම හේතුව පාරක් නොමැතිවීම වන අතර සියයට 25 කට හේතුව දුෂ්කර අඩි පාරවල් පැවතිමයි.

සාපේක්ෂව සළකා බැලීමේදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි වාහනයකින් නිවසට ප්‍රවේශවීමේ හැකියාව යන දර්ශකය ඉතා ඉහළ මට්ටමක පවතී.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි සංන්නිවේදන පහසුකම් සම්බන්ධයෙන් සළකා බැලීමේදී ගම්මානයේ කිසිදු නිවසකට රැහැන් සහිත දුරකථන පහසුකම් ලැබී නොමැත. ගම්මානයේ නිවාස වලින් සියයට 8කට පමණ ඇන්ටනා සහිත දුරකථන (CDMA ඇතුලත්ව) පහසුකම් සහිත වන අතර සියයට 12ක පමණ ජංගම දුරකථන පහසුකම් සපයාගෙන තිබේ. ජංගම දුරකථන පහසුකම් සහිත නිවාස වලින් සියයට 87.5 ක පමණ එක් දුරකථනය බැගින් ඇති අතර සියයට 12.5 ක දුරකථන දෙක බැගින් ඇත. 4.5 සංඛ්‍යා සටහන දුරකථන භාවිතය පිළිබඳ පැහැදිලි විස්තරයක් සපයයි.

**4.5 සංඛ්‍යා සටහන**

**දුරකථන භාවිතය අනුව පවුල් ව්‍යාප්තිය**

| දුරකථන වර්ගය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඇන්ටනා දුරකථන | 17 | 8.3 |
| ජගංම දුරකථන | 24 | 11.7 |
| නොමැති | 164 | 80.0 |
| | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

## 4.4 බලශක්ති භාවිතය

මූලික සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී ගෘහස්ථ බලශක්ති භාවිතය ආලෝකය ලබාගැනිම හා ආහාරපාන සකසා ගැනීම යන අංශ දෙක යටතේ අවධානයට ලක්විය.

**4.6 සංඛ්‍යා සටහන**

**ආලෝකය ලබාගැනීම සඳහා බලශක්ති භාවිතය**

| බලශක්ති මූලය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ජල විදුලිය | 62 | 30.2 |
| සූර්ය කෝෂ | 20 | 9.8 |
| භූමිතෙල් හෝ වෙනත් | 123 | 60.0 |
| එකතුව | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය- හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

5.6 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි බැදිගම්තොට ගම්මානයේ සමීක්ෂණයට ලක්කළ පවුල්වල ආලෝකය ලබාගැනීමේ මූලික ප්‍රභවය භූමිතෙල් වන අතර එය සියයට 60 ක පමණ ප්‍රතිශතයක් නියෝජනය කරයි. සියයට 30 ක් පමණ ජල විදුලි බලය ආලෝකය ලබාගැනීමේ මූලය ලෙස යොදාගනී. ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත්කළ

පාරිභෝගික හා මූල්‍ය සමීක්ෂණයේදී හෙළිවන පරිදි ශ්‍රී ලංකාවේ ආලෝකය ලබාගැනීමේ මූලය භූමිතෙල්වල සිට විදුලි බලය වෙත පරිවර්තනය වීමේ ප්‍රවණතාවයක් දක්වයි. ජාතික මට්ටමේ සංඛ්‍යා ලේඛන සමග සැසඳීමේදී ද බැදිගම්තොට ගම්මානයේ ආලෝකය ලබාගැනීමේ මූලික ප්‍රභවය යන දර්ශකය භූමිතෙල් මත රදා බවතින බවත් ජල විදුලි හෝ වෙනත් මූලයක් වෙත ගමන්කළ යුතු බවත් පෙනීයයි. සංවර්ධන ක්‍රියාවලියන්හිදී මෙම අංශය පිළිබඳව විශේෂ අවධානය යොමුවිය යුතු වන අතර ජල විදුලි බලය වෙත ප්‍රවේශවීමේ අවස්ථාව ගම්මානයේ ජනතාවට ලබාදිය යුතුය.

ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් වලදී අදාල ප්‍රදේශයට ජල විදුලි බලය ලබාදීමේදී දැනට විදුලිබලය පවත්නා ආසන්නතම ස්ථානයට ඇති දුර ඉතා වැදගත්වන අතර සමීක්ෂණය තුළදී මේ සඳහා විශේෂ අවධානය යොමු විය. සමීක්ෂණය තුළින් හෙළිවන පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි විදුලි බලය ලබාගෙන නොමැති පිරිසෙන් සියයට 39.2 පමණ මීටර 600 ට වැඩි දුරින් පිහිටි නිවාසයන්ය. සියයට 19 පමණ මීටර 100 හෝ ඊට අඩු දුරින් පිහිටි නිවාසයන්ය. තව දුරටත් විග්‍රහ කිරීමේදී සමීක්ෂණයෙන් හෙළිවන පරිදි නිවාසයන්ගෙන් සියයට 50 පමණ ආසන්නතම විදුලි කණුවට මීටර 600 ට වඩා අඩු දුරින් පිහිටයි.

## 4.7 සංඛ්‍යා සටහන

**ආසන්නතම විදුලි කණුවට ඇති දුර අනුව විදුලි බලය නොමැති නිවාස ව්‍යාප්තිය**

| දුර (මීටර්) | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 100 <= | 27 | 18.9 |
| 100 <= 200 | 14 | 9.8 |
| 200 <= 400 | 9 | 13.3 |
| 400 <= 600 | 12 | 8.4 |
| 600 < | 56 | 39.2 |
| සඳහන් නොවූ | 15 | 10.5 |
| එකතුව | 143 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

විදුලිබලය ලබා නොගත් නිවාස සම්බන්ධයෙන් තවදුරටත් විග්‍රහ කර බැලීමේදී ඉන් සියයට 9.1 ක් ප්‍රදේශයට විදුලිබලය සපයා තිබුනද ආර්ථික අපහසුතා මත ලබාගෙන නොමැත. සියයට 7.7 ක් නිවාස විදුලිබලය ලබාගැනීමට සුදුසු තත්ත්වයේ නොමැති එනම් තාවකාලික මට්ටමේ නිවාසයන්ය. විදුලිබලය ලබා නොගැනීම සඳහා වැඩි පිරිසකගේ හේතුව ප්‍රදේශයට විදුලි බලය සපයා නොමැති වීමයි. එය සියයට 79 ක ප්‍රතිශතයකි.

4.8 සංඛ්‍යා සටහන

**විදුලි බලය ලබා නොගැනීමට හේතු**

| හේතුව | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ආර්ථික අපහසුතා | 13 | 9.1 |
| තාවකාලික නිවාස | 11 | 7.7 |
| ප්‍රදේශයට සපයා නැත | 113 | 79.0 |
| ඉල්ලුම් කලද නොලැබුනු | 2 | 1.4 |
| සඳහන් නොකළ | 5 | 3.5 |
| එකතුව | 143 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

නිවසෙහි ආහාර පිළියෙළ කර ගැනීම සඳහා යොදා ගන්නා බලශක්ති මූලය පිළිබඳව සැළකීමේදී සමීක්ෂණයට ලක්කළ නිවාස වලින් සියයට 98.5 ක් දර භාවිතා කරයි. ප්‍රදේශයේ පවත්නා පාරිසරික වටපිටාව මත දර පහසුවෙන් ලබාගත හැකි අතර එය ඉතාම ලාභදායී මාර්ගයද වේ. ඉතිරි සියයට 1.5 ආහාර සැකසීම සඳහා ගෑස් භාවිතයට යොමු වී ඇත.

**4.5 නිවාස සඳහා ජල පහසුකම්**

නිවාස සඳහා ජල පහුසකම් යටතේ පානීය හා අනෙකුත් අවශ්‍යතා සඳහා ජලය සපයාගන්නා මාර්ගය හා එහි යෝග්‍යතාව යන අංශ වෙත අවධානය යොමුවිය. ජනතාවගෙන් කොතරම් ප්‍රතිශතයකට පිරිසිදු සෞඛ්‍ය ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශවීමේ හැකියාව පවතීද යන්න ඉතා වැදගත් දර්ශකයක් වන අතර එය ජාත්‍යන්තර වශයෙන්ද පිළිගත් සම්මතයකි. මෙකී තත්ත්වය මත පදනම්ව මූලික සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී ජනතාවගේ ජල භාවිතය වැසි කාලය හා වියළි කාලය යන අවස්ථාවන්ට අනුව වෙන්කොට පානීය හා නෑම, රෙදි සේදීම වැනි අනෙකුත් අවශ්‍යතාවයන් එකී කාල වකවානු තුළ සපුරාගන්නා මූලයන්ට අනුව වෙන්කොට තොරතුරු රැස් කරනු ලැබිය. වැසි කාලය හා වියළි කාලය අනුව ජලයෙහි සෞඛ්‍ය ආරක්ෂකභාවය පිළිබඳව ජනතාවගේ අදහස්වලටද මෙහිදී ප්‍රමුඛත්වයක් ලබාදුණි.

සමීක්ෂණයෙන් හෙළිවන පරිදි බැදිගම්තොට ගම්මානයේ පවුල්වලින් සියයට 96ක් වැසි කාලයේදී තම මූලික අවශ්‍යතාවයක් වන පානීය ජලය සපයාගනු ලබන්නේ ළිං ආශ්‍රයෙනි. එය තමාගේම ළිඳ, පොදු ළිඳ හෝ අසල් වැසි ළිඳ වශයෙන් විවිධ වේ. ගම්මානය තුළ දැනට නළ ළිං 06 ක් ඉදිකර ඇති අතර ඉන් වැසි කාලයේදී පානීය ජල අවශ්‍යතාව සපුරාගනු ලබනුයේ සියයට එකක් වැනි ප්‍රතිශතයකි. ඇල දොළ ගංගා හා වැව් යන මූලයන්ගෙන් සියයට 02 ක පමණ ප්‍රතිශතයක් වැසි කාලයේදී පානිය ජල අවශ්‍යතා සපුරා ගන්නා අතර සියයට 1 වැනි සුළු පිරිසක් ජල බවුසර් මඟින් සපයන ජලය මත යැපේ.

වියළි කාලයේදි පානීය ජල අවශ්‍යතාවය සපුරා ගන්නා මූලයන් සුළු වෙනස් වීමකට ලක්වන අතර ළිං ආශ්‍රයෙන් ජලය සපයා ගන්නා ප්‍රතිශතය සියයට 96 සිට 92 දක්වා පහළ බසී. පොදු නල ළිං මඟින් ජලය සපයා ගන්නා

ප්‍රතිශතය සියයට 1 සිට 2 දක්වා ඉහළ යන අතර ඇල දොළ ගංගා හා වැව් වැනි මූලයන්ට යොමුවන පිරිසද සියයට 2 සිට 3 දක්වා ඉහළ යයි. බවුසර් මගින් සපයනු ලබන ජලය මත මූලික ලෙස යැපෙන ප්‍රතිශතය සියයට 01 සිට 03 දක්වා වර්ධනය වීමක් පෙන්වයි. මෙකී වර්ධනයන් මගින් ඉතා පැහැදිලි වනුයේ ළිං ජලය වියළි කාලය තුළදී ඉතා පහළ මට්ටමකට වැටෙන අතර ඒ හේතුවෙන් වෙනත් මූලාශ්‍ර වෙත යොමුවීම ඉහළ යන බවයි. මෙහිදී සඳහන් කළ යුතු ඉතා වැදගත් කරුණක් වනුයේ වියළි කාල පරාසය කෙතරම් දිගු හා කෙතරම් බලපෑමක් ඇති වන්නේද යන්නයි. එය ඉතා දැඩි නියං තත්ත්වයක් දක්වා වර්ධනය වුවහොත් අනිවාර්යයෙන්ම ප්‍රදේශයට සපයනු ලබන ජලය මත පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමට ගම්වාසීන්ට සිදුවෙයි.

නෑම සහ රෙදි සේදීම වැනි අනෙකුත් අවශ්‍යතා සඳහා ජල භාවිතය වැසි කාලය අනුව වෙනසකට ලක් නොවන අතර ගම්මානයේ පවුල් වලින් සියයට 89.2 පමණ ඇල, දොළ, ගංගා හා වැව් යන මූලාශ්‍ර වෙත යොමු වේ. සියයට 10.2 ක් පමණ ළිං ජලය මගින් එම අවශ්‍යතාවයන් ඉටු කරගන්නා අතර එය තමාගේම ළිඳ භාවිතයෙන් සපුරා ගන්නා ප්‍රතිශතය 8.2 කි. පොදු ළිං හා අසල්වැසි ළිං මගින් නෑම හා රෙදි සේදිම වැනි අවශ්‍යතා සපුරා ගැනීම සියයට 1 බැගින් බෙදී යයි. සියයට 0.5 වැනි ඉතා සුළු පිරිසක් පොදු නළ ළිං මගින් ඉහත කී අවශ්‍යතා සපුරා ගනී.

### 4.9 සංඛ්‍යා සටහන

**ජලය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය අනුව පවුල් ව්‍යාප්තිය**

| ජල මූලාශ්‍රය | වැසි කාලය | | වියළි කාලය | |
|---|---|---|---|---|
| | පානීය අවශ්‍යතා % | නෑම/රෙදි සේදීම % | පානීය අවශ්‍යතා % | නෑම/රෙදි සේදීම % |
| තමාගේම ළිඳ | 22.0 | 8.3 | 20.5 | 8.3 |
| පොදු ළිඳ | 16.0 | 1.0 | 16.0 | 1.0 |
| අසල්වැසි ළිඳ | 58.0 | 1.0 | 55.6 | 1.0 |
| පොදු නළ ළිඳ | 1.0 | 0.5 | 2.0 | 0.5 |
| ඇල,දොළ,ගංගා,වැව් | 2.0 | 89.3 | 2.9 | 89.2 |
| ජල බවුසර් | 1.0 | - | 3.0 | - |
| එකතුව | 100 | 100 | 100 | 100 |

**මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

4.10 සංඛ්‍යා සටහන

පානීය ජලය සපයා ගන්නා ළිඳ හෝ වෙනත් ජල මූලාශ්‍රයට ඇති දුර අනුව පවුල් ව්‍යාප්තිය (තමාගේ ළිඳ හැර)

| දුර (කි.මී) | වියළි කාලය | | වැසි කාලය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 0<= ¼ | 62 | 38.0 | 64 | 40.0 |
| 1/4 <=1/2 | 37 | 22.7 | 45 | 27.0 |
| 1/2 <=3/4 | 2 | 1.2 | 4 | 2.5 |
| 3/4<=1 | 47 | 28.8 | 40 | 25.0 |
| 1<=1.5 | 5 | 3.1 | 3 | 1.9 |
| 1.5<=2 | 5 | 3.1 | 2 | 1.3 |
| 4 ට වැඩි | 5 | 3.1 | 2 | 1.3 |
| එකතුව | 163 | 100 | 160 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – **2006**

පානීය ජලය සපයා ගන්නා මූලාශ්‍රය වෙත ඇති දුර අනුව පවුල් ව්‍යාප්තිය 4.10 සංඛ්‍යා සටහන මගින් දැක්වේ. ඉන් පැහැදිලි වන පරිදි බැදිගම්තොට ගම්මානයේ පවුල් වලින් 68% ක් පමණ වැසි කාලය තුළදී මූලික ජල මූලාශ්‍රය කි.මී. 1/2 හෝ ඊට අඩු දුරකින් පිහිටයි. වියළි කාලයේදී එය 60.7% දක්වා පහළ වැටෙන අතර 7% ක පමණ පිරිසකට වැසි කාලයේ ජලය ලබාගත් මූලාශ්‍රයට වඩා වැඩි දුරක් ගමන් කිරීමට සිදු වේ. සමීක්ෂණය තුළින් හෙළිවන පරිදි බැදිගම්තොට ගම්මානයේ පවුල් වලින් 96% පමණ වැසි කාලය තුළදී කි.මී. 1 හෝ ඊට අඩු 36 ප්‍රමාණයක් තුළින් පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීමේ හැකියාව පවතී.

වියළි කාලය තුළදී එය 91% දක්වා පහළ වැටෙන අතර කි.මී. 1 ඉක්මවා යන දුරක් 5% පමණ පිරිසකට ගමන් කිරීමට සිදු වේ. වැසි කාලය තුළදී කි.මී. 4 ඉක්මවා ජල මූලාශ්‍ර වෙත යොමු වන පිරිස වැසි කාලයේදී 1.3% වන අතර වියළි කාලයේදී එය 3.1% දක්වා ඉහල යයි. මේ අනුව ඉතා පැහැදිලි වන්නේ වැසි කාලය තුළදී පානීය ජල අවශ්‍යතාව සපුරා ගැනිම එතරම් දුෂ්කර කාර්යයක් නොවුනද වියළි කාල පරාසය තුළදී එම තත්ත්වය ඉතා දුෂ්කර බවයි.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජනතාව විවිධ ජල මූලාශ්‍ර වලින් සපුරා ගන්නා පානීය ජලයෙහි පවිත්‍රතාවය පිළිබඳ සමීක්ෂණය තුළදී විශේෂ අවධානය යොමු විය. මේ යටතේ ඔවුන් දැනට භාවිතා කරන පානීය ජලයෙහි පවිත්‍රතාවය පිළිබඳව සෑහීමකට පත් වන්නේද යන ප්‍රශ්නය යොමු කළ අතර එය වැසි කාලය හා වියළි කාලය වශයෙන් අවස්ථා දෙකකට බෙදා තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව පැහැදිලි වන්නේ ගම්මානයේ පවුල්වලින් 35% ක් පමණ වැසි කාලයේදී පිරිසිදු පානීය ජලය ලබා ගැනීමේ හැකියාව පවතින අතර එය වියළි කාලයේදී 25.9% දක්වා පහළ බසින බවයි. එහිම අනෙක් පැත්ත වනුයේ වැසි කාලයේදී බැදිගම්තොට ගම්මානයේ පවුල් වලින් 64.9% කට පිරිසිදු පානීය ජලය නොලැබෙන අතර එය වියළි කාලය වන විට 74.1% දක්වා ඉහළයන බවයි. මේ අනුව ඉතා පැහැදිලි වනුයේ සාමාන්‍ය වශයෙන් බැදිගම්තොට ගම්මානයේ පවුල් වලින් 70% කට පමණ පිරිසිදු පානිය



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

ජලය ලබාගැනිම ගැටළුවක්ව පවතින බවයි. දැනට ඔවුන් පානීය ජලය සපයා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර වන ළිං පිළිබඳ සැළකීමේදී ඒවා බොහොමයක් අනාරක්ෂිත විධිමත්ව සකස් නොකළ ඒවාය. අනෙක් අතින් ජලයේ පවිත්‍රතාවය හා ගුණාත්මක බව පහළ යාම කෙරෙහි වලවේ ගඟෙහි වැලි ගොඩදැමීම හේතුවක් වී ඇති බවද ගම්වාසීන් අතර පවත්නා මතයකි. ගං පතුල හෑරීම මගින් භූගත ජල මට්ටම පහළ යාමත් ජලයේ ලවනතාව ඉහළ යාමත් පානීය ජලය සම්බන්ධයෙන් වර්තමානයේ ගම්වාසීන් මුහුණදෙන ගැටළුකාරී තත්ත්වයන්ය. සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 98.7 කම යෝජනාව වනුයේ පිරිසිදු පානීය ජලය ලබාගැනීම සඳහා ප්‍රජා ජල ව්‍යාපෘතියක් මගින් නල ජලය ලබාදිය යුතු බවයි. මේ සඳහා දැනටමත් ගම්මනාය තුළ ආරම්භක පියවරක් තබා ඇති අතර එය විධිමත් කොට දැනට සියයට 70 කට පමණ අහිමිව ඇති පිරිසිදු පානීය ජලය ලබාගැනීමේ අවස්ථාව සියළු දෙනාටම හිමිකරදීමට කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

## 4.6 වැසිකිළි පහසුකම්

නිවාසවල භාවිතය සඳහා ඇති වැසිකිළි කෙතරම්දුරට සනීපාරක්ෂක ද යන්න ඉතා වැදගත් දර්ශකයකි. සමීක්ෂණය තුළදී මේ සඳහා අවධානය යොමු කළ අතර වැසිකිළිවල ස්වභාවය අනුව වර්ගීකරණයකට ලක්විය. සමීක්ෂණයෙන් හෙළි වූ පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි නිවාස වලින් සියයට 55.6 සෞඛ්‍යාරක්ෂක ජල මුද්‍රිත වැසිකිළි සහිත වෙයි. සියයට 43.9 ක් සෞඛ්‍ය ආරක්ෂිත නොවන වළ වැසිකිළි හෝ තාවකාලික වළ භාවිතා කරයි. සියයට 0.5 කට කිසිම ආකාරයක වැසිකිළියක් නොමැත. ග්‍රාමසේවා වසමෙහි නිවාස වලින් සියයට 44.4 සෞඛ්‍ය ආරක්ෂිත නොවන වැසිකිළි පරිහරණය කිරීම සැළකිල්ලට බඳුන් කළ යුතු කරුණකි. මෙම තත්ත්වය පහත හෙළීම සඳහා යම් වැඩපිළිවෙළක අවශ්‍යතාව දැඩිව පවතී.

### 4.11 සංඛ්‍යා සටහන

**වැසිකිළි ස්වරූපය අනුව පවුල් ව්‍යාප්තිය**

| වැසිකිළියේ ස්වරූපය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ජල මුද්‍රිත | 114 | 55.6 |
| වළ වැසිකිළි | 47 | 22.9 |
| තාවකාලික වළ | 43 | 21.0 |
| වැසිකිළි නොමැති | 1 | 0.5 |
| එකතුව | 205 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006

## 4.7 නිවෙස්වල ඇති ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජනතාව දෛනික අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා පරිහරණය කරනු ලබන භාණ්ඩ පිළිබඳව සමීක්ෂණය තුළදී අවධානය යොමු විය. සමීක්ෂණය තුළින් හෙළිවන පරිදි සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ගුවන් විදුලි යන්ත්‍රය පවුල්වලින් සියයට 88 ක් පමණ පරිහරණය කරයි. එය ප්‍රධාන සන්නිවේදන මාධ්‍ය බවට පත්වී තිබේ. පවුල්වලින් සියයට 65.9 රූපවාහිනී යන්ත්‍ර පරිහරණය කරයි. ගම්මානයෙන් වැඩි පිරිසකට

විදුලිබලය නොතිබුනද වෙනත් මාර්ගයන් මඟින් විදුලිය ලබාගනිමින් රූපවාහිනී යන්ත්‍ර පරිහරණයට ගම්වාසීන් යොමුවී ඇත. මදක් සුඛෝපභෝගී ගණයට වැටෙන ශීතකරණ, විදුලි පංකා, රයිස් කුකර් වැනි උපකරණ භාවිතය පහළ මට්ටම්වල පවතින අතර එය පිළිවෙලින් සියයට 4.9, 9.2 හා 1 යන අගයන් ගනී. මෙම තත්ත්වයන් පහළයාම කෙරෙහි ප්‍රදේශයේ වැඩි පිරිසකට විදුලි බලය නොමැති වීමද හේතුවක් විය හැක. පරිගණක යන්ත්‍ර සහිත නිවාස ප්‍රතිශතය ඉතාමත් පහළ අගයක් ගන්නා අතර එය සියයට 0.5 තරම් වූ ප්‍රතිශතයකි. 4.11 සංඛ්‍යා සටහන මඟින් ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය සහිත නිවාස ප්‍රතිශතයන් පිළිබඳ පැහැදිලි විස්තරයක් සැපයේ.

4.12 සංඛ්‍යා සටහන

**ගෘහ උපකරණ හිමිකාරීත්වය අනුව නිවාස ව්‍යාප්තිය**

| ගෘහ උපකරණ | පවුල් ප්‍රතිශතය |
|---|---|
| බිත්ති ඔරලෝසු | 92.2 |
| පැට්‍රල් මැක්ස් ලාම්පු | 27.8 |
| ගුවන් විදුලි යන්ත්‍ර | 43.9 |
| කැසට් රෙකෝඩර් ගුවන් විදුලි යන්ත්‍ර | 44.44 |
| රූපවාහිනී යන්ත්‍ර | |
| අල්මාරි | 65.9 |
| පුටු කට්ටල | 38.5 |
| ශීතකරණ | 42.9 |
| VCD/DVD | 4.9 |
| මහන මැෂින් | 4.9 |
| පරිගණක | 34.6 |
| ගෑස් උදුන් | 0.5 |
| රයිස් කුකර් | 3.9 |
| විදුලි පංකා | 1 |
| ගෘහස්ථ | 9.2 |
| | 4.7 |

**මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - පෙ.කො.ගො.ප.පු.ආ. – 2006**

## 4.8 ගමනාගමන හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය

මූලික සමාජ ආර්ථික සමීක්ෂණයෙන් හෙළිවන පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජනතාව තම දෛනික අවශ්‍යතා වෙනුවෙන් ප්‍රවාහන හා ගමනාගමන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ප්‍රධාන ලෙසම භාවිතා කරන මාධ්‍ය වනුයේ පා පැදියයි. සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 90.7 කට පමණ පාපැදි හිමිකාරීත්වය තිබෙන අතර බොහෝ පවුල්වල පාපැදි පැදිය හැකි සියළු දෙනාටම පාපාදිය බැගින් තිබීම සුවිශේෂත්වයකි. පවුල් වලින් සියයට 18 කට පමණ යතුරුපැදි හිමිකාරීත්වය ඇති අතර බොහෝ විට එක් පවුලකට ඇත්තේ එක් යතුරුපැදියක් පමණි. වර්තමානයේ ග්‍රාමීය සහ නාගරික යන භේදයකින් තොරව ඉතා ප්‍රචලිත ප්‍රවාහන මාධයයක් වන ත්‍රී රෝද

රථ හිමි පවුල් ප්‍රතිශතය සියයට 4.4 කි. බස්රථ හා වෑන්රථ වැනි මිල අධික වාහන හිමි පවුල් ප්‍රතිශතය සියයට 0.5 වැනි ඉතා සුළු ප්‍රමාණයකි. මේ අනුව පැහැදිලි වන්නේ ප්‍රදේශයේ භෞතික පරිසරයට ගැළපෙන පරිදි හා ජනතාවගේ ආදායම් මට්ටම් මත ඔවුන්ගේ ප්‍රවාහන අවශ්‍යතාවලින් වැඩි කොටසක් පාපැදි මගින් ඉටුකර ගන්නා බවයි.

## 4.9 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර

බැදගම්තොට ග්‍රාම නිලධාරී වසම කෘෂිකර්මය මත පදනම් වන ගම්මානයක් වශයෙන් එහි පවුල් සතුව පවත්නා කෘෂි උපකරණ වර්ග හා කෙතරම් ප්‍රතිශතයකට ඒවා හිමිව පවතින්නේද යන්න වැදගත්ය. සමීක්ෂණය තුළදී ප්‍රධාන කෘෂි උපකරණ පිළිබඳව අවධානය යොමු විය. එයින් පෙනීයන පරිදි ගම්මානයේ පවුල්වලින් සියයට 99 පමණ කෘෂි කාර්මික අවශ්‍යතා සඳහා භාවිතා කරනු ලබන උදළු හිමිකම ඇති අතර බොහෝ පවුල් උදළු දෙක හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සතුව තිබේ. මෙයට අමතරව දියර ඉසින යන්ත්‍ර හා ජල පොම්ප වැනි කෘෂි උපකරණ බහුලව ඇති අතර එය පිළිවෙළින් සියයට 44.9 හා 80.7 වශයෙන් පවුල්වල ප්‍රතිශතක නියෝජනයක් දක්වයි. බැදිගම්තොට ප්‍රදේශයේ ගොවීන් තම වගාවන් සඳහා බොහෝ දුර බැහැරින් ජලය පොම්පකර ලබාන්නා බැවින් මෙම අගය සැළකිය යුතු මට්ටමක් ගෙන තිබේ. රෝද දෙක අත් ට්‍රැක්ටරයද සැළකිය යුතු මට්ටමකින් ඇති අතර එය පවුල්වලින් සියයට 11.7 ක තරම් ප්‍රතිශතයක නියෝජනයක් දක්වයි. රෝද දෙක අත් ට්‍රැක්ටරය කෘෂි කාර්මික බිම් සැකසීම වැනි අවශ්‍යතාවලට අමතරව කෘෂි යෙදවුම් වර්ග ප්‍රවාහනය හා නිමැවුම් වෙළඳපොළ කරා ප්‍රවාහනයේදී බහුල වශයෙන් යොදා ගනී. 4.12 සංඛ්‍යා සටහන කෘෂි උකරණ වර්ග හිමිකාරිත්වය අනුව පවුල් ව්‍යාප්ත වී ඇති ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් සපයයි.

4.13 සංඛ්‍යා සටහන

**කෘෂි උපකරණ හිමිකාරිත්වය අනුව පවුල් ව්‍යාප්තිය**

| කෘෂි උපකරණ/ යන්ත්‍ර | පවුල් ප්‍රතිශතය |
|---|---|
| උදළු | 99 |
| යකඩ නගුල් | 5.9 |
| ට්‍රැක්ටර් (රෝද 2) | 11.7 |
| ට්‍රැක්ටර් (රෝද 4) | 2.4 |
| දියර ඉසින යන්ත්‍ර | 44.9 |
| කොළ මඩින යන්ත්‍ර | 2.9 |
| ජල පොම්ප | 30.7 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006

4.10 සෞඛ්‍ය තත්ත්වය

බැඳිගම්තොට ගම්මානයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව විමසීමේදී පසුගිය වසර දෙකක කාලය තුළ බෝවන රෝග වැළඳීම යහපත් හා අයහපත් සෞඛ්‍ය පුරුදු යන අංශ කෙරෙහි අවධානය යොමු විය.

සමීක්ෂණයෙන් හෙළිවූ පරිදි ග්‍රාම නිලධාරී වසමෙහි පවුල් වලින් සියයට 93.2 කට කිසිදු බෝවන රෝගයක් පසුගිය වසර දෙකක කාලය තුළ වැළදී නැත. පවුල්වලින් සියයට 5.9 කට වෛරස් උණ වැළදී ඇති අතර එය ගම්මානයේ වාර්තා වූ ප්‍රධාන බෝවන රෝගයයි. ඉතිරි සියයට එකක් පමණවූ ප්‍රමාණය කම්මුල්ගාය හා පැපොල යන රෝග වැළදීම අතර සමානව බෙදීයයි. සමීක්ෂණයෙන් හෙළිවන තොරතුරුවලට අනුව පැහැදිලි වනයේ ගම්මානයේ ජනතාව බෝවන රෝගවලට ලක්වීමේ ප්‍රවණතාව පහළ මට්ටමක පවතින බවයි.

4.14 සංඛ්‍යා සටහන

**යහපත් හා අයහපත් සෞඛ්‍ය පුරුදු අනුව පවුල් ව්‍යාප්තිය**

| සෞඛ්‍ය පුරුදු | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| පානිය ජලය උණුකර බීම | 22 | 10.7 |
| නිතර පළතුරු අනුභවය | 156 | 76.1 |
| බුලත්විට කෑම | 125 | 61.0 |
| මත්පැන් පානය | 42 | 20.5 |
| දුම් පානය | 91 | 44.4 |

**මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - 2006**

4.13 සංඛ්‍යා සටහන ගම්මානයේ ජනතාවගේ යහපත් හා අයහපත් සෞඛ්‍ය පුරුදු පිළිබඳ තත්ත්වය නිරූපනය කරයි. මෙයින් පැහැදිලි වනුයේ ගම්මානයේ අති බහුතරයක් වූ පවුල් සංඛ්‍යාවක් පානීය ජලය උණුකර පාවිච්චි නොකරන බවයි. එය සියයට 89.3 කි. මෙවැනි තත්ත්වයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සෞඛ්‍ය අංශවල වගකීමක්ද වනු ඇත. ප්‍රදේශයේ පලතුරු සුලභතාවය හා මිල ගණන් සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම හේතුවෙන් නිතර පලතුරු අනුභවය ඉහළ මට්ටමක පවතින අතර එය සියයට 76 තරම් වූ මට්ටමකි. ශරීර සෞඛ්‍යයට අහිතකර ලෙස සැළකෙන බුලත්විට, මත්පැන් හා දුම් පානය වැනි පුරුදු සඳහා එක් සාමාජිකයෙකු හෝ යොමුවී ඇති පවුල් ප්‍රතිශතයන් පිළිවෙලින් සියට 61.0 හා 44.4 යන අගයන් ලබාගෙන ඇත. මෙයින් පැහැදිලි වනුයේ බුලත්විට කෑම හා දුම් පානය ප්‍රදේශයේ පවුල් අතර සුලබ කරුණක් බවයි. බුලත්විට කෑමට යොමුවී ඇති පවුල් අතර එහි සාමාන්‍ය අගය 1.38 ක අගයක් වාර්තා වෙයි. මෙයින් පැහැදිලි වනුයේ පවුලක සාමාජිකයන් එකකට වැඩි සංඛ්‍යාවක් බුලත් කෑමට හුරුවී ඇති බවයි. බොහෝ පවුල්වල එය දෙකකි. මත් පැන් පානයෙහි යෙදෙන පවුල් අතර එහි සාමාන්‍ය අගය 1.05 ක අගයක් ගෙන ඇත. එනම් ආසන්න වශයෙන් එකකි. බොහෝවිට පවුල්වල එක් අයෙකු මත්පැන් පානයට යොමුවී ඇති අතර ඔහු බොහෝවිට ගෘහ මූලිකයා වීමද සුවිශේෂත්වයකි. දුම්පානයෙහි සාමාන්‍ය අගය ද 1.08 ක් නැතහොත් එකට ආසන්න අගයක් ගෙන තිබේ. එහි තත්ත්වයද මත්පැත් පානයෙහි තත්ත්වයට බොහෝ සෙයින් සමානවන අතර දුම් පානයෙහි යෙදෙන්නන් සහිත පවුල්වල බොහෝවිට ඇත්තේ එක් අයෙකු පමණක් වන අතර ඔහු ගෘහ මූලිකයාද වෙයි.

### 4.11 ගමනාගමන හා සේවා යටිතල පහසුකම්

මෙම කොටස යටතේ බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජනතාව සඳහා සපයා ඇති භෞතික යටිතල පහසුකම් කෙරෙහි අවධානය යොමු කරයි. මේ යටතේ මාර්ග, සන්නිවේදනය හා සේවා යන අංශ කෙරෙහි අවධනාය යොමු වේ.

බැදිගම්තොට ගම්මානයෙහි මාර්ග පද්ධතිය පිළිබඳව සළකා බැලීමේදී එහි කිසිදු මාර්ගයක් ගල් අතුරා තාර දමා සකසා නොමැත. ග්‍රාම නිලධාරී වාර්තා මගින් හෙළිවන පරිදි ගම්මනායේ තාර නොයෙදූ බොරළු මාර්ගවල දුර ප්‍රමාණය කි.මී. 12 ක් පමණ වේ. මෙයට අමතරව කරත්ත පාර කි.මී. 20 පමණ ගම්මානය පුරා විසිරී යන පරිදි විවිධ දිශාවන්ට විහිදී පවතී.

ගම්මානය ආවරණය වන පරිදි පොදු ප්‍රවාහන සේවාවක් ක්‍රියාත්මක නොවන අතර ආසන්නතම බස් මාර්ගය ගම්මානයේ මායිමේ සිට කි.මී. 02 පමණ දුරකින් පිහිටා ඇත. ගම්මානයේ ජනතාවට විවිධ සේවා සපයන ආයතන සඳහා ඇති දුර 4.14 සංඛ්‍යා සටහනකින් පෙන්නුම් කෙරෙන අතර ඒ අනුව පැහැදිලි වන්නේ බොහෝ සේවා ආයතන කි.මී. 10 පමණ දුරින් පිහිටි ප්‍රධාන නගරය වන සූරියවැව තුළ පිහිටා ඇති බවයි.

භෞතික යටිතල පහසුකම් යටතේ වැදගත්වන විදුලි බලය සම්බන්ධයෙන් සැළකීමේදී එමගින් ආවරණය වනුයේ ගම්මානයේ සුළු ප්‍රමාණයකි. එය සුළු පරිමාණ ස්වයං රැකියා හා කුඩා කර්මාන්ත ආරම්භ කිරීමේදි ප්‍රධාන බාධකයක්ව පවතී. රැහැන් දුරකථන පහසුකම් ද ප්‍රදේශයට ලැබී නොමැත.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම ප්‍රධාන ලෙසම කෘෂිකර්මය මත පදනම්වන්නකි. මේ අනුව භෞතික යටිතල පහසුකම් යටතේ ජල සම්පාදනය යන අංශය කෙරෙහිද විශේෂ සැළකිල්ල යොමු කළ යුතුය. ග්‍රාම නිලධාරී වසමෙන් වැඩි කොටසක් මහවැලි පාලනය යටතට වැටෙන අතර මහවැලි නව සංවර්ධන වැඩසටහනත් සමග ජල ගබඩා වැව් 04 ක්ද ගම තුළ ඉදිකර ඇත. බැදිගම්තොට වැව, අංක 02 වැව, අංක 03 වැව හා අංක 05 වැව වශයෙන් ඒවා හඳුන්වනු ලබන අතර එමගින් ජල සම්පාදන කටයුතු සිදුවේ. ඊට අමතරව ප්‍රයෝජනයට නොගන්නා කිසිදු වැවක් හෝ අමුනක් ප්‍රදේශය තුළ පිහිටා නොමැත.

ගම තුළ පිහිටි විශේෂ ගොඩනැගිලි සම්බන්ධයෙන් සැලකීමේදී රජයට අයත් පොහොර ගබඩාවක් ගම තුළ පිහිටා තිබෙන අතර එය මේ වනවිට ප්‍රයෝජනයට ගන්නා තත්ත්වයේ පවතී.

### 4.2 භෞතික සම්පත්

කෘෂිකාර්මික කටයුතු සඳහා ගැළපෙන ස්වභාවිකව පිහිටා ඇති සාරවත් පස ගම තුළ ඇති ප්‍රධානතම භෞතික සම්පතයි. එයට අමතරව සුවිශේෂයෙන් සඳහන් කළහැකි භෞතික සම්පත් ගම තුළ පිහිටා නැත.

4.15 සංඛ්‍යා සටහන

සේවා සපයන ආයතන පිහිටි දුර අනුව

| | ආයතනය | ගම් මායිමේ සිට දුර කි.මි. |
|---|---|---|
| 1 | ගොවි ජනසේවා මධ්‍යස්ථානය | 20 |
| 2 | පශු වෛද්‍ය කාර්යාලය | 09 |
| 3 | තැපැල් හල | 03 |
| 4 | සමුපකාර බැංකුව | 03 |
| 5 | ලංකා බැංකුව | 10 |
| 6 | රෝහල | 10 |
| 7 | ඩිස්පැන්සරිය | 10 |
| 8 | පෞද්ගලික වෛද්‍යවරු | 10 |
| 9 | සතිපොළ | 10 |
| 10 | ආසන්නතම බස් පාර | 02 |
| 11 | මාතෘ සායනය | 02 |
| 12 | උසස් පෙළ කලා විෂය ධාරාව ඇති පාසල | 03 |
| 13 | උසස් පෙළ විද්‍යා විෂය ධාරාව ඇති පාසල | 10 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. – 2006

පස්වන පරිච්ඡේදය

# ඉඩම් අයිතිය, භුක්තිය හා සංවර්ධනය කිරීම

පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී ඉඩම් අයිතිය, භුක්තිය හා සංවර්ධනය කිරීම යන අංශ කෙරෙහි විශේෂ අවධානය යොමු විය. ඉඩම් යනු ප්‍රධාන වත්කමකි. ඉඩම් හිමිකාරිත්වය යන සාධකය ඉතා වැදගත් වන අතර එය සමාජ තත්ත්වය තීරණය වීම කෙරෙහිද සෘජුව බලපායි. මේ අනුව කෙතරම් ඉඩම් ප්‍රමාණයක් පවුල් ඒකකයක් සතුව පවතින්නේද යන්න හා එය කුමන කටයුතු සඳහා යොදා ගන්නේද යන්න ඉතා වැදගත්ය. මෙකී අංශ කෙරෙහි සමීක්ෂණය තුළදී මූලික අවධානය යොමු වූ අතර මෙම පරිච්ඡේදය තුළදී එකී කරුණු වෙන් වෙන් වශයෙන් විශ්ලේෂණයට ලක්වේ.

## 5.1 පවුල් ඒකකයක් භුක්තිවිඳින ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය

මූලික සමාජ ආර්ථික සමීක්ෂණයෙන් හෙළිවන පරිදි බැදිගම්තොට ගම්මානයේ ජනතාව පරිහරණය කරන ඉඩම් එහි ස්වභාවය අනුව කාණ්ඩ තුනකට ගොනු කළ හැක. එනම්, මඩ ඉඩම් හෙවත් කුඹුරු ඉඩම්, ගොඩ ඉඩම් හා ගෙවතු වශයෙනි. මෙහිදී ගෙවත්ත ලෙස අර්ථ දක්වා ඇත්තේ ස්ථිරව පදිංචි නිවස අයත් වන භූමිය වන අතර ඒ තුළ කිසියම් ආකාරයක වගාවකට හෝ වෙනත් ව්‍යාපාරික අවශ්‍යතාවයකට යොදා ගැනීමට ඇති හැකියාව පිළිබඳව ද අවධානය යොමු විය. සමීක්ෂණයෙන් හෙළිවන පරිදි බැදිගම්තොට ගම්මානයේ පවුල්වලින් සියයට 72 කට කුඹුරු ඉඩම් හිමිකාරිත්වය ඇත. එමෙන්ම සියට 88කට නිවස පිහිටි භූමිය තුළ කුමන හෝ වගාවක් හෝ ව්‍යාපාරික කටයුත්තකට යොදා ගැනීමේ හැකියාව පවතී. එනම් ගෙවතු ලෙස පවතී. ගම්මානයේ ජනතාවගෙන් සියයට 47කට ඉහත සඳහන් කළ කොටස්වලට අයත් නොවන ගොඩ ඉඩම් හිමිකාරිත්වය පවතී. එය බොහෝ විට වෙන් වශයෙන් පිහිටි ඉඩමිය. 5.1 සංඛ්‍යා සටහන ඉඩම්වල ස්වරූපය හා ප්‍රමාණය අනුව පවුල් ව්‍යාප්ත වන ආකාරය පෙන්නුම් කෙරේ.

**5.1 සංඛ්‍යා සටහන**

**ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය අනුව පවුල් ව්‍යාප්තිය**

| ප්‍රමාණය (අක්කර) | ඉඩමේ ස්වභාවය | | | | | |
|---|---|---|---|---|---|---|
| | කුඹුරු | | ගෙවතු | | ගොඩ ඉඩම් | |
| | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| 0.25 ට අඩු | 9 | 6.1 | 36 | 20.0 | 14 | 14.6 |
| 0.25<0.5 | 22 | 15.0 | 9 | 5.0 | 3 | 3.1 |
| 0.5<=1 | 31 | 21.1 | 77 | 42.8 | 36 | 37.1 |
| 1<=2 | 82 | 55.8 | 52 | 28.9 | 40 | 41.7 |
| 2<=5 | 3 | 2.0 | 6 | 3.3 | 3 | 3.1 |
| එකතුව | 147 | 100 | 180 | 100 | 96 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - 2006

5.1 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි ගම්මානයේ කුඹුරු ඉඩම් හිමි පිරිසෙන් සියයට 58 කට පමණ අක්කර 10 වැඩි ඉඩම් ප්‍රමාණයක් අයිතිය පවති. එය සැළකිය යුතු ප්‍රමාණයකි. එමෙන්ම ගෙවතු ඉඩම් හිමි පිරිසෙන් අති බහුතරයකට එනම් සියයට 75කට පමණ අක්කර භාගයට වැඩි ඉඩම් පරිහරණය කිරීමේ හැකියාව ලැබී තිබේ.

මෙයින් පැහැදිලි වන්නේ ගම්මානයෙන් අති බහුතරයකට ප්‍රමාණයෙන් විශාල ඉඩම් හිමි බවයි. එය නීත්‍යානුකූල අයිතියද නැතහොත් අනවසරද යන්න මෙහිදී සැළකිල්ලට බඳුන් නොකළ අතර පරිහරණය කරනු ලබන ප්‍රමාණය පිළිබඳව විශේෂ අවධානය යොමු විය. ගොඩ ඉඩම් සම්බන්ධයෙන් සැළකීමේදී ද පවුල්වලින් සියයට 82කට පමණ අක්කර භාගයට වැඩි ඉඩම් පරිහරණයට අවස්ථාව ලැබී තිබේ. වඩා විශාල ඉඩම් ලෙස සැළකිය හැකි අක්කර 2-5 අතර ප්‍රමාණයන් හිමි පිරිස ඉතා කුඩා අගයක් ගනී. එය කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් සැළකීමේදී සියයට 2ක පමණ වන අතර ගෙවතු හා මඩ ඉඩම් සම්බන්ධයෙන් සියයට 3ක පමණ මට්ටමෙහි පවතී.

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි පවුලක් භුක්ති විඳින සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය සම්බන්ධයෙන් සැළකීමේදී ගොඩ, මඩ හා ගෙවතු වශයෙන් එහි සුළු වෙනස්වීමක් පෙන්නුම් කෙරෙයි. කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් සැළකීමේදී එහි පවුලක් භුක්ති විඳින සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය අක්කර 1.45 කි. ගෙවතු සම්බන්ධයෙන් එය අක්කර 1.12 වන අතර ගොඩ ඉඩම් සම්බන්ධයෙන් අක්කර 1.29 ක් අගයක් ගනී. මෙයින් පැහැදිලි වන්නේ සාපේක්ෂ වශයෙන් සැළකීමේදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ජනතාව සාමාන්‍ය වශයෙන් ගොඩ, මඩ හා ගෙවතු ආදී ස්වරූප ගන්නා ඉඩම් අක්කරයකට වැඩි ප්‍රමාණයක් පරිහරණය කරනු ලබන බවයි.

## 5.2 පරිහරණය කරනු ලබන ඉඩම්වල අයිතියේ හා භුක්තියේ ස්වභාවය

බැදිගම්තොට ජනතාව පරිහරණය කරනු ලබන ඉඩම් වල අයිතිය හා භුක්තියේ ස්වරූපය කෙබඳුද යන්න මෙම කොටස තුළදී සාකච්ඡාවට බඳුන් වේ. මෙහිදී සමස්ථයක් ලෙස ගමේ පවතින මුළු ඉඩම් ප්‍රමාණය කුමානාකාරයෙන් බෙදී පවතීද යන්න මූලික අවධානයට යොමු විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දත්තයන්ට අනුව ගම්මානයේ සමස්ත ඉඩම් ප්‍රමාණය බෙදී යන ආකාරය අංක 5.2 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

**අංක 5.2 සංඛ්‍යා සටහන**

**මුළු ඉඩම් බෙදී යාම - බැදිගම්තොට**

| අයිතිය | අක්කර ප්‍රමාණය | ප්‍රතිශතය |
|---|---|---|
| නින්දගම් | 150 | 8.3 |
| දිශාපති පාලන ඉඩම් | 160 | 8.8 |
| මහවැලි පාලන ඉඩම් | 1500 | 82.9 |
| ගොඩ | 300 | |
| මඩ | 1200 | |
| එකතුව | 1810 | 100 |

**මූලාශ්‍රය : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - සූරියවැව**

අංක 5.2 සටහනට අනුව පෙනී යන්නේ ගම්මානයේ සමස්ථ ඉඩම් ප්‍රමාණයෙන් සියයට 82.9 පමණ මහවැලි පාලනයට යටත් බවයි. ඉතිරි සියයට 17.1 දිසාපති පාලනයට අයත්වන අතර ඒ තුළ නින්දගම් වශයෙන් පවතින සියයට 8.3 ක භූමි ප්‍රමාණයද අන්තර්ගතය. මෙම නින්දගම් ඉඩම් ලෙස ජන ව්‍යවහාරයේ පවතිනුයේ ඉඩම් ප්‍රතිසංස්කරණ හේතුවෙන් පෞද්ගලික ඉඩම් රජයට පවරාගැනීමෙන් අනතුරුව පෞද්ගලිකව රඳවා ගැනීම සඳහා හැකියාව ලැබූ අක්කර 50 බැගින්වූ කොටස් තුනකි. මෙම ඉඩම් සඳහා නීත්‍යානුකූල හිමිකරුවන් සිටින නමුත් ගම්වාසීන් අනවසරයෙන් පදිංචි වී ඇත.

බොහෝ දෙනෙක් අනවසරයෙන් මෙම ඉඩම්වල ස්ථිර නිවාස හා ස්ථිර වගාවන් පවත්වාගෙන යයි. දිසාපති පාලනය ලෙස සළකනුයේ පාරම්පරිකව සින්නක්කර උරුමයන් මත ගමේ ජනතාවට හිමි ඉඩම් හා රජය සතු ඉඩම්ය. මුළු ඉඩම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගත්විට එය සියයට 8.8 කි.

සමීක්ෂණයෙන් හෙළිවන දත්තයන්ට අනුව බැදිගම්තොට ගම්මානයේ ඉඩම් අයිතිය හා භුක්තිය ඉඩම්වල ස්වරූපය අනුව බෙදී ගිය ආකාරය අංක 5.3 සටහන මඟින් පෙන්නුම් කෙරේ.

**අංක 5.3 සංඛ්‍යා සටහන**

**ඉඩම් අයිතිය හා ස්වරූපය අනුව පවුල් ව්‍යාප්තිය**

| අයිතිය | ඉඩම්වල ස්වරූපය | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගොඩ ඉඩම් | | මඩ ඉඩම් | | ගෙවතු ඉඩම් | |
| | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
| තනි අයිතිය | 34 | 35.4 | 59 | 40.1 | 70 | 38.9 |
| හවුල් අයිතිය | 5 | 5.2 | 3 | 2.0 | 7 | 3.9 |
| අනවසර (පෞද්ගලික) | 2 | 5.2 | 3 | 2.0 | 14 | 7.8 |
| අනවසර (රජයේ) | 8 | 8.3 | 3 | 2.0 | 18 | 10.0 |
| බද්දට ගත් | 9 | 9.3 | 17 | 11.6 | - | - |
| ස්වර්ණ භූමි/ජය භූමි | 19 | 19.8 | 19 | 12.9 | 15 | 8.3 |
| තාවකාලික බලපත්‍ර | 15 | 15.0 | 43 | 29.3 | 36 | 20.0 |
| නින්දගම් | 3 | 3.1 | - | - | 14 | 7.8 |
| ගඟ රක්ෂිතය | 1 | 1.0 | - | - | 6 | 3.3 |
| එකතුව | 96 | 100 | 147 | 100 | 180 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - 2006



පුස්තකාලය LIBRARY හෙ.කො.ගො.ප.පු.ආ. HARTI

අංක 5.3 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි කුඹුරු ඉඩම් සම්බන්ධයෙන් ඒවායෙහි අයිතියේ ස්වරූපය පිළිබඳව සැළකීමේදී සාපේක්ෂ වශයෙන් වැඩි ප්‍රතිශතයක් තනි අයිතිය යටතේ ව්‍යාප්ත වේ. එය සියයට 40.1 කි. ඒ තුළ කැපී පෙනෙන අනෙක් ලක්ෂණය වනුයේ තාවකාලික බලපත්‍ර යටතේ ගොවිතැන් කටයුතු කරනු ලබන පිරිසද සැළකිය යුතු මට්ටමක පැවතීමයි. එය සියයට 29.3 කි. මුළු කුඹුරු ඉඩම් හිමි පවුල්වලින් සියයට 12.9 කට ස්වර්ණ භූමි/ජය භූමි හෝ රත්න භූමි ඔප්පු ප්‍රදානයන් යටතේ හිමිකාරත්වයක් ලැබී ඇත. කුඹුරු ඉඩම්වල අයිතිය සම්බන්ධව සැළකීමේදී බදු ක්‍රමයද කැපී පෙනේ. බදු ක්‍රමය යටතේ සියයට 11.6 ක ප්‍රමාණයක් බෙදී යයි. හවුල් අයිතිය, අනවසර පෞද්ගලික හා අනවසර රජයේ යන ක්‍රමයන් යටතේ කුඹුරු ඉඩම් හිමි මුළු පවුල් අතර සියයට දෙක බැගින් පමණ ව්‍යාප්ත වෙයි.

ගෙවතු ඉඩම් සම්බන්ධයෙන් සැළකීමේදී ගම්මානයේ පවුල්වලින් සියයට 40කට පමණ තනි සින්නක්කර අයිතිය පවතින අතර ඉතිරි සියයට 60 විවිධ ක්‍රම යටතේ බෙදී යයි. අනවසර (පෞද්ගලික), අනවසර රජයේ, නින්දගම් හා ගඟ රක්ෂිතය යන කොටස් සියල්ල අනවසර ගණයට වැටෙන අතර ඒ තුළ මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 29 පමණ නියෝජනය වෙයි. එය තවත් ලෙසකින් ගම්මානයෙන් 1/3 ක පමණ ප්‍රමාණයකි. මෙය සැළකිල්ලට ගතයුතු කරුණක් වන අතර මොවුන්ට නීත්‍යානුකූල හිමිකාරිත්වය ලබාදීම ඉතා වැදගත් වෙයි. මෙයට අමතරව තවත් සියයට 20 පමණ තාවකාලික බලපත්‍ර යටතේ පදිංචිව සිටී. මේ සියල්ල සළකා බැලුවහොත් ගම්මානයෙන් සියයට 50කට පමණ ඉඩම් සඳහා පැහැදිලිව ඔප්පු කළ හැකි නීත්‍යානුකූල අයිතියක් නොමැත. මෙය ඔවුන්ගේ එදිනෙදා අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේදී ද ගැටළු සහගත තත්ත්වයක් මතු කරන්නකි.

අනෙකුත් ගොඩ ඉඩම් සම්බන්ධයෙන් සැළකීමේදී ද එම තත්ත්වයන්ද බොහෝ දුරට ගෙවතුවල තත්ත්වයටම සමාන වන අතර ඒ තුළද අනවසර ඉඩම් පරිහරණයට සැළකිය යුතු තැනක් හිමිවී තිබේ. මෙහිලා විශේෂයෙන් සඳහන් කළයුතු තවත් වැදගත් කරුණක් වනුයේ විවිධ පාරිසරික අවශ්‍යතා වෙනුවෙන් වෙන්කළ රක්ෂිත ප්‍රදේශයන්හිද ජනතාව පදිංචි වී සිටීම හෝ වගා කටයුතු හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමයි. විශේෂයෙන්ම වලව ගඟ රක්ෂිත ප්‍රදේශයන්හි පදිංචිවීම හා වගා කටයුතු සඳහා යොදා ගැනීම කැපී පෙනේ.

පුද්ගලයින් සතුව පවත්නා ඉඩම් වෙනත් පුද්ගලයින්ට වගා කටයුතු සඳහා ලබාදීම පිළිබඳවද සමීක්ෂණය තුළදී අවධානය යොමු විය. ඒ තුලින් පැහැදිලි වනුයේ බදු ක්‍රමය ඉතා ප්‍රචලිත ක්‍රමය බවයි. පිටතට ලබාදී ඇති ඉඩම්වලින් සියයට 80 පමණ මේ යටතේ ලබාදී ඇත.

### 5.3 ඉඩම්වල භෞතික ස්වභාවය

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ඉඩම්වල භෞතික ස්වරූපය පිළිබඳ සැළකීමේදී කැපී පෙනෙන ලක්ෂණය වන්නේ එහි කඳු බෑවුම්වලින් තොර තැනිතලා ස්වරූපයක් පැවතීමයි. කෘෂිකාර්මික වගාවන් සඳහා ගැළපෙන වැලි මිශ්‍ර පසක් ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතී. වලවේ ගඟ අවට ප්‍රදේශවල සාරවත් බවින් ඉහළ ලොම් පසක් දැකිය හැකිය.
භූමියේ පිහිටීම හා ස්වභාවය අනුව පාංශු ඛාදනය එතරම් ප්‍රබල ගැටළුවක් ලෙස නොපවතී. සමහර ඉඩම් සුළු වශයෙන් පාංශු ඛාදනයට ලක්වී ඇති නමුත් එය සැළකිය යුතු මට්ටමක නොපිහිටයි.

සමීක්ෂණයෙන් හෙළිවන පරිදි වගාව සඳහා ජලය ලබාගන්නා ප්‍රධාන මූලාශ්‍රය අනුව ඉඩම් බෙදීගිය ආකාරය 5-4 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ. ඒ අනුව කුඹුරු ඉඩම් හැර ගෙවතු හා වෙනත් උස් බිම්වල කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස වැසි ජලය පරිහරණය කරනු ලබන බව ඉතා පැහැදිලි වේ.

5.4 සංඛ්‍යා සටහන

**ප්‍රධාන ජල මූලාශ්‍රය අනුව ඉඩම් ව්‍යාප්තිය**

| ජල මූලාශ්‍රය | කුඹුරු ඉඩම් | | ගෙවතු | | උස් බිම් | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමා. (අක්කර) | ප්‍රතිශතය | ප්‍රමා. (අක්කර) | ප්‍රතිශතය | ප්‍රමා. (අක්කර) | ප්‍රතිශතය |
| මහාවාරි | 98.5 | 46.3 | 16.75 | 8.3 | 5.0 | 4.0 |
| සුළුවාරි | 114.8 | 53.7 | 34.00 | 16.8 | 53.50 | 43.2 |
| වැසි දිය | - | - | 146.21 | 69.4 | 54.25 | 43.8 |
| වෙනත් | - | - | 11.00 | 5.4 | 11.00 | 8.9 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - 2006

5.4 සංඛ්‍යා සටහනට අනුව ගෙවතු ඉඩම්වලින් සියයට 70 පමණ වැසි ජලය උපයෝගී කරගනිමින් වගා කටයුතු සිදු කරයි. මේ තත්ත්වය මත බොහෝ ඉඩම්වල වගා කටයුතු සිදු වනුයේ මහ කන්නයේ පමණි. ඊට අමතරව ස්ථිර භෝග හා බහු වාර්ෂික භෝග ගෙවතු ඉඩම්වල දැකිය හැකිය. අනෙකුත් උස් බිම්වල ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස වැසි ජලය හා සුළු වාරිමාර්ග ක්‍රම සමාන ප්‍රතිශතයන්ගෙන් බෙදී යයි.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය වාර්තාවලට අනුව බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 1810 පමණ වන අතර ඉන් අක්කර 140 පමණ වගා නොකරයි. එනම් මුළු ඉඩම් ප්‍රමාණයෙන් සියයට 8ක පමණ ප්‍රතිශතයකි. වගා නොකරන ඉඩම් අතර කුඹුරු ඉඩම් ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පවතින අතර එම ඉඩම්වල වී හා කෙසෙල් වගාව ඉතා ප්‍රචලිතව සිදුවෙයි. විශේෂයෙන්ම මහවැලි පාලනය යටතේ පවතින කුඹුරු ඉඩම් අක්කර 1200යම වගා කටයුතු සිදු වන බවට වාර්තා වෙයි. මහවැලි පාලනයෙන් බාහිර අනෙකුත් කුඹුරු සමහරක් ලවනතාවය හා ජල හිඟය යන හේතු බලපෑමෙන් වගා කටයුතු සිදු නොවෙයි.

උස් බිම් සම්බන්ධයෙන් සැළකිමේදී මහවැලි පාලන ඉඩම් අතරින් අක්කර 100 පමණ වගා කටයුතු සඳහා යොදා නොගන්නා බව වාර්තා වේ. මේ සඳහා ප්‍රබලම හේතුව වගාවට ප්‍රමාණවත් පරිදි ජලය ලබාගැනීමේ අපහසුතාවයයි. සමීක්ෂණයෙන් හෙළිවන පරිදි වගා නොකරන ගොඩ ඉඩම්වලින් සියයට 68 කට පමණ වගා නොකිරීමට ප්‍රධාන හේතුව ජල හිඟයයි. තවත් සියයට 18කට පමණ ප්‍රධාන හේතුව පසේ නිසරු බවයි.

ශ්‍රම හිඟය හා ආර්ථික අපහසුතා ඉඩම් වගා නොකිරීමට ප්‍රධාන හේතුව ලෙස සියයට 4 බැගින් සමානව ව්‍යාප්ත වේ. වනසත්ව හානි හා වගාවට ඇති අකමැත්තද ඉතා සුළු වශයෙන් ඉඩම් වගා නොකිරීම සඳහා බලපායි. මෙම තත්ත්වයන් වෙනස් කිරීම සඳහා ප්‍රධාන ලෙසම වගාවන් සඳහා ජලය ලබාගැනීමේ හැකියාව තහවුරු කළහොත් ඉඩම්වල ආර්ථික ඵලදායීතාව ඉහළ නැංවීමේ හැකියාව පවතී.

## හයවන පරිච්ඡේදය

# කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි කෘෂිකාර්මික කටයුතු හා අනෙකුත් නිෂ්පාදන කටයුතු කෙරෙහි මෙම පරිච්ඡේදය තුළදී මූලික අවධානය යොමු වේ. කෘෂිකාර්මික කටයුතු මූලික වශයෙන් භෝග වගාව හා සත්ත්ව පාලනය යන ප්‍රධාන අංශ දෙක යටතේ විමසුමට ලක්වන අතර තාක්ෂණය, යෙදවුම් භාවිතය, නිෂ්පාදනය හා අලෙවිය යන උප මාතෘකා ඔස්සේ විග්‍රහ කෙරේ.

### 6.1 භෝග වගාව

#### 6.1.1 හැදින්වීම

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි කෘෂිකාර්මික කටයුතු මහවැලි ව්‍යාපාරයෙහි වලව විශේෂ බලප්‍රදේශය යටතේ මෙන්ම දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි පරිපාලනය යටතේ සිදුවේ. සූරියවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාර්තාවන්ට අනුව බැදිගම්තොට මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 60 ක් පමණ මහවැලි ව්‍යාපාරය යටතට ගැනේ. මේ අනුව එකී ප්‍රදේශවල කෘෂි ව්‍යාප්ති සේවා සූරියවැව මහවැලි කොට්ඨාශ කාර්යාලයෙහි කෘෂිකර්ම නිලධාරියා මගින් ඉටුවන අතර අනෙකුත් ප්‍රදේශවල දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි කෘෂි උපදේශක මගින් ඉටු වේ.

සමස්තයක් ලෙස ගත්විට බැදිගම්තොට ග්‍රාම නිලධාරි වසමේ ප්‍රධාන වගාව ලෙස වී ගොවිතැන සඳහන් කළ හැකි අතර ඊට අමතරව කෙසෙල් හා එළවළු වගාවන් ප්‍රමුඛ වෙයි. වී ගොවිතැන හා සමාන මට්ටමෙන් කෙසෙල් වගාවද ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින අතර එළවළු වගාවන් යටතේ වම්බටු, එළබටු හා මැඟි භෝග යටතේ ගැනෙන කරවිල, පතෝල, වැටකොළු වැනි වගාවන් බහුලව දැකගත හැකිය.

6.1 සංඛ්‍යා සටහන විවිධ ජල මූලාශ්‍රයන් යටතේ වගාවන අක්කර ප්‍රමාණයන් පෙන්නුම් කරන අතර යල හා මහ කන්නයන්ට අනුව ඒ ඒ වගාවන් සඳහා වෙන්වන බිම් ප්‍රමාණයන් වෙනසකට ලක්වේ. කෙතරම් භූමි ප්‍රමාණයක් ඒ ඒ වගාවන් යටතේ කන්නයන්ට අනුව වෙන් වන්නේද යන්න පිළිබඳ පිළිගත හැකි නිවැරදි දත්ත ලබාගැනීම ඉතා අපහසු කාර්යයක් විය.

6.1 සංඛ්‍යා සටහන

**ජල මූලාශ්‍ර අනුව වගාබිම් ව්‍යාප්තිය**

| ජල මූලාශ්‍රය | වගා බිම් ප්‍රමාණය (අක්කර) | භෝග වර්ගය |
|---|---|---|
| බැදිගම්තොට | 65 | වී,කෙසෙල්, එළවළු |
| අංක 03 වැව | 400 | වී, කෙසෙල්, අතිරේක භෝග |
| අංක 04 වැව | 270 | වී, අතිරේක භෝග |
| වලවේ ගඟ | 150 | අතිරේක භෝග |

**මූලාශ්‍රය : ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - සූරියවැව**

වී වගාව පූර්ණ වශයෙන් වානිජ වගාවක් ලෙස සිදු නොවන අතර නිවසේ පරිභෝජනයට අවශ්‍ය ප්‍රමාණය හැර ඉතිරිය අලෙවි කරයි. කෙසෙල් එළවළු හා අනෙකුත් අතිරේක භෝග මූලික ලෙසම වානිජ පරමාර්ථයෙන්ම වගාවෙයි.

### 6.1.2 තාක්ෂණ භාවිතය

නූතන කෘෂිකාර්මික යෙදවුම් භාවිතා කර වගා කටයුතු සිදුවන්නේ නම් ඒ සඳහා නිවැරදි තාක්ෂණික උපක්‍රම භාවිතා කිරීම අනිවාර්ය අංගයකි. බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ පූර්ව ව්‍යාපෘති අවධියෙහි මෙකී අංශයන්හි ක්‍රියාකාරීත්වය කෙබඳු මට්ටමක පැවතියේද යන්න පිළිබඳව මෙම කොටස තුළදී විශේෂ අවධානයට යොමු විය.

#### 6.1.2.1 කෘෂි දැනුම හා උපදෙස් ලබා ගැනීම

නිවැරදිව කෘෂිකාර්මික කටයුතුවල නිරතවීමේදී කෘෂිකාර්මික දැනුම හා උපදෙස් ඉතා වැදගත් වෙයි. පෙර සඳහන් කළ පරිදි බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ මෙම කටයුත්ත සඳහා වෙන්වූ නිලධාරීන් දෙදෙනෙකු හඳුනාගත හැක. ඒ මහවැලි ව්‍යාපාරය යටතේ රාජකාරියෙහි නිරත වන කෘෂි නිලධාරීවරයා හා පළාත් සභාව යටතේ කටයුතු කරනු ලබන කෘෂිකර්ම උපදේශකවරයා වශයෙනි. ඊට අමතරව අවශ්‍ය යොමු කිරීම් හා සොයා බැලීම් වෙනුවෙන් ක්ෂේත්‍ර නිලධාරීන් කිහිපදෙනෙකුගේ සේවාවද ගම්මානයට ලැබිය යුතුය. නිදසුනක් ලෙස කෘෂිකාර්මික පර්යේෂණ හා නිෂ්පාදන සහකාර හා මහවැලි ක්ෂේත්‍ර නිලධාරීන් දැක්විය හැකිය.

කෘෂිකාර්මික දැනුම හා උපදෙස් ලැබිය යුතු අංශ වගා ක්‍රම, බීජ හා රෝපණ ද්‍රව්‍ය, පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර, අලෙවිය, ගොවි ණය හා රක්ෂණ යන කොටස්වලට බෙදා සමීක්ෂණය තුළදී තොරතුරු රැස්කළ අතර මෙකී ක්ෂේත්‍ර සඳහා කුමන මූලයන්ගෙන් උපදෙස් හා සේවා ලබා ගන්නේද යන්න පිළිබඳව අවධානය යොමු විය.

වගා ක්‍රම සම්බන්ධයෙන් සැළකීමේදී ගම නැගුම පූර්ව ව්‍යාපෘති අවධිය තුළදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි සමීක්ෂණයට ලක්කළ ගොවීන්ගෙන් සියයට 90 ක් පමණ කිසිදු පුද්ගලයෙකුගෙන් උපදෙස් ලබාගෙන නොමැති අතර තම පාරම්පරික දැනුම හා අත්දැකීම් මත වගා කටයුතු සිදුකර ඇත. තවත් සියයට හතක් පමණ වෙනත් ගොවි මහතුන්ගෙන් උපදෙස් ලබාගෙන ඇත. කෘෂි උපදේශක හෝ කෘෂි නිලධාරී මගින් උපදෙස් ලබාගෙන ඇත්තේ සියයට

02 වැනි ඉතා සුළු පිරිසකි. ඉතිරි සියයට 01 විවිධ පෞද්ගලික සමාගම්වල ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් වගා ක්‍රම පිළිබඳව උපදෙස් ලබාගෙන ඇත.

ප්‍රදේශයේ කෘෂි පාරිසරික සාධකයන්ට ගැළපෙන බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම පිළිබඳවද ගොවි මහතුන් වැඩි පිරිසක් උපදෙස් ලබාගැනීම දක්නට නොලැබේ. සමීක්ෂණයට ලක්කළ පිරිසෙන් සියයට 79 පමණ කිසිදු පුද්ගලයෙකුගෙන් උපදෙස් ලබාගැනීමක් සිදු නොකරන අතර සියයට 18 පමණ වෙනත් ගොවීන්ගෙන් උපදෙස් ලබාගනී. මේ සම්බන්ධ තාක්ෂණික දැනුම ඇති නිලධාරීන්ගෙන් උපදෙස් ලබාගත් පිරිස සියයට 03 ක් වැනි සුළු අගයකි.

වගාවට අවශ්‍ය පොහොර නියමිත වේලාවට නියමිත ප්‍රමාණයන්ගෙන් භාවිතය පිළිබඳවද සියයට 90 පමණ ගොවීන් උපදෙස් ලබා ගැනීමක් සිදු නොවන අතර සියයට 8ක් පමණ වෙනත් ගොවීන්ගෙන් උපදෙස් ලබාගනී. සියයට 1ක් පමණ අදාල නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගන්නා අතර ඉතිරි සියයට 1 පෞද්ලික වෙළඳසැල් හිමියන්ගෙන් උපදෙස් ලබාගනී.

වගාවන්හිදී ඇතිවන විවිධාකාර රෝගාබාධ සඳහා කෘෂි රසායන භාවිතයේ තත්ත්වයද ඉතාමත් අහිතකර වන අතර සියයට 67 ක් පමණ ගොවීන් කිසිවකුගේ උපදෙස් ලබානොගන්නා අතර සියයට 28 ක් පමණ පෞද්ගලික වෙළඳසැල් හිමියන්ගෙන් උපදෙස් ලබාගනී. ඉතිරි සියයට 5 වෙනත් ගොවීන්ගෙන් කෘෂි රසායන භාවිතයේදී උපදෙස් ලබාගනී.

මේ අනුව පැහැදිලි නිගමන කිහිපයකට පැමිණිය හැක. එනම් බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි කෘෂිකාර්මික කටයුතු ගොවීන්ගේ පාරම්පරික දැනුම හෝ අත්දැකීම් මත බොහෝ සෙයින් රදා පවතින අතර නව තාක්ෂණික දැනුම හෝ විධික්‍රම සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම ඉතාමත් පහළ මට්ටමක පවතී. වගා ක්‍රම, බීජ හා රෝපණ ද්‍රව්‍ය, පොහොර හා කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය යන කෘෂිකර්මයෙහි වැදගත් කොටස් තුළින් මේ තත්ත්වය කැපී පෙනේ. මේ අතරින් කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තත්ත්වය පහළින් පිහිටන අතර ගොවීන් පෞද්ගලික වෙළඳසැල් හිමියන්ගේ උපදෙස් මත රසායන ද්‍රව්‍ය භාවිතා කිරීමට නැඹුරු වී ඇත.

අනෙක් අතින් කෘෂි ව්‍යාප්ති සේවාවන්හි හිඩැසක් මේ තුළින් මතු වී පෙනෙන අතර නියමිත පරිදි සේවාවන් නොලැබී යාමක් දක්නට ලැබේ. මේ සඳහා විවිධ හේතු ඉදිරිපත් වන අතර ඒ අතරින් ප්‍රබල ලෙසම පවතිනුයේ මෙම ප්‍රදේශය අදාල ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් බොහෝ දුරස්ථව පිහිටීමයි. මේ හේතුවෙන් නිලධාරීන්ට ගම්මානයට ප්‍රවේශවීම ගැටළුවක්ව පවතී. මෙම සමීක්ෂණය තුළදී ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට පෙර පැවති තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු වූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනවිට පවත්නා තත්ත්වය මෙයට වඩා වෙනස්විය හැකි බවද මෙහිලා සඳහන් කළ යුතුය.

### 6.1.2.2. බීජ හා කෘෂි රසායන භාවිතය

වගාවන් සඳහා අවශ්‍ය වන බීජ භාවිතයේ කැපී පෙනෙන ලක්ෂණය වනුයේ වැඩි දියුණු කළ බීජ වෙත ගොවීන් විශාල වශයෙන් නැඹුරුවීමයි. එය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වැඩි දියුණුකළ ඒවා මෙන්ම ආනයනික බීජ මතද සමාන මට්ටමින් ව්‍යාප්තව පවතී. පතෝල, වම්බටු හා කරවිල වැනි බීජ බොහෝ සෙයින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ මත පදනම්වන අතර වැටකොළු, වට්ටක්කා, බටු, පිපිඤ්ඤා හා අළුපුහුල් ආනයනික බීජමත රඳා පැවැත්මක් දක්නට ලැබේ. බීජ ලබාගැනීම පිළිබඳව ප්‍රදේශය තුළ ප්‍රබල ගැටළුවක් නොමැති අතර බොහෝ විට ගොවීන් අතර හුවමාරු කරගැනීමක් ද දක්නට ලැබේ.

සමීක්ෂණය තුළදී ඒ ඒ වගාවන් සඳහා අවශ්‍ය කරන බීජ ලබාගන්නේ කුමන මූලාශ්‍රයෙන්ද යන්න පිළිබඳව අවධානය යොමු විය. ඒ අනුව සමීක්ෂණයට ලක්කළ ගොවීන් අතරින් සියයට 53 පමණ වී වගාව සඳහා අවශ්‍ය බීජ වෙනත් ගොවීන්ගෙන් ලබාගෙන ඇත. තවත් සියයට 44 පමණ තමාට අවශ්‍ය බීජ තමා විසින්ම නිපදවාගෙන ඇති අතර ඉතිරි සියට තුන පෞද්ගලික වෙළඳසැල්වලින් සියයට දෙකක් හා ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් සියයට එකක් වශයෙන් බෙදී යයි. මේ අනුව ඉතා පැහැදිලි වනුයේ සියයට 97 ක් පමණ ගොවීන් වී වගාවේදී තමන්ට අවශ්‍ය බීජ ප්‍රදේශය තුළින්ම සපයා ගන්නා බවයි.

එළවළු වගාවට අවශ්‍ය බීජ ලබාගන්නා මූලාශ්‍ර සම්බන්ධයෙන් සැළකීමේදී සියළුම ගොවීන්ගෙන් සියයට 43 ක් පමණ වෙනත් ගොවීන්ගෙන් අවශ්‍ය බීජ ලබාගන්නා අතර සියයට 34 ක් පෞද්ගලික වෙළඳසැල්වලින් මිලදී ගනී. ඉතිරි සියයට 23 තමා විසින්ම අවශ්‍ය බීජ නිපදවා ගනී. පෞද්ගලික වෙළඳසැල් තුළින් ආනයනික බීජ වර්ග ලබාගන්නා අතර දේශීය වැඩිදියුණු කළ බීජ වර්ග ප්‍රදේශය තුළින්ම ලබාගනී.

අතිරේක බෝග වගාවෙහි නිරතවනුයේ ගොවීන් ඉතා සුළු පිරිසක් වන අතර බොහෝ විට ඔවුන්ට අවශ්‍ය බීජ තමා විසින්ම නිපදවා ගැනීමක් හෝ හුවමාරු කර ගැනීමක් දක්නට ලැබේ.

3.2 සංඛ්‍යා සටහන විවිධ වගාවන්ට අවශ්‍ය කෘෂි රසායන ලබාගන්නා මූලාශ්‍ර අනුව ගොවීන්ගේ ප්‍රතිශතක ව්‍යාප්තිය පෙන්වයි. සෑම වගාවක් සම්බන්ධයෙන්ම කෘෂි රසායන ලබාගැනීමේ ප්‍රධාන මූලාශ්‍රය පෞද්ගලික වෙළඳසැල් බවට පත්වී ඇත.

**6.2 සංඛ්‍යා සටහන**

**කෘෂි රසායන ලබාගන්නා මූලාශ්‍ර අනුව ගොවීන්ගේ ව්‍යාප්තිය**

| කෘෂි රසායන ලබාගන්නා මූලාශ්‍රය | වී වගාව සඳහා | එළවළු වගාව සඳහා | අතිරේක බෝග සඳහා |
|---|---|---|---|
| පෞද්ගලික වෙළඳසැල් | 85 | 79 | 80 |
| ගොවි සේවා. මධ්‍ය. | - | - | - |
| සණස සමිති | 15 | 21 | 20 |
| එකතුව | 100 | 100 | 100 |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - **2006**

ගොවිජන සේවා මධ්‍යස්ථානය ගොවීන්ට බොහෝ දුරින් පිහිටීම හේතුවෙන් කෘෂි රසායන ලබාගැනීමේදී කිසිදු ගොවියෙකු ඒ වෙත යොමු වී නැත. සණස සමිතිය ගම තුළම අලෙවි සැළක් පවත්වාගෙනයමින් මෙකී සේවාවන් ලබාදෙන අතර ගොවීන්ගෙන් සැළකිය යුතු පිරිසක් ඒ වෙත යොමු වී ඇත.

වගාවන්ට වැළදෙන රෝගය හෝ අවශ්‍යතාවය ඉතා නිවැරදිව හඳුනා නොගෙන පෞද්ගලික වෙළඳසැල්වලින් කෘෂි රසායන ද්‍රව්‍ය මිලදී ගැනීමක් සිදුවන අතර රසායනික නාමය පිළිබඳවද ගොවීන් තුළ අවබෝධයක් නොමැත. මේ හේතුවෙන් කිහිපවිටක් කෘෂි රසායන යෙදීමට සිදුවන අතර එය පිරිවැය ඉහළ යාම කෙරෙහි සෘජුව බලපායි. අනෙක් අතින් රසායන ද්‍රව්‍ය කලවම් කර භාවිතා කිරීම හා කාලාන්තරය පිළිබඳ නිවැරදි අවබෝධයක් නොමැති වීමද ප්‍රදේශය තුළ පවතින පොදු ගැටළු ලෙස දැක්විය හැකිය. මෙම තත්ත්වයන් තුළින් ගොවීන් මුදවාගෙන නිවැරදි දිශාවන්ට යොමු කිරීම අදාල නිලධාරීන්ගේ වගකීමක්ද වනු ඇත.

### 6.1.2.3 පොහොර භාවිතය

වී, එළවළු හා අතිරේක බෝග සඳහා රසායනික හා කාබනික පොහොර භාවිතය කෙබදුද යන්න මෙහිදී අවධානයට යොමු වේ. මෙකී සෑම වගාවක් සම්බන්ධයෙන්ම රසායනික පොහොර භාවිතය ඉහළ මට්ටමක පවතින අතර කාබනික පොහොර භාවිතය ඉතාම පහළ මට්ටමක පවතී. වී වගාව සම්බන්දයෙන් ගත්විට බොහෝවිට නියමිත ප්‍රමාණ සම්බන්ධයෙන් සැළකිල්ලක් නොමැත. මේ සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීමේ අවශ්‍යතාව දැඩිව කැපී පෙනේ. සමීක්ෂණයට ලක්කළ ගොවීන්ගෙන් සියයට 64ක් පමණ ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් පොහොර සහනාධාරය යටතේ ලබාදෙන රසායනික පොහොර ලබාගෙන ඇත. තවත් සියයට 26 ක් පමණ පෞද්ගලික වෙළඳසැල් මගින් රසායනික පොහොර ලබාගෙන ඇති අතර ඉතිරි සියයට 10 සණස සමිතිය මගින් ලබාගෙන ඇත. ගොවීන්ගෙන් සියයට 70 ක් පමණ දුෂ්කරතාවයකින් තොරව පොහොර ලබාගෙන ඇති අතර ඉතිරි සියයට 30 පොහොර සහනාධාරය යටතේ ලබාදෙන රසායනික පොහොර ලබා ගැනීමේදී විවිධ දුෂ්කරතාවයන්ට ලක්වී ඇත. ගොවිජන සේවා මධ්‍යස්ථානය බොහෝ දුර බැහැරින් පිහිටීමත් කිහිපවිටක් ඒ සඳහා යාමට සිදුවීම හා ප්‍රවාහන දුෂ්කරතා මේ අතරින් ප්‍රමුඛ විය.

වී වගාව සඳහා කාබනික පොහොර භාවිතය ඉතා පහළ මට්ටමක පවතන අතර ඒ සම්බන්ධව ගොවීන්ගේ කිසිදු සැළකිල්ලක් නොමැත. බොහෝ විට පිදුරු පමණක් වී ගොවිතැනට කාබනික පොහොරක් ලෙස යොදන අතර ප්‍රදේශයේ බහුල ගොම වැනි පොහොර යෙදීමක් දක්නට නොලැබේ.

එළවළු වගාවෙහි පොහොර භාවිතය පිළිබඳව සැළකීමේදී ඒ තුළද වී වගාව මෙන්ම යූරියා භාවිතය ඉහළ මට්ටමක පවතී. ඊට අමතරව එළවළු පොහොර මිශ්‍රණයද ගොවීන් භාවිතා කරයි. එළවළු වගාවෙහිද පොහොර භාවිතය පාරම්පරික දැනුම හෝ අත්දැකීම් මත සිදුවනු විනා විද්‍යානුකූලව සිදුවීමක් දක්නට නොමැත. එළවළු වගාවන් සඳහා අවශ්‍ය පොහොර සියයට 75 පමණ ගොවීන් පෞද්ගලික වෙළඳසැල්වලින් මිලදී ගන්නා අතර සියයට 15 පමණ සණස සමිතියේද ඉතිරි සියයට 10 ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන්ද ලබාගෙන තිබේ. වී වගාව සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලබාගත් පොහොර එළවළු වගාවටද යෙදීමක් මෙහිදී දක්නට ලැබුණි. රසායනික පොහොර ලබාගැනීම සම්බන්ධයෙන් ගොවීන්ගෙන් සියයට 99 කටම කිසිදු ගැටළුවක් ඇතිවී නොමැත. ප්‍රදේශයේ බහුලව



පුස්තකාලය
LIBRARY

පැවතියද ගොම වැනි පොහොර වගාව සඳහා යොදා ගැනීම ඉතා පහළ මට්ටමක පැවතීමද සුවිශේෂයෙන් කැපී පෙනේ.

අතිරේක බෝග වගාවන් සම්බන්ධයෙන් පොහොර භාවිතයද එළවළු වගාවන් හා සමාන මට්ටමක් ගන්නා අතර පෞද්ගලික වෙළඳසැල් මගින් අවශ්‍යතරම් ලබාගැනීමේ හැකියාව පවතී.

මෙහි සෑම වගාවක් සඳහාම රසායනික පොහොර සමගම කාබනික පොහොරද සැළකිය යුතු මට්ටමෙන් යොදන්නේ නම් පිරිවැය අවම කර ගැනීමේ හැකියාව පවතී. ගොවීන්ගේ නොදැනුවත් බව හා නොසැළකිල්ල කාබනික පොහොර අවම භාවිතයට හේතුවී තිබේ.

### 6.1.2.4 ජල පාලනය

වගාවන් සඳහා ජලය ලබාගන්නා මූලාශ්‍ර 6.1. සංඛ්‍යා සටහන මගින් සවිස්තරාත්මකව දැක්වේ. මහවැලි ව්‍යාපාරයේ ඇළ මාර්ග මගින් හා බැදිගම්තොට වැව හා වලව ගඟ මූලික කරගනිමින් වගා බිම් වෙත ජලය සපයා ගනී. වලව ගඟෙන් ජලය ලබාගැනීම ගොවීන්ට අමතර පිරිවැයක් වන අතර ජල පොම්ප මගින් සැළකිය යුතු දුරකට ජලය ගෙනයාමද සිදුවේ. ඊට අමතරව මහ කන්නයේදී වැසි ජලය මූලික කරගෙන එළවළු හා අතිරේක බෝග වගාවන් සිදු කරයි.

මෙම කොටස තුළදී ජල මූලාශ්‍රවලට වඩා ජල පාලනය කෙබඳුද යන්න කෙරෙහි අවධානය යොමු විය. වී සහ වෙනත් වගාවන්හි ජල පාලනය පිළිබඳ නිවැරදි අවබෝධයක් ගොවීන් සතු නොවන අතර ඒ හේතුවෙන් අනවශ්‍ය ජල පරිහරණයක් ඇතිවී තිබේ. මේ සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීම ඉතා වැදගත් වුවකි.

### 6.1.2.5 නිෂ්පාදනය

කෘෂි නිෂ්පාදන සම්බන්ධයෙන් විග්‍රහ කිරීමේදී ප්‍රදේශයේ ප්‍රමුඛ බෝගය වන වී නිෂ්පාදනය කෙරෙහි සුවිශේෂී අවධානය යොමු විය. ප්‍රදේශයේ වී වගාව සම්බන්ධ අක්කරයක සාමාන්‍ය නිෂ්පාදනය බුසල් 120 මට්ටමෙහි පවතී. එය වියළි කලාපීය ගොවිජනපද සමග සැසඳීමේදී පහළ මට්ටමක් ගන්නා අතර දිස්ත්‍රික්කයේ සාමාන්‍ය මට්ටම හා සමානවීමක් පෙන්වයි.

එළවළු වර්ග සම්බන්ධයෙන් සැළකීමේදී කරවිල හා පතෝල අක්කරයකින් සතියකට කි.ග්‍රෑ.400 පමණ එළදාව නෙළා ගත හැකි අතර වම්බටු, වැටකොළු හා බටු යනාදිය වසරකට අක්කරයකින් කි.ග්‍රෑ. 12,000 පමණ ලබාගැනීමේ හැකියාව ප්‍රදේශය තුළ පවතී.

### 6.1.2.6 නිෂ්පාදන වියදම හා ලාභය

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි ප්‍රධාන බෝගය ලෙස වී ගොවිතැන සිදුවන බැවින් එහි පිරිවැය හා ලාභය පිළිබඳව සමීක්ෂණය තුළදී අවධානය යොමු විය. ගොවි පවුලේ ශ්‍රමයට වටිනාකමක් ලබාදෙමින් හා නොදෙමින් පිරිවැය ගණනය කළ අතර පවුලේ ශ්‍රමයට වටිනාකමක් එක්කළ විට වී ගොවිතැන ඉතා පාඩු සහගතය.

පවුලේ ශ්‍රමයට වටිනාකමක් ලබානොදී වී නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේදී අක්කරයක් සඳහා රු.21150 පමණ සාමාන්‍ය වියදමක් දැරීමට සිදුවේ. එම ගණනය කිරීමේ ක්‍රමයට අනුව වී කි.ග්‍රෑ. එකක් සඳහා නිෂ්පාදන වියදම රු.9.60 පමණ සාමාන්‍ය අගයක් ගනී. ප්‍රදේශය තුළ වී කිලෝවක් රු.11 ත් 12ත් අතර මුදලකට අලෙවි කළ හැකි අතර මේ අනුව අක්කරයකින් දළ වශයෙන් රු.3500 පමණ ලාභයක් ලැබිය හැකිය. වී කිලෝවකින් රු.1.40 ත් 2.40 අතර මුදලක් ලාභය ලෙස පවතී. මේ අනුව පැහැදිලි වනුයේ වී ගොවිතැන තුළ ලාභ පරතරය පටුවන බවයි. පවුලේ ශ්‍රමයට වටිනාකමක් ලබාදුනහොත් තත්ත්වය මෙයට වඩා බොහෝ සෙයින් වෙනස්වන අතර අක්කරයක සාමාන්‍ය වියදම රු.41150 ක පමණ අගයක් ගනී. එමෙන්ම වී කිලෝවක සාමාන්‍ය වියදම රු.18.60 පමණ වේ. මේ අනුව සළකා බැලුවහොත් වී ගොවිතැන පාඩු සහගත වේ. පවුලේ ශ්‍රමයට අගයක් ලබාදී වී ගොවිතැන සඳහා පිරිවැය ගණනය කිරීම සාධාරණ නොවන අතර මින් ඉදිරියට විග්‍රහ කිරීම් වලදී පවුලේ ශ්‍රමය හැර ගණනය කළ නිෂ්පාදන පිරිවැය පිළිබඳව අවධානය යොමු වේ.

වී නිෂ්පාදනයේ පිරිවැය තුළ සාපේක්ෂව වැඩිම ප්‍රතිශතයක් නියෝජනය වන්නේ කම්කරු ශ්‍රමය සඳහා වූ ගෙවීම්ය. බැදිගම්තොට ප්‍රදේශය තුළ එය සියයට 41.7 ක පමණ ප්‍රතිශතක නියෝජනයක් සහිතය. බිම් සැකසීම, වැපිරීම හෝ පැළ සිටුවීම හා අස්වනු නෙළීම වැනි කාර්යයන් සඳහා බහුල ලෙස ශ්‍රමය යොදා ගැනීමක් දක්නට ලැබෙන අතර කම්කරු ශ්‍රමය සඳහා සාපේක්ෂව ඉහළ වැටුපක් ගෙවීමටද සිදුවී තිබේ. කම්කරු ශ්‍රමික හිඟය හා ශ්‍රමය සඳහා අදාල කාල පරිච්ඡේදයන් තුළදී ඇතිවන අධි ඉල්ලුම හේතුවෙන් කම්කරුවකුගේ දෛනික කුළියද ඉහළ මට්ටමක් ගෙන තිබේ.

දෙවනුව සමස්ථ පිරිවැය තුළ සාපේක්ෂව ඉහළ පිරිවැයක් බිම් සැකසීම සඳහා වෙන් වේ. එය සියයට 19 ක් පමණ ප්‍රතිශතයක් වන අතර යන්ත්‍ර භාවිතය මෙහිදී කැපී පෙනේ. රෝද 2 හා රෝද 4 ට්‍රැක්ටර් බහුලව භාවිතාවන අතර අක්කරයක බිම් සැකසීම සඳහා සාමාන්‍ය වශයෙන් රුපියල් 4000 පමණ මුදලක් වැයවේ.

කෘෂි රසායන සඳහා සමස්ථ පිරිවැයෙන් සියයට 13 ක පමණ ප්‍රතිශතයක් වෙන්වන අතර එය සැළකිය යුතු මට්ටමකි. කෘෂි රසායන අවම කරගනිමින් ඒකාබද්ධ පළිබෝධ පාලන වැඩසටහන් වැනි ක්‍රම වෙත ගමන් කළහොත් මෙම පිරිවැය තවදුරටත් අවම කර ගැනීමේ හැකියාව පවතී. අස්වනු නෙළීම, පොහොර හා බීජ සඳහා සමාන මට්ටමේ පිරිවැයක් දැරීමට සිදුවන අතර එය එක් කාර්යයක් සඳහා සාමාන්‍ය වශයෙන් සියයට 8ක පමණ ප්‍රතිශතයක් නියෝජනය වෙයි. විශේෂයෙන්ම මෙහිදී පොහොර වත්මන් රජයේ ප්‍රතිපත්තිය යටතේ හොණ්ඩරය රු. 350 බැගින් ලබාගැනීම හේතුවෙන් සියයට 8 පමණ ප්‍රතිශතක නියෝජනයක් දක්වයි. අභියර් හා වෙනත් අය (2005) පෙන්වන පරිදි පොහොර සඳහා සියයට 12ක පමණ ප්‍රතිශතයක් වී නිෂ්පාදන පිරිවැයෙන් වෙන්වේ. අස්වනු නෙළීම යටතේ කොළ මැඩීම හා වී සුළං කිරීම සඳහා යන්ත්‍ර පිරිවැය වැඩි වශයෙන් නියෝජනය වේ. මෙයට

අමතරව පසු අස්වනු ක්‍රියාකාරකම් හා ප්‍රවාහන කටයුතු වෙනුවෙන් සියයට 2.4 හා ජල සැපයුම් වෙනුවෙන් සියයට 1.5 පමණ ප්‍රතිශතයක් සමස්ථ පිරිවැයෙන් වෙන්වේ.

වී ගොවිතැන තුළ පවත්නා අවම ලාභ මට්ටම ඉහළ නංවා ගැනීමට නම් කෘෂි රසායන හා රසායනික පොහොර භාවිතය අවම කිරීමේ හැකියාවන් පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. කාබනික පොහොර සඳහා ගොවීන්ගේ උනන්දුව ඉහළ දැමුවහොත් පිරිවැය යම්තාක් දුරකට අඩුකරගත හැක. එසේ නොමැතිනම් එක් කන්නයක් සඳහා හෝ වෙනත් ගොඩ භෝග සඳහා යොමුවීම වැදගත් වේ.

### 6.1.2.7 අලෙවිය

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි කෘෂි නිෂ්පාදන සමස්ථයක් ලෙස ගත් කළ එහි අලෙවියෙහි විශේෂයෙන් කැපී පෙනෙන ලක්ෂණය වනුයේ නිෂ්පාදනවලින් සියයට 95 පමණ තොග වෙළඳපොළ වෙත ගොවීන් සෘජුවම ගෙනයාමයි. බරවකුඹුක හා සූරියවැව පොළ ඉතා ප්‍රසිද්ධ හා ප්‍රධානතම පොළ වන අතර කෙසෙල් සඳහා බරවකුඹුක ප්‍රධාන වන අතර අනෙකුත් එළවළු වර්ග වැඩි වශයෙන් සූරියවැව පොළට ගෙනයාමත් දක්නට ලැබේ. බැදිගම්තොට ප්‍රදේශය තුළදී අතරමැදියන්ට කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම සම්බන්ධයෙන් වාර්තා නොවූ අතර එය කැපී පෙනෙන ලක්ෂණයකි. කෘෂි නිෂ්පාදනවලින් සියයට 2.5 පමණ සෘජුවම පාරිභෝගිකයින්ට අලෙවි වන අතර ඉතිරි සියයට 2.5 සිල්ලර වෙළඳුන්ට අලෙවි වේ.

මෙම සමීක්ෂණය තුළදී බැදිගම්තොට ගම්මානයේ සමස්ත නිෂ්පාදනය මෙන්ම ඉන් කොතරම් ප්‍රතිශතයක් පරිභෝජනය හා අලෙවිය අතර බෙදී යන්නේද යන්න සම්බන්ධයෙන් අවධානය යොමු විය. ඉන් මතුවී පෙනෙන පරිදි වී නිෂ්පාදනයේ සමස්ත නිෂ්පාදනයෙන් සියයට 30 පමණ ගොවීන් තම පරිභෝජන අවශ්‍යතා වෙනුවෙන් තබාගනී. තවත් සියයට 15 පමණ අඳ හෝ බදු ආදී විවිධ ගෙවීම් සඳහා වෙන්වේ. ඉතිරි සියයට 55 විකිණේ. මෙම ප්‍රතිශතක බෙදීයාම් යල මහ දෙකන්නයටම සාධාරණ වූවකි.

එළවළු හා කෙසෙල් වගාවන් සම්බන්ධයෙන් සැළකීමේදී නිෂ්පාදනයන්ගෙන් සියයට 99 පමණ අලෙවිය සඳහා වෙන්වේ. එනම් මේවා පූර්ණ වශයෙන්ම වානිජ මට්ටමෙන් සිදුවන වගාවන්ය.

### 6.1.2.8 ප්‍රශ්න ගැටළු හා විසඳුම්

ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධනේ සැළකීමේදී ප්‍රධානතම ගැටළුව වනුයේ ජල හිඟයයි. මහවැලි පාලන ප්‍රදේශයන්ට වාරි ජලය යම් ප්‍රමාණයක් සැපයුනද ඉන් බාහිර ප්‍රදේශයන්ට වගාවට අවශ්‍ය ජලය ලබාගැනීම පිළිබඳ ගැටළු මතුවේ. ජලයෙහි ලවනතාවය ඉහළ යාමද මූලික ගැටලුවක් වන අතර වැලි ගොඩදැමීම හේතුවෙන් ගං පතුල හැරීම තුළ භූගත ජල මට්ටම පහළ යාමද ප්‍රදේශය තුළ දක්නට ලැබෙන අමතර ගැටළුවකි.

කෘෂි නිෂ්පාදන හා යෙදවුම් ප්‍රවාහනයද ප්‍රදේශය තුළ කැපී පෙනෙන දුෂ්කරතාවකි. කෘෂි නිෂ්පාදන සඳහා ප්‍රමුඛ පොළක් වන බරවකුඹුක පොළට ප්‍රවේශවීම සඳහා වලව ගඟ හරහා පාලමක් ඉදිකිරීමේ අවශ්‍යතාව ගොවීන් මතු කරන අතර එසේ වුවහොත් දැනට අමතර වශයෙන් ගමන්කරන දුර ප්‍රමාණය අවම කරගැනීමේ හැකියාව පවතී.

කෘෂි ව්‍යාප්ති සේවාවන්හි පවතින දුර්වලතා හා නිසි පරිදි නොලැබීම ප්‍රබල ගැටලුවක් වන අතර මේ හේතුවෙන් නිවැරදි තාක්ෂණය ගමට නොලැබේ. ආදර්ශ හා පුහුණු පන්ති මගින් ගොවීන්ගේ දැනුම ඉහළ නංවාගැනීම සඳහා කටයුතු කරන්නේ නම් මීට වැඩි ඵලායීතාවයක් ගොවිතැන තුළින් ලබා ගැනීමේ හැකියාව පවතී.

ගොවීන්ගේ නිෂ්පාදන වියදම් අවම කරගැනීම සඳහා කෘෂි රසායන භාවිතය අවම කර ගැනීම හා වී වලට අමතරව ගොඩ බෝග සඳහා ගොවීන් නැඹුරු කිරීමේ අවශ්‍යතාවය පවතී. අනෙක් අතින් පසු අස්වනු හානි අවමකර ගැනීමේ ක්‍රමෝපායන් පිළිබඳ අවබෝධයක් ලබාදිය යුතුය. මෙවැනි ක්‍රියාමාර්ග අනුගමනය කළහොත් දැනට ලබන තත්ත්වයට වඩා ඉහළ ලාභයක් ගොවීන්ට ලබා ගැනීමේ හැකියාව පවතී.

## 6.2 සත්ත්ව පාලනය

### 6.2.1 හැඳින්වීම

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමද ඇතුලත්ව රුහුණු ප්‍රදේශය ඈත අතීතයේ සිටම ගව පාලනය කෙරෙහි විශේෂ වැදගත්කමක් උසුලයි. විශාල පට්ටි වශයෙන් නිදැල්ලේ මී ගවයින් හා එළගවයින් ඇති කිරීම ප්‍රදේශය තුළ කැපී පෙණුන අතර ලංකාවේ බොහෝ ප්‍රදේශවලට මී කිරි බෙදාහැරීමක්ද සිදුවිය. විවිධ සංවර්ධන වැඩසටහන් ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වීමත් සමග විශාල පට්ටි වශයෙන් පැවති නිදැලි ගව පාලන ක්‍රමයට විවිධ තර්ජන ඇතිවිය. මේ හේතුවෙන් විශාල ගව පට්ටි කුඩා වීම හා ගොවීන් ගව පාලනයෙන් ඉවත්වීමද සිදුවිය. ගෘහස්ථ මට්ටමේ නිදැලි හා අඩ නිදැලි ක්‍රමයන් ද ප්‍රදේශය තුළ කැපී පෙනෙන අතර ඒ මගින් බොහෝවිට පවුලේ කිරි අවශ්‍යතාවයන් සපුරා ගැනීම හා අතිරික්තය අලෙවි කිරීමත් සිදුවෙයි.

ප්‍රයෝජනයට නොගත්. ගවයින්ගේ තෘණ අවශ්‍යතාව සපුරා ගැනීමට පැවති විශාල ඉඩම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය මෙන්ම ජනගහනයේ ව්‍යාප්තියත් සමග ක්‍රමයෙන් කුඩාවීමක් සිදුවිය. මෙයින් විශාල නිදැලි ගව පට්ටි පාලනය තර්ජනයකට ලක්විය. නිදැල්ලේ යන ගවයින්ගෙන් වෙනත් ගොවීන්ගේ වගා පාළු වීම හේතුවෙන් නිරන්තර ගැටළුවකට ගව හිමියන් මෙන්ම කෘෂි බෝග වගාවන්හි නියැලි ගොවීන්ට මුහුණ දීමට සිදුවේ. මෙම තත්ත්වය හම්බන්තොට දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවලට පොදු ලක්ෂණයක් බවට පත්ව තිබේ. මේ සඳහා ප්‍රදේශයේ බලධාරීන්වද නිශ්චිත පිළියමක් යෙදීමේ ප්‍රායෝගික දුෂ්කරතා ඇතිවී තිබේ.

නිදැලි ගව පාලනය මෙවැනි අර්බුදයකට මුහුණ දීමත් සමග ගෘහස්ථ ගව පාලනයට ගොවීන් නැඹුරුකර ගැනීමේ අවශ්‍යතාවයක් පවතී. ඒ සඳහා අවශ්‍ය ගව ආහාර ප්‍රදේශයේ සුලබව දැකගත හැක. ඇලවේලි හා පාර දෙපස ඉතා හොඳින් වැවෙන තෘණ වර්ග හා කෘෂි කාර්මික අපද්‍රව්‍ය වන පිදුරු වැනි ආහාර සුලභතාවය මෙයට කදිම නිදසුනකි.

පශු වෛද්‍ය කාර්යාලයේ වාර්තාවන්ට අනුව දැනට ප්‍රදේශය තුළ සත්ත්ව පාලනයේ නියැලෙන ගොවීහු 32 පමණ සිටිති. ඉන් 15 දෙනෙකු සූකර පාලනයේ නිරත අතර මී ගව පාලනයේ නිරත විශාල ගව පට්ටි හිමියන් 05 දෙනෙකු හා එළ ගව පාලනයේ නිරත ගොවීන් 10 දෙනෙකු හඳුනාගත හැකි අතර දෙදෙනෙකු එළු පාලනයේ නිරත වේ. ගම්මානයේ දැනට ඇති සතුන් පිළිබඳ තොරතුරු 6.3 සංඛ්‍යා සටහනින් දැක්වේ.

**6.3 සංඛ්‍යා සටහන**

**බැඳිගම්තොට සතුන් පිළිබඳ තොරතුරු**

| සත්ත්ව වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| මී ගවයින් | 400 |
| එළ ගවයින් | 80 |
| එළුවන් | 15 |
| ඌරන් | 120 |
| කුකුළන් | 90 |

**මූලාශ්‍රය : පශු වෛද්‍ය කාර්යාලය, සූරියවැව/ ග්‍රාම නිලධාරී කාර්යාලය - බැඳිගම්තොට**

මී ගව පාලනය විශාල පට්ටි වශයෙන් සිදුවන අතර වැඩි වශයෙන් දේශීය වර්ගයේ සතුන් මේ අතර සිටී. උසස් ආරයේ වැඩි කිරි ප්‍රමාණයක් ලබාදෙන මී ගවයින් සමග දෙමුහුන් කිරීමක්ද දක්නට ලැබෙන අතර ඒ තුලින් උසස් ප්‍රතිඵල ලබාගත හැකිය.

එළ ගවයන් අතරද දේශිය බටු හරක් බහුල වන අතර ඔවුන් මූලික ලෙසම මස් ලබාගැනීම සඳහා ඇති කරයි. මොවුන්ගෙන් කිරි ලබා ගැනීම ඉතාමත් පහළ මටමක පවතින අතර ඒ සම්බන්ධව එතරම් අවධානයක්ද යොමු නොකරයි. කිරි ලබා ගැනීම සඳහා උසස් ආරයේ සතුන් වන ජර්සි හා ෆරිසි දේශීය වර්ගයන්හි දෙමුහුන් සතුන් ප්‍රදේශයේ දේශගුණික රටාවන්ට අනුව ගැළපේ.

ඌරු පාලනය සඳහා පවුල් 15 පමණ යොමුවී ඇති අතර නිදැලි ක්‍රමයන් යටතේ ඌරන් ඇති කරනු ලබයි. මෙවැනි සතුන්ගේ මස් සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර එය හොඳ ආදායම් මාර්ගයකි.

එළුවන් හා කුකුළන් දේශීය වර්ගවලින් යුක්ත වන අතර වානිජ මට්ටමෙන් ඇති කිරීමක් සිදු නොවේ. ගම් කුකුළන් බොහෝ විට ඇති කරනුයේ පවුලේ ආහාර අවශ්‍යතාවයන් සපුරා ගැනීම වෙනුවෙනි.

**6.2.2 තාක්ෂණික භාවිතය**

සත්ත්ව පාලනය සම්බන්ධ තාක්ෂණික දැනුම සූරියවැව පශු වෛද්‍ය කාර්යාලය මගින් ලබා ගැනීමේ හැකියාව පවතී. මී ගව හා එළ ගව පාලනය පට්ටි වශයෙන් හෝ අඩ නිදැලි ක්‍රමයන් යටතේ වැඩි වශයෙන් පවතින බැවින් තාක්ෂණික ක්‍රමෝපායයන් කෙරෙහි යොමුවීම ඉතාමත් පහළ මට්ටමක පවතී. යම්කිසි රෝගාබාධයන් වැළඳුනහොත් පශු වෛද්‍ය කාර්යාලය වෙත යොමුවන අතර සතුන්ගේ ඵලදාව වැඩිකර ගැනීම හෝ පෝෂණ තත්ත්වයන් වර්ධනය

කරගැනීමේ හැකියාවන් කෙරෙහි අවධානය යොමු නොකරයි. මේ හේතුවෙන් මී ගව හා එළ ගවයින්ගේ කිරි නිෂ්පාදනයද ලබා ගතහැකි මට්ටමට වඩා පහළින් පිහිටයි. විශේෂයෙන්ම එළ කිරි ලබාගැනීම ඉතාමත්ම පහළ මට්ටමක පිහිටයි.

පශු වෛද්‍ය කාර්යාලය මගින් වාර්ෂික සත්ත්ව එන්නත් වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙමගින් ගව වසන්ගත රෝගවලින් ගවයින් ආරක්ෂා කිරීම සිදු වෙයි.

### 6.2.3 නිෂ්පාදනය, මිල හා අලෙවිය

මෙම කොටස තුළදී සත්ත්ව පාලනය සඳහා ශ්‍රම භාවිතය, නිෂ්පාදන වර්ග හා නිෂ්පාදන වියදම යන අංශ කෙරෙහි අවධානය යොමුවෙයි.

සත්ත්ව පාලනය සඳහා අවශ්‍ය ශ්‍රම භාවිතය සම්බන්ධයෙන් සැළකීමේදී සමීක්ෂණයෙන් හෙළිවන පරිදි එහි නිරත ගොවීන්ගෙන් සියයට 91 පමණ තම පවුලේ ශ්‍රමය පමණක් මේ සඳහා යොදා ගනී. ඉතිරි සියයට 9 කුළී ශ්‍රමය යොදා ගන්නා අතර බොහෝ විට මොවුන් විශාල පට්ටි හිමියන් වන අතර හරකුන් රැක බලා ගැනීම හා තණ කැපීම සඳහා කුළී කරුවන් යොදා ගනී. පවුලේ ශ්‍රමය යොදාගන්නා ගොවි පවුල්වල සියයට 43 ක් පමණ තනි පුද්ගලයකු මේ සඳහා යොමු වී ඇති අතර සියයට 29 ක් පමණ දෙදෙනෙකු නිරතවෙයි. තිදෙනෙකු හෝ වැඩි පිරිසක් නිරතවන පවුල් ප්‍රතිශතය සියයට 28 කි.

සත්ත්ව නිෂ්පාදන අතරින් මී කිරි මිදවීම ප්‍රමුඛ වන අතර දියර කිරි වශයෙන් අලෙවි කිරීමක්ද සිදුවෙයි. කිරි නිෂ්පාදන පිරිවැය ඉතා පහළ මට්ටමක පවතී. සතුන් සඳහා ආහාර සැපයීමට මුදල් වැය නොවන අතර රැකබලා ගන්නා පුද්ගලයින් වෙනුවෙන් පමණක් මුදල් වැය වේ. මේ හේතුවෙන් මෙම ප්‍රදේශය තුළ පට්ටි වශයෙන් ගව පාලනය ඉතා ලාභදායී වන අතර අනෙකුත් සමාජීය ප්‍රශ්න හේතුවෙන් එය අපහසු කාර්යයක් බවට පත්වී තිබේ. දියර මී කිරි ලීටරයක් සඳහා ප්‍රදේශය තුළ රු. 30-35 අතර මුදලක් ලැබෙන අතර මුදවන ලද කිරි ලීටරයක් සඳහා රු. 50-55 අතර මුදලක් ලැබිය හැක.

කිරි නිෂ්පාදකයින්ගෙන් සියයට 50 පමණ තම නිෂ්පාදන සෘජුවම පාරිභෝගිකයින්ට අලෙවි කරන අතර සියයට 30 පමණ වෙළෙඳුන්ට අලෙවි කරයි. ප්‍රදේශය වෙත සූරිය වැව හා අවට ප්‍රදේශවල සිට යතුරුපැදිවලින් කිරි එකතු කිරීම සඳහා පැමිණෙන වෙළෙඳුන් මේ අතරින් කැපී පෙනෙන අතර ඔවුන් වෙත දියර කිරි අලෙවි කරයි. ඉතිරි සියයට 20 ක පමණ වන පිරිස නිශ්චිත වශයෙන් අලෙවි කිරීමක් සිදුනොවන අතර අතිරික්තයක් පැවතියහොත් පමණක් අලෙවි කිරීමට පෙළඹේ. බැදිගම්තොට ප්‍රදේශයේ කැපී පෙනෙන සුවිශේෂත්වය වනුයේ සියයට සියයක්ම කිරි ගොවීහු තම නිෂ්පාදන තම ගම තුළ හෝ නිවස තුළම සිට අලෙවි කරති. මේ හේතුවෙන් ප්‍රවාහන වියදම් ඉතාමත් අවම මට්ටමක පවතින අතර එය කර්මාන්තයේ ලාභය ඉහළ යාමට හේතුවී තිබේ. මී කිරි අලෙවිය සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නොමැති අතර දැනට ලබන මිල ගණන් පිළිබඳවද ගොවීන් සෑහීමකට පත්වේ.

### 6.2.4 ප්‍රශ්න, ගැටළු හා විසඳුම්

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි සත්ත්ව පාලනය විවිධ ගැටළු රාශියකට මැදිවීමක් වර්තමානය තුළ දැකිය හැකිය. මේ අතරින් ඉතා ප්‍රබල ගැටළුව වනුයේ සතුන් ඇති කිරීමට ප්‍රමාණවත් තරම් ඉඩම් නොමැතිවීමයි. මෙය සුවිශේෂයෙන් කැපී පෙනෙනුයේ සාම්ප්‍රදායික නිදැලි ක්‍රමය යටතේ ප්‍රමාණයෙන් විශාල පට්ටි පාලනයට ගොවීන් යොමුවීම හේතුවෙනි. දැනට සත්ත්ව පාලනයෙහි නිරත ගොවීන්ගෙන් සියයට 60 ක් පමණ මෙම ගැටළුව පිළිබඳව අවධානය යොමුකළ අතර සත්ත්ව පාලනය සඳහා එය බාධාවක් බව පෙන්වයි. මෙහිම අනෙක් පැත්ත වනුයේ සතුන්ගේ ආහාර සඳහා අවශ්‍ය තෘණ බිම් නොමැතිවීමයි. විශේෂයෙන්ම වගාවන් සිදුවන කාලයේදී ගොවීන්ගේ වගාවන් පාළු කිරීම ගවයින්ගෙන් සිදුවන අතර එමගින් විවිධ ගැටුම්ද ඇතිවේ.

සමීක්ෂණයට ලක්කළ ගොවීන්ගෙන් සියයට 40 පමණ උසස් වර්ගයේ සතුන් නොමැතිවීම ගැටළුවක් බව පවසයි. ප්‍රදේශයට ගැළපෙන වැඩි කිරි ප්‍රමාණයක් ලබාගත හැකි උසස් ආරයේ සතුන් මුදල් ගෙවා හෝ ලබාගැනීම සඳහා තමන්ට අවස්ථාවක් නොමැති බව ගොවීන් පෙන්වා දෙයි. කෘතිම සිංචන ක්‍රම මගින් ගවයින්ගේ ආරය උසස් කිරීම සඳහා විවිධ වැඩපිළිවෙල ගත්තද එය ප්‍රමාණවත් වී නොමැත. ගොවීන්ට උසස් ආරයේ සතුන් ලබාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සැකසීම ඉතා කාලෝචිත වන බව පෙන්වාදිය හැක.

ගොවීන්ට ලැබිය යුතු පශු වෛද්‍ය සේවය සම්බන්ධ ගැටළු පවතින බවද සමීක්ෂණය තුළින් හෙළි විය. සමීක්ෂණයට ලක්කළ ගොවීන්ගෙන් සියයට 24 ක් තමන්ට නිසි පරිදි පශු වෛද්‍ය සේවාව නොලැබෙන බව පවසති. විශේෂයෙන්ම ගව රෝග හඳුනාගැනීම හා ඊට ප්‍රතිකාර ලබා ගැනීමේදී ඔවුන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බව පවසයි. පශු වෛද්‍ය කාර්යාලයේද අවශ්‍ය කාර්ය මණ්ඩලයන්හි හිඟයක් පිළිබඳ ගැටළු මතුවී තිබේ. මේ හේතුවෙන් නිසි පරිදි තම සේවාවන් ගොවීන් වෙත ලබාදීමේදී නිලධාරීන්ද විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දේ. මෙහි අනෙක් පැත්ත වනුයේ ගොවීන්ට සත්ත්ව පාලනය පිළිබඳ නිවරදි දැනුම හා නව තාක්ෂණික ක්‍රමෝපායන් නිවැරදිව ගමන් නොගැනීමයි. තමන්ට නිසි පරිදි දැනුම නොමැති බව සමීක්ෂණයට ලක්කළ ගොවීන්ගෙන් සියයට 12 ප්‍රකාශ කරයි.

මහවැලි කලාපයෙන් බැහැර ප්‍රදේශවල ගොවීන් සත්ත්ව පාලනයේදී ජල හිඟය යන බාධාකාරී සාධකයටද මුහුණ දෙයි. මේ හේතුවෙන් ගෘහස්ථ ගව පාලනය වෙත යොමුවීමේදී ගවයින්ට අවශ්‍ය ජලය සැපයීම අර්බුදකාරී තත්ත්වයක් බවට පත්වේ.

ඉඩම් හිඟය, තෘණ භූමි නොමැතිවීම හා නිදැලි ක්‍රමය මගින් ඇතිවන සාමාජීය ප්‍රශ්න අවම කරගැනීම සඳහා ගොවීන් ගෘහස්ථ ගව පාලනය සඳහා යොමු කිරීමේ අවශ්‍යතාව පවතී. මේ සඳහා ගොවීන් තුළ ආකල්පමය වෙනසක් ඇති කිරීම හා නිවැරදි පුහුණුවීම් ලබාදීමේ අවශ්‍යතාවක් පවතී. මෙවැනි ක්‍රමවේදයන් වෙත ප්‍රවේශ වුවහොත් සත්ත්ව පාලනය මගින් ලබන නිෂ්පාදනය හා ලාභය ඉහළ දමා ගැනීමේ හැකියාවක් පවතී.

හත්වන පරිච්ඡේදය

## ප්‍රජා සංවිධාන හා ජනතා සහභාගීත්වය

මෙම පරිච්ඡේදය තුළදී බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ පිහිටුවාගෙන ඇති ප්‍රජා සංවිධාන හා ඒවා තුළ ජනතාව කෙතරම් දුරට සක්‍රියව යෙදී ඇත්ද යන්න හා ඒ මගින් ගමට හා ප්‍රදේශයට වන සේවාවන් සම්බන්ධයෙන් මූලික අවධානය යොමු කරයි.

### 7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන

බැදිගම්තොට ග්‍රාමනිලධාරී වසම තුළ ඔවුන්ගේ විවිධ අවශ්‍යතා ඉටු කරගැනීමේ අරමුණින් පිහිටුවාගත් ප්‍රජා සංවිධාන 15 පමණ හඳුනාගත හැක. මෙයින් ක්‍රියාශීලී මට්ටමෙහි පවතින්නේ කිහිපයක් පමණක් වන අතර අනෙක්වා නාමිකව පවතින අතර දැනට සිටින නිලධාරී මණ්ඩලයේ ප්‍රතිචාරද සැළකිය යුතු මට්ටමක නොමැත. 7.1 සංඛ්‍යා සටහන මගින් දැනට ඇති ප්‍රජා සංවිධාන හා ඒවායෙහි සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු දැක්වේ.

**7.1 සංඛ්‍යා සටහන**

**ප්‍රජා සංවිධාන හා ජනතා සහභාගීත්වය**

| ප්‍රජා සංවිධාන | සාමාජික සංඛ්‍යාව | ගමෙහි මුළු පවුල් සංඛ්‍යාවට දක්වන ප්‍රතිශතය |
|---|---|---|
| ශක්ති සණස සමිතිය | 207 | 50.5 |
| විජය ස්වයං බැංකු සමාජය | 63 | 15.4 |
| සරුකෙත ගොවි සමාජය | 34 | 8.3 |
| යෝධ අඩි වැව ගොවි සංවිධානය | 18 | 4.4 |
| ගැමුණු ගොවි සංවිධානය | 38 | 9.3 |
| පැරකුම් ගොවි සංවිධානය | 28 | 6.8 |
| පරාක්‍රම ගොවි සංවිධානය | 32 | 7.8 |
| ගාමිණී එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය | 33 | 8.0 |
| පුබුදු කාන්තා කාර්ය සමාජය | 32 | 7.8 |
| එක්සත් අවමංගල්‍යාධාර සමිතිය | 48 | 11.7 |
| වැඩිහිටි සංවිධානය | - | - |
| පිපෙන මල් යෞවන සමිතිය | - | - |
| ගැමුණු ක්‍රීඩා සමාජය | - | - |
| දායක සභාව | - | - |
| පුබුදු දියවර සමිතිය | | |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - 2006

බැදිගම්තොට ග්‍රාමනිලධාරී වසමෙහි ප්‍රජා සංවිධාන හා ඒවායෙහි සාමාජික සංඛ්‍යාවන් 7.1 සංඛ්‍යා සටහන මගින් දැක්වෙන අතර සමහර සංවිධාන නාමිකව පැවතියද තොරතුරු ලබාගැනීමට සුදුසු ඒ බව දන්නා පුද්ගලයින්

සොයාගැනීමද අපහසු කාර්යයකි. නිලධාරී මණ්ඩලයේ ලිපිනයන් වෙත තොරතුරු පත්‍රිකා යොමු කළද ප්‍රතිචාර දැක්වීම ඉතා පහළ මට්ටමක පැවතුණි. එයින් හැඟීයන්නේ එකී සමිති නාමිකව පැවතියද ක්‍රියාකාරී බවින් තොර බවයි.

මූලික සමාජ ආර්ථික සමීක්ෂණය තුළදී සමීක්ෂණයට ලක්කළ පවුල්වල සාමාජිකයින් විවිධ සමිති හා සංවිධානවල සාමාජිකත්වය දැරීම සම්බන්ධයෙන්ද අවධානය යොමුවිය.

මේ අනුව පවුලේ සාමාජකයින් සමිති සමාගම් කොපමණ සංඛ්‍යාවක සාමාජිකත්වය දරන්නේද යන්න පිළිබඳව තොරතුරු රැස්කළ අතර එයින් පෙනීයන පරිදි සමීක්ෂණයට ලක්කළ පවුල්වලින් සියයට 94 ක් පමණ කුමන හෝ සමිතියක සාමාජිකත්වය දරයි. පවුල්වලින් සියයට 25 පමණ සාමාජිකයින් සමිති හතරක හෝ ඊට වැඩි සංඛ්‍යාවක සාමාජිකත්වය දරයි. මෙයින් පෙනී යන්නේ බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසම තුළ පදිංචි ජනතාව සමිති සමාගම් වල සාමාජිකත්වය ගැනීම තුළ ඉතා ඉදිරියෙන් සිටින බවයි. සමිති තුළ සාමාජිකත්වය නාමිකව ගත් පමණින් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය ඒ තුළින් මතුවී නොපෙනේ. සමීක්ෂණය තුළින්ද හෙළිවූ පරිදි බොහෝ සමිති නාමික මට්ටමෙන් පමණක් පැවතියද ඒවා පිහිටුවාගත් අරමුණු අනුව ක්‍රියාත්මක නොවීමක්ද දැකිය හැකිය.

### 7.2 සංඛ්‍යා සටහන

**සමිති/සංවිධානවල සාමාජිකත්වය දැරීම අනුව පවුල් ව්‍යාප්තිය**

| සාමාජිකත්වය දරණ සමිති සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 0 | 12 | 5.9 |
| 1 | 50 | 24.4 |
| 2 | 48 | 23.4 |
| 3 | 44 | 21.5 |
| 4 | 40 | 19.5 |
| 5 හෝ ඊට වැඩි | 11 | 5.3 |
| එකතුව | 205 | 100 |

**මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය - හෙ.කො.ගො.ප.පු.ආ. - 2006**

### 7.2 ප්‍රජා සංවිධානවල ක්‍රියාකාරී බව

බැදිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි දැනට පවත්නා සමිති/සමාගම් කෙතෙක් දුරට ක්‍රියාශීලීද යන්න සම්බන්ධව අධ්‍යයනය කිරීම සඳහා නිලධාරී මණ්ඩලයේ ප්‍රධානීන් සමග සම්මුඛ සාකච්ඡා මෙන්ම සමීක්ෂණය තුළදී ද සමීක්ෂණයට ලක්කළ සාමාජිකයින්ගෙන්ද වෙන වෙනම තොරතුරු රැස්කරන ලදී. සමීක්ෂණය තුළදී වඩාත්ම ක්‍රියාශීලී සමිතිය කුමක්ද යන ප්‍රශ්නය යොමුකළ අතර එයට ප්‍රතිචාර දැක්වූ පවුල් 173 අතරින් සියයට 69.4 ක් සණස සමිතිය ගම්මානයේ දැනට වඩාත්ම ක්‍රියාශීලී සමිතිය ලෙස පිළිගෙන ඇත. තවත් සියයට 9.2 ක් ගොවි සංවිධාන වඩාත් ක්‍රියාශීලී බව පවසන අතර සියයට 6.9 ක් සමෘද්ධි සමිතිය වඩාත් ක්‍රියාශීලී සමිතිය බව පවසයි. අනෙකුත් සමිති සමාගම් කිසිවක් ජනතාව අතරින් වඩාත්ම ක්‍රියාශීලී සමිතිය ලෙස සියයට 5 කවත් ප්‍රතිශතයක් නියෝජනය

කිරීමට සමත්වී නැත. මේ අනුව සමීක්ෂණයෙන් හෙළිවන පරිදි හා ගම්මානයේ පොදු මතය වන පරිදි සණස සමිතිය දැනට වඩාත්ම ක්‍රියාශීලී සමිතිය බව සනාථ වෙයි.

සණස සමිතිය වඩාත් ක්‍රියාශීලී හා ජනතාවට දැනෙන සමිතිය වීමට ප්‍රබලම හේතුව වී ඇත්තේ ඒ තුළ ඇති ණය ගනුදෙනු පහසුවීම හා විශ්වාසය තහවුරු වීම යන කරුණයි. මීට අමතරව හදිසි ආපදා ලෙස සැළකෙන මරණයකදී සේවා සැපයීම, සහ අනෙකුත් විවිධ ප්‍රජා සේවාවන් ඒ මගින් ඉටුවීමත් සාමාජිකත්වය තුළ දැඩි විනයක් පවත්වා ගැනීමත් ප්‍රබල හේතු ලෙස පවතී.

1995 වසරේදී සාමාජිකයින් 25 දෙනෙකුගෙන් ආරම්භ වූ සණස සමිතිය 2006 වසර වනවිට සාමාජිකත්වය පවුල් 207 ක් දක්වා ව්‍යාප්ති වී තිබේ. එනම් ගම්මානයෙන් හරි අඩකට වඩා වැඩි ප්‍රමාණයකි. මේ යටතේ ඇති ඉතිරිකිරීම් හා ණය ගනුදෙනු සම්බන්ධව වෙනම කොටසකදී සාකච්ඡාවට බඳුන් කරනු ලබන අතර මෙහිදී එහි ප්‍රජා සේවාවන් සම්බන්ධයෙන් මූලික අවධානය යොමුකරයි. ප්‍රජා සේවාවවන් නැතහොත් සුභසාධක සේවාවන් යටතේ විශේෂයෙන්ම සාමාජික පවුලක සිදුවන මරණයකදී ඊට අවශ්‍ය විදුලි උත්පාදක යන්ත්‍ර, ශබ්ද විකාශන යන්ත්‍ර හා තාවකාලික මඩු යනාදිය සපයන අතර සියළුම සැරසිලි කටයුතු නොමිලේ ඉටුකර දෙයි. ඊට අමතරව ගම්මානයේ පළමු වසරෙ සිට පස්වන වසර දක්වා වූ පාසල් සිසුන්ට වසරක් පාවිච්චි කළ හැකිවන පරිදි අභ්‍යාස පොත් ලබාදීම හා අසරණ සරණ අරමුදල යටතේ විවිධ සමාජ සේවාවන් ඉටුකිරීම සිදුවෙයි.

බැදිගම්තොට විජය ස්වයං බැංකු සමාජයද සණස සමිතිය තරම් සාමාජික සංඛ්‍යාවක් නොදැරුවද සාමාජිකත්වය වෙත උසස් සේවාවන් ඉටුකරන බව පෙනේ. එහි සාමාජික සංඛ්‍යාව 63 ක් වන අතර විවිධාකාර තැන්පතු ක්‍රම හඳුන්වා දී ඇත. මෙමගින් ලබා දෙනුයේ වගා ණය පමණි.

බැදිගම්තොට ගම්මානයේ ජනතාව සාමාජිකත්වය දරණ ගොවි සංවිධාන 05 ක් පමණ ඇති අතර මේවායෙහි මූලික ක්‍රියාකාරකම් ඇලවේලි පිළිසකර කිරීම. ජල මාර්ග නඩත්තුව වැනි ක්‍රියාවන් සඳහා සීමාවී ඇති නමුත් සමහර ගොවි සංවිධාන ඒ හා සම්බන්ධ සුළු කොන්ත්‍රාත් කටයුතු ද ඉටුකර තිබේ.

පුබුදු කාන්තා කාර්ය සමාජය හා වැඩිහිටි සමිතිය යන ඒවාහි සාමාජිකත්වය කුඩා වන අතරම ඔවුන්ගෙන් ඉටුවන සංවර්ධන ක්‍රියාකාරකම්ද පහළ මට්ටමක පවතී. ක්‍රීඩා සමාජය හා යෞවන සමාජය නාමිකව පිහිටුවා තිබුනද ඒවායෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය.

ප්‍රජා සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව විමසීමේදී බැදිගම්තොට ග්‍රාම සංවර්ධන සමිතිය සම්බන්ධයෙන්ද විශේෂ අවධානය යොමුකළ යුතුය. ගම්මානයෙන් ලැබෙන තොරතුරුවලට අනුව මෙම සමිතිය අතීතයේ ඉතා ක්‍රියාශීලීව කටයුතු කර ඇති අතර සංවර්ධන වැඩසටහන් බොහොමයකදී පෙරමුණ ගෙන ඇත. වර්තමානයේ මෙය ඉතාමත් අක්‍රීය මට්ටමට පත්වී ඇති අතර කිසිදු සංවර්ධන කටයුත්තකට මැදිහත්වීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇත.

## 7.3 අරමුදල් ගොඩනැගීම හා ණයදීම

අරමුදල් ගොඩනැගීම හා ණයදීම ප්‍රධාන අරමුණ ලෙස ගෙන ක්‍රියාත්මක වන ප්‍රජා සංවිධාන දෙකක් ගම තුළින් හඳුනාගත හැක. එනම් ශක්ති සණස සමිතිය හා විජය ස්වයං බැංකු සමාජයයි. මෙම ප්‍රජා සංවිධාන දෙක සම්බන්ධ මූලික අවධානය යොමු කළ අතර සමෘද්ධි සමිතිය මෙයට වඩා පුළුල් අරමුණකින් ක්‍රියාත්මක වන බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු නොවුණි.

බැදිගම්තොට ශක්ති සණස සමිතිය ගම්මානයේ ජනතාවගේ ඉතිරිකිරීම් පුරුද්ද වර්ධනය කිරීමත් ඒවා අනාගත ආයෝජන කටයුතු සඳහා යොමු කිරීමේත් අරමුණ ඇතිව ඉතිරිකිරීම් ගිණුම් වර්ග කිහිපයක් හඳුන්වා දී තිබේ. එනම් සාමාජික ඉතිරිකිරීම්, සාමාජික නොවන ඉතිරිකිරීම්, ළමා ඉතිරිකිරීම්, අනිවාර්ය තැන්පතු, ස්ථාවර තැන්පතු හා කොටස් ඉතිරිකිරීම් වශයෙනි. 7.3 සංඛ්‍යා සටහන මගින් පසුගිය වසර 06 ඇතුළත මෙකී ගිණුම්වල ප්‍රගතිය පෙන්වන අතර ඒ තුළ පැහැදිලි වර්ධනයක් දැකිය හැකිය.

### 7.3 සංඛ්‍යා සටහන

**බැදිගම්තොට සණස සමිතියේ තැන්පතු ව්‍යුහය හා ඉතිරි කළ මුදල් ප්‍රමාණයන්**

| තැන්පතු වර්ගය | පොළී අනුපාතය (වාර්ෂික %) | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 |
|---|---|---|---|---|---|---|---|
| සාමාජික ඉතිරි කිරීම් | 8 | 176658 | 153609 | 472669 | 616593 | 1331110 | 887343 |
| සාමාජික නොවන ඉතිරි කිරීම් | 8 | 3449 | 35839 | 48397 | 161800 | 558830 | 654598 |
| ළමා ඉතිරි කිරීම් | 14 | 2550 | 10850 | 13859 | 21258 | 41309 | 63525 |
| අනිවාර්ය තැන්පතු | 10 | 134629 | 159352 | 209875 | 382555 | 426796 | 321769 |
| ස්ථාවර තැන්පතු | 12 | 83200 | 126429 | 198324 | 262177 | 569829 | 624000 |
| කොටස් ඉතිරි කිරීම් | - | 69875 | 94725 | 126225 | 181375 | 229024 | 261474 |
| සිඟිති ඉතිරි කිරීම් | 14 | - | - | - | - | - | 5911 |
| එකතුව | - | 470361 | 580804 | 1069349 | 1625148 | 3165898 | 2818620 |

**මූලය : සණස සමිතිය - බැදිගම්තොට**

සාමාන්‍ය ඉතිරි කිරීම් හා ගෘහස්ථ ඉතිරි කිරීම් සඳහා අනෙකුත් බැංකු ක්ෂේත්‍රයන්හි පවතිනවාට වඩා ඉහළ වාර්ෂික පොළියක් සණස සමිතිය මගින් ගෙවනු ලබයි. සාමාජික තැන්පතුවලට අමතරව සාමාජික නොවන තැන්පතුවලද ක්‍රමික වර්ධනයක් පෙන්වීම ඉතා යහපත් ලක්ෂණයකි. 7.4 සංඛ්‍යා සටහන මගින් සණස සමිතිය වාර්ෂිකව නිකුත්කළ ණය මුදල්වල හා පොළී ආදායම්වල සමුච්චිත අගය පෙන්වනු ලබයි. එයින් පැහැදිලි වන පරිදි මේ දක්වා සණස සමිතිය ගම්මානයේ ජනතාවගේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් මිලියන අටකට ආසන්න ණය මුදල් ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර ඒ තුළින් රුපියල් ලක්ෂ නවයකට ආසන්න පොළී ආදායමක් ලබාගෙන ඇත.

7.4 සංඛ්‍යා සටහන

**බැදිගම්තොට සණස සමිතිය ණය නිකුතුව හා පොළී ආදායම්**

| විස්තරය | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 |
|---|---|---|---|---|---|---|
| ණය | 943500 | 1230000 | 2013000 | 2934800 | 6100525 | 7639200 |
| පොළී ආදායම් | 79437 | 114523 | 168954 | 244979 | 559221 | 887977 |

මූලය : සණස සමිතිය - බැදිගම්තොට

ලබාදෙනු ලබන ණය විවිධාංගීකරණයකට ලක්කර ඇති අතර එය වගා ණය, නිවාස ණය, ව්‍යාපාරික ණය, කෘෂි උපකරණ මිලදී ගැනීම සඳහා වන ණය, හදිසි ආපදා ණය හා වෙනත් වශයෙන් වර්ග වේ. මේ සඳහා වාර්ෂිකව සියයට 16 ක පොලියක් අය කරනු ලබන අතර වගා ණය යටතේම වර්ග කර ඇති කුඹුරු ණය හැර අනෙකුත් ණය වාරික වශයෙන් ගෙවිය හැක. කුඹුරු ණය කන්නය අවසානයේ එක්වර ගෙවිය යුතුය.

සණස සමිතිය නිකුත් කරනු ලබන ණය වලින් සියයට 80 පමණ වගා ණය යටතට වැටේ. කෘෂිකාර්මික පරිසරයක් තුළ ක්‍රියාත්මක වන මෙවැනි සමිතියක් තුළින් එවැන්නක් බලාපොරොත්තු විය යුතු අතර එමගින් අවිධිමත් මූල්‍ය අංශයන්හි ග්‍රහණයට ගොවීන් හසුවීම වලක්වා ගත හැක. එමෙන්ම කෘෂි උපකරණ හා රසායනික ද්‍රව්‍ය අලෙවි සැළක්ද සණස මගින්ම ක්‍රියාත්මක කිරීමද ගොවීන් උදෙසා ගනු ලැබූ සහනදායී පියවරකි. 2005 වසරේ නිකුත් කර ඇති මුළු ණය සංඛ්‍යාවෙන් සියයට 12 ක් නිවාස ණය වන අතර ව්‍යාපාරික ණය ප්‍රමාණය සියයට 4 කි. ඉතිරි සියයට 4 හදිසි ආපදා හා වෙනත් ණය වර්ග අතර බෙදීයයි.

7.5 සංඛ්‍යා සටහන

**විවිධ අරමුණු යටතේ නිකුත් කරන ලද ණය සංඛ්‍යාවන් (සණස - බැදිගම්තොට)**

| ණය වර්ගය | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 |
|---|---|---|---|---|---|---|
| වගා ණය | 80 | 88 | 111 | 144 | 221 | 190 |
| නිවාස ණය | 16 | 19 | 32 | 50 | 66 | 28 |
| ව්‍යාපාරික ණය | 17 | 05 | 08 | 04 | 08 | 08 |
| කෘෂි උපකරණ ණය | 02 | 05 | 06 | 08 | - | - |
| හදිසි ආපදා | 03 | 04 | 04 | 10 | 11 | 01 |
| වෙනත් | 03 | 03 | 15 | 20 | 20 | 09 |
| එකතුව | 121 | 124 | 176 | 236 | 326 | 236 |

මූලය : සණස සමිතිය - බැදිගම්තොට

කුඹුරු ණය යටතේ උපරිම වශයෙන් රු. 20,000 ක මුදලක් ලබා දෙන අතර එය මාස පහක් ඇවෑමෙන් එක්වර ගෙවිය යුතුය. නිවාස ණය සඳහා රු. 25,000 ක් හා වගා ණය යටතේ කෙසෙල් වගාවට රු. 15,000 ක උපරිමයක් දක්වා ණය මුදල් නිකුත් කරනු ලබන අතර ඒවා වසර ඇතුළත වාරික වශයෙන් ගෙවිය යුතුය. ණය ආපසු ගෙවීමේ අනුපාතය ඉතා ඉහළ මට්ටමෙහි පවතින අතර එය සියයට ආසන්න අගයක් ගනී. අළුතින් එක්වන

සාමාජිකයකුට මාස තුනකින් සාමාජිකත්වය තහවුරු වන අතර ඉන් අනතුරුව රු. 2000, 5000, 10000, 15000, 20000 හා 25000 ආදී වශයෙන් ඉහළ ණය මුදල් වෙත යොමුවිය හැක. ඉහළ ණය මුදල් වෙත ඉල්ලුම් කිරීමේදී අදාල ණය මුදලෙන් සියයට 10 ක ප්‍රමාණයක් සාමාජිකයාගේ ස්ථාවර තැන්පතු තුළ තිබිය යුතුය.

බැදිගම්තොට ශක්ති සණස සමිතියෙහි නීතිරීතිවලට අනුව තුන්මසක් නොකඩවා මාසික රැස්වීම්වලට නොපැමිණියහොත් සාමාජිකත්වය අහෝසි වෙයි. ආරම්භයේ සිටම දැඩි විනයක් සහිතව අඛණ්ඩව රැස්වීම් පැවැත්වීමටද නිලධාරී මණ්ඩලය ක්‍රියාකොට ඇත.

බැදිගම්තොට විජය ස්වයං බැංකු සමාජය ද ගම්මානය තුළ සාමාජිකත්වය දරන්නන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කිරීම හා ඔවුන්ගේ වගා අවශ්‍යතාවයන් වෙනුවෙන් ණය නිකුත් කිරීමේ කටයුතුවල නිරත වෙයි. 1997 වර්ෂයේ ආරම්භ කළ මෙම බැංකු සමාජය වර්තමානය වන විට සාමාජිකයින් 63 දෙනෙකුගෙන් සමන්විත වෙයි. කුඩා කණ්ඩායම් ක්‍රමය මත පදනම්ව ඉතිරිකිරීම් හා ණය ගනුදෙනු සිදුවන අතර කණ්ඩායම් විශ්වාසය හා සාමූහිකත්වය තුළ ගනුදෙනු සිදුවෙයි.

සාමාජිකයින්ගේ ඉතිරි කිරීම් වර්ධනය කිරීමෙහිලා විවිධ තැන්පතු වර්ග කිහිපයක් හඳුන්වා දී ඇති අතර එකිනෙකට අදාල පොළී අනුපාත හා ඒ ඒ වර්ෂ අවසානයෙහි පැවති සමස්ත ශේෂයන් පිළිබඳවද විස්තර 7.6 සංඛ්‍යා සටහනින් දැක්වේ.

**7.6 සංඛ්‍යා සටහන**

**බැදිගම්තොට විජය ස්වයං බැංකු සමාජයේ විවිධ ඉතිරි කිරීම්**

| ගිණුම් වර්ගය | වාර්ෂික පොළී අනුපාතය | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 |
|---|---|---|---|---|---|---|---|
| අනිවාර්ය තැන්පතු | 10 | 13337 | 13387 | 17798 | 17798 | 26141 | 39519 |
| කොටස් මුදල් | ලාභාංශ | 4700 | 4700 | 5600 | 5600 | 6050 | 8800 |
| සාමාන්‍ය තැන්පතු | 10 | - | - | - | 19504 | 45969 | 69742 |
| මිය උදාන | 12 | - | - | - | - | 12330 | 12556 |
| ළමා තැන්පත් | 10 | - | - | - | - | 100 | 619 |
| | | 18030 | 118087 | 23398 | 25902 | 90590 | 131236 |

මූලය : විජය ස්වයං බැංකු සමාජය - බැදිගම්තොට

7.6 සංඛ්‍යා සටහනින් පෙන්වන පරිදි බැදිගම්තොට විජය ස්වයං බැංකු සමාජය 2005 වසර අවසානය වනවිට විවිධ ඉතිරිකිරීම් ක්‍රම හරහා රු. 1,31,236 ක ගම්මානයේ ජනතාවගේ මුදල් එක්රැස් කිරීමට සමත්වී ඇත. මෙය නැවත වතාවක් වගා ණය වශයෙන් ජනතාවගේ අවශ්‍යතාවයන් වෙත මුදා හැරීමක් ද දක්නට ලැබේ. 2005 වසරේ අවසානය වනවිට නිකුත් කර ඇති මුළු වගා ණය ප්‍රමාණය රු. 300299 වන අතර ආපසු අයවීමේ ප්‍රතිශතය සියයට 60  හි මට්ටමෙහි පවතී. ණය සඳහා වන පොළී අනුපාතය වසරකට සියයට 24 කි. ණය ලබාගැනීමේදී රු.

2000 සිට 20,000 උපරිමයක් දක්වා ගමන්ගත හැක. ණය ලබාදිමේදී ණය මුදලින් සියයට 1 ක අනිවාර්ය තැන්පතුවක්ද තබාගනී.

බැඳිගම්තොට ගම්මානය තුළ 2004 වසරේදී පිහිටුවාගෙන ඇති පුබුදු කාන්තා කාර්ය සමාජය ද අරමුදල් ගොඩනැංවීම හා ණය දීම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක විමත් දක්නට ලැබෙන අතර එහි ගනුදෙනු කටයුතු සංඛ්‍යාත්මකව ඉතා පහළ මටමක පවතී. ගොවි සංවිධාන මාසිකව ගාස්තු එකතු කිරීමක් සිදු වුවද ඒමගින් ණය දීම් වැනි කටයුතු ඉටු නොවේ.

### 7.4 ප්‍රජා සංවිධාන මගින් ඉටුවන වෙනත් සේවාවන්

බැඳිගම්තොට ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටුවාගෙන ඇති ප්‍රජා සංවිධාන මගින් ඉටුවන වෙනත් සේවා ලෙස ඒවායෙහි බඩු බාහිරාදිය හා කෘෂි උපකරණ කුළියට දීම් හා වෙනත් සහනදායී වැඩ පිළිවෙළ පිළිබඳව අවධානය යොමු විය. සණස සමිතිය සතුව උත්සව අවස්ථාවකදී පරිහරණය කළහැකි වන පරිදි විදුලි උත්පාදක යන්ත්‍ර තාවකාලික මඩු හා ශබ්ද විකාශන යන්ත්‍ර ඇති අතර ඒවා සාමාජිකයින් හා සාමාජික නොවන පිරිස් අතර කුළී පදනම මත ලබාදෙයි. තාවකාලික මඩුව සාමාජිකයින්ට රු. 350 ක මුදලට ලබාදෙන අතර අනෙකුත් අයට රු. 400 ක මුදලකටත් විදුලි උත්පාදක යන්ත්‍රය සාමාජිකයින්ට රු. 600 කට හා සාමාජික නොවන අයට රු. 800 බැගින් කුළියට ලබාදෙයි. මෙයට අමතරව සණස අලෙවි සැළ මගින් කෘෂි රසායන හා පොහොර වර්ග සහනදායී මිල ගණන් යටතේ ලබාදීමක්ද සිදුවේ.

එක්සත් අවමංගල්‍යාධාර සමිතිය සතුව උත්සව අවස්ථාවන්හිදී පරිහරණය සඳහා තාවකාලික මඩු හා පුටු යනාදිය ඇති අතර සාමාජිකයින් අතර නොමිලේ ලබාදෙන අතර, සාමාජික නොවන අයගෙන් තාවකාලික මඩුව සඳහා රු. 300 හා පුටු සඳහා රු.5 බැගින් අය කරයි.

විජය ස්වයං බැංකු සමාජය ද 2000 වසරේදී ජල පොම්පාගාරයක් ඉදිකොට ගොවීන්ට ජලය බෙදාගෙන කෘෂිකාර්මික කටයුතු කිරීමට අවස්ථාව උදාකරදීම විශේෂ සේවාවක් වශයෙන් සඳහන් කළ යුතුය. අනෙකුත් සමිති සමාගම්වලින් මෙවැනි සුවිශේෂී ක්‍රියාවන් කිසිවක් ඉටුකර ඇති බවට වාර්තා නොවුණි.

### 7.5 ගමෙහි සංවර්ධන කටයුතු සඳහා ප්‍රජා සංවිධාන ජනතා සහභාගිත්වය ලබා ගැනීම

ප්‍රජා සංවිධානවල ජනතා සහභාගීත්වය කෙතරම් දුරට නියෝජනය වන්නේද යන්න සම්බන්ධයෙන් විමසීමේදී ඒවායෙහි මහා සභා රැස්වීම්, කාරක සභා රැස්වීම් නිසි පරිදි පැවැත්වේද යන්න හා ඒවායෙහි විනිවිදභාවය පිළිබඳව අවධානය යොමු විය. ඒ සමගම ගමෙහි සංවර්ධන කටයුතු සඳහා සාමාජික අදහස් කෙසේ යොදා ගන්නේද යන්නද විමසුමට ලක්විය.

බැඳිගම්තොට සණස සමිතිය, විජය ස්වයං බැංකු සමාජය වැනි ප්‍රජා සංවිධාන අඛණ්ඩව මාසික රැස්වීම් පැවැත්වුවද අනෙක් සංවිධානවල ක්‍රියාකාරී බව සම්බන්ධ ගැටළු මතුවේ. බොහෝ ගොවි සංවිධාන සාමාජිකයින් රැස්වීම්වලට


කැඳවා ගැනීමද ඉතාමත් දුෂ්කර කාර්යයක් බවට පත්වී තිබේ. බොහෝ දුරට ගොවි සංවිධානවල රැස්වීම් පැවැත්වෙනුයේ කන්නයට දෙක බැගිනි. එනම් වාර්ෂිකව සභාවාර හතරකි. මෙවැනි රැස්වීම්වල සාමාජික නියෝජනය සියයට 25-30 අතර මට්ටමෙහි පැවතීම ගොවි සංවිධාන සියල්ලටම පොදු වූ ලක්ෂණයකි. ගොවි සංවිධාන නිලධාරීන්ගේ මතයට අනුව ඒවා සතුව බලයක් නොමැතිවීම මෙවැනි අකාර්යක්ෂම වීම් කෙරෙහි බලපානු ඇත. සණස හා විජය ස්වයං බැංකු සමාජය වැනි සංවිධාන අඛණ්ඩව සමිතිවාර පැවැත්වූ අතර සාමාජික අදහස් සඳහා ඒ තුළ ඇති ඉඩකඩ පුළුල් වේ. බොහෝ යෝජනා කාරක සභාවෙන් තීරණය කර මහා සභා අනුමැතියට යොමු කරනු ලබන අතර එහිදී සාමාජිකයින්ට අදහස් දැක්වීමට අවස්ථාව උදාවේ. ග්‍රාම සංවර්ධන සමිතිය, ක්‍රීඩා සමිතිය හා යෞවන සමාජය කෙතෙක් දුරට ජනතා අදහස්මත ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳ නිවැරදි විනිශ්චයකට පැමිණිය නොහැක. එනම් මේවා දැනට අක්‍රිය මට්ටමේ පවතින බැවිනි.

## 7.6 වෙනත් ආයතන ගමෙහි සංවර්ධනයට ජනතා අදහස් ලබාගැනීම

මේ යටතේ ඡන්දයෙන් පත්කරන ලද නියෝජිතයින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ජනතාව සමග හෝ ප්‍රජා සංවිධාන සමග නිතර සාකච්ජා කොට අදහස් ලබාගන්නේද යන්න පිළිබඳව අවධාණය යොමු විය. ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට පෙර ප්‍රාදේශීය සභාව, පළාත් සභාව හෝ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු එවැනි සාකච්ජා හෝ අදහස් ලබාගැනීම් කෙරෙහි අවධානය යොමුකර නොමැත. ගම නැගුම වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමග මොවුන්ගේ විශේෂ අවධානය යොමුවී ඇති බවද සඳහන් කළ යුතුය.

සිතියම 1.3

සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා
බැදිගම්තොට ගම්මානය දැක්වෙන සිතියම




Walasmulla